PR 7096

පර්යේෂණ වාර්තා



# එළවළු අපනයනය ආශ්‍රිත සැපයුම් දාම විශ්ලේෂණය

එස්. ඇපාසිංහ
රේණුකා වීරක්කොඩි
ශාමිනී කුසුම් කුමාර

HARTI
හෙක්ටර් කොබ්බැකඩුව
ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය

National Science Foundation
16 AUG 2016
NSLRC

# එළවළු අපනයනය ආශ්‍රිත සැපයුම් දාම විශ්ලේෂණය

එස්. ඇපාසිංහ

රේණුකා වීරක්කොඩි

ශ්‍යාමිනී කුසුම් කුමාර

සිංහල පර්යේෂණ වාර්තා: 62

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

114, විජේරාම මාවත,

කොළඹ 07

ප්‍රථම මුද්‍රණය : 2015

© හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සියලුම හිමිකම් ඇවිරිණ

ISBN 978-955-612-196-4

පරිගණක පිටු සැකසුම : ඒ.පී. උදේනි කරුණාරත්න

පරිගණකගත කිරීම : විජිතා පද්මිනී

# පෙරවදන

දේශීය එළවළු නිෂ්පාදන කර්මාන්තයට ද අනෙකුත් බෝග වගාවන්වලට මෙන්ම කාලීන මිල උච්චාවචනයන්ට යටත් වීමට සිදුවීම පොදු ලක්ෂණයකි. එසේ නමුත් රට තුළ පවතින කෘෂි දේශගුණික විවිධත්වය එම අභියෝගය ජය ගැනීම සඳහා පවතින එක් විකල්පයක් වේ. එම විවිධත්වයෙන් ප්‍රයෝජන ගනිමින් එළවළු වර්ග බොහොමයක් වසර පුරා නිෂ්පාදනය කිරීමට දේශීය ගොවි ප්‍රජාව සමත් වී ඇති නමුත් අතිරික්ත නිෂ්පාදනය හේතුවෙන් කෘෂිකාර්මික ආදායම පහත වැටීම එළවළු නිෂ්පාදකයා අත් විඳින එක් අහිතකර ප්‍රතිඵලයකි. එබැවින් එම අතිරික්ත නිෂ්පාදන අපනයන වෙළඳපොළ වෙත යොමු කිරීම එළවළු නිෂ්පාදකයන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා සුදුසු විකල්පයකි.

එනමුත් දේශීය එළවළු අපනයන කර්මාන්තය කැපී පෙනෙන වර්ධනයක් අත්පත් කර ගැනීමට සමත්වී නොමැති බව හෙ.කො.ගො.ප.පු ආයතනයේ අධ්‍යයනයකින් හෙළිදරව් වී ඇත. එළවළු අපනයන අගය දාමයේ විවිධ අදියරවල දක්නට ලැබෙන අඩු ලුහුඬුකම් මේ තත්ත්වයට හේතු වී ඇත. අපනයනය සඳහා සපයා ගනු ලබන එළවළුවල අඩු ගුණාත්මය, ඒවා අවශ්‍ය ප්‍රමාණවලින් සපයා ගත නොහැකිවීම හා අවශ්‍ය අවස්ථාවන්හි දී සපයා ගත නොහැකිවීම අපනයනකරුවන් මුහුණපාන ත්‍රිවිධාකාර මූලික ගැටලු වේ. ඒවා එළවළු අපනයන අගය දාමයේ ප්‍රාරම්භක පියවර හා බෙහෙවින් බැඳී පවතින බවත් එම ගැටලු මඟ හරවා ගැනීම සඳහා එකී ප්‍රාරම්භක පියවරයන්හි ප්‍රධාන ක්‍රියාකාරීන් වන එළවළු නිෂ්පාදකයන්ට මෙන්ම සැපයුම්කරුවන්ට යම් දායකත්වයක් ලබාදිය හැකි බවත් පැහැදිලිය. එබැවින් එළවළු අපනයන අගයදාමය ඉහත සඳහන් දුර්වලතාවන්ගෙන් යුක්තවීමට හේතු විමර්ශනය කිරීමටත් ඒවා මඟ හරවා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හඳුනා ගැනීම සඳහාත් නුවරඑළිය, බදුල්ල හා මාතලේ දිස්ත්‍රික්ක පාදකව සිදු කරන ලද මෙම අධ්‍යයනය මඟින් උත්සාහ දරා ඇත.

මෙම කරුණු සම්බන්ධව උනන්දුවක් දක්වන ප්‍රතිපත්ති සම්පාදකයන්ට මෙන්ම අනෙකුත් අදාළ පර්යේෂකයන්ට ද මෙම පර්යේෂණ වාර්තාව වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

**හපුතන්ත්‍රීගේ ධර්මසේන**
**අධ්‍යක්ෂ**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

# ස්තුතිය

"එළවළු අපනයනය ආශ්‍රිත සැපයුම් දාම විශ්ලේෂණය" පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය නිම කිරීමේ ලා ඒ සඳහා අවැසි ආයතන ප්‍රතිපාදනයන් සපයා දෙමින් ඊට මහ පෙන්වූ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ඊ.එම්. අභයරත්න මහතාට ද, අධ්‍යයනයේ වැදගත්කම හඳුනා ගෙන පර්යේෂණ වාර්තාවක් ලෙස පිළිගැන්වීමට අවශ්‍ය උපදෙස් ලබා දුන් ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ හපුතන්ත්‍රීගේ ධර්මසේන මහතාට ද අධ්‍යයනය ආරම්භයේ සිට නිසි මග පෙන්වීම ලබා දෙමින් අප මෙහෙය වූ අතිරේක අධ්‍යක්ෂ ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතාට ද අපි අපගේ විශේෂ ස්තුතිය පිරි නමමු.

අධ්‍යයනයේ අවසාන කෙටුම්පත උසස් තත්ත්වයකට ගෙන ඒම සඳහා වඩාත් එලදායී අදහස් හා යෝජනා ලබා දුන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික හා සංඛ්‍යාන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අනුරුද්ධ ඩී.එච්.කේ. කංකානම්ගේ මහතා සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය එස්.කේ.ඩී. ෆ්‍රැන්ක් නිරංජන් මහතාව ද ස්තුති පූර්වකව සිහිපත් කරමු.

ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ දී සහාය ලබා දුන් බදුල්ල, නුවරඑළිය හා මාතලේ යන දිස්ත්‍රික්කවල, දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ නිලධාරීන්, කෘෂි ව්‍යාප්ත නිලධාරීන් සහ කෘෂි නිෂ්පාදන හා පර්යේෂණ සහකාර නිලධාරීන්ට ද විශේෂ ස්තුතිය පිරි නමමු. තවද දත්ත රැස් කිරීමේ දී සහාය ලබා දුන් සංඛ්‍යාන සහකාර නිලධාරීන් වන ඩී.එම්.ඒ.සී. දිසානායක මහතා හා එච්.ඒ.ඒ.යූ. හෙට්ටිආරච්චි මිය යන නිලධාරීන්ට ද, දත්ත සැකසුම් ඒකකයේ එස්.එස්.ජේ. රෝසා සහ අනියම් විමර්ශන නිලධාරීන් ලෙස සේවය කළ ආර්. ඩී.පී.එම්. ප්‍රසංග, අජිත් කුමාර විජේකෝන්, එච්.ඒ.එම්. සුභාෂිණී, ඩබ්.ඒ.එච්. මංචනායක හා ඩබ්.එස්.එම්.පී. ප්‍රියමාලි යන නිලධාරීන්ට ද අපගේ ස්තුතිය පිරි නමමු.

තවද, නුවරඑළිය සහ මාතලේ දිස්ත්‍රික්කවල දත්ත ලබා ගැනීමේ දී තම කාලය හා ශ්‍රමය කැප කරමින් විශේෂ සහයක් ලබා දුන් නුවරඑළිය සංඛ්‍යාන සහකාර නිලධාරී එච්.එම්.එස්. ජයරත්න මහතාට ද දඹුල්ල සංඛ්‍යාන සහකාර නිලධාරී ආර්.ඩබ්.ජේ.සී.කේ.බී. ලයනල් මහතාට ද දඹුල්ල ප්‍රදේශයේ අපනයන සැපයුම්කරුවෙකු වන ජී.වී.ආර්.එන්. බණ්ඩාර මහතාව ද ස්තුතිය පිරි නැමීමට මෙය අවස්ථාවක් කර ගනිමු. දඹුල්ල හා නුවරඑළිය ආර්ථික මධ්‍යස්ථානයන්හි වෙළඳ සංගම් නියෝජිතයන්ද ස්තුති පූර්වකව සිහිපත් කරමු.

ද්විතියික දත්ත ලබා ගැනීමේ දී සහාය ලබා දුන් පුස්තකාලයාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයටත්, දත්ත විශ්ලේෂණය කටයුතු සිදු කළ දත්ත සැකසුම් ඒකකයේ ඒකක ප්‍රධාන එම්.ඩී.එල්. සෙනරත් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, වාර්තා පිටපත පරිගණක ගත කළ ජී.එම්. විජිතා පද්මිණී සහ පරිගණක පිටු සැකසුම්කරන කටයුතු කළ උදේනි කරුණාරත්න යන මහත්මීන්ටද අපි අපගේ ස්තුතිය පිරි නමමු.

තව ද, සෝදුපත් බැලීමෙන් සහාය වූ ප්‍රවෘත්ති හා ප්‍රකාශන ඒකකයේ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී වසන්ති චතුරංගනී රාජපක්ෂ මහත්මියටත්, මුද්‍රණ අංශයේ ඩී.ජී. ධර්මපාල මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ප්‍රවාහන අංශයේ සියලු කාර්ය මණ්ඩලයටත්, නන් අයුරින් සහාය වූ සියලු දෙනාටත් කෘතඥ පූර්වකව ස්තුතිය පිරි නමමු.

එස්. ඇපාසිංහ<br>
රේණුකා වීරක්කොඩි<br>
ශ්‍යාමිනී කුසුම් කුමාර

# සංක්ෂිප්තය

පසුගිය වසර පහ තුළ නැවුම් හෝ ශීත කළ එළවළු වශයෙන් වසරක දී අපනයනය කළ මෙ.ටො. 17332කට ආසන්න එළවළු ප්‍රමාණය එකී කාලසීමාව තුළ රට තුළ නිපදවූ එළවළු ප්‍රමාණයෙන් 2%ක් පමණ වේ. නමුත් දේශීය එළවළු නිෂ්පාදන අංශය වර්තමානයේ දී මුහුණ දී ඇති බොහෝ අභියෝග ජය ගැනීම සඳහා පවතින එක් විකල්පයක් වශයෙන් අපනයනය සඳහා එළවළු වගා කිරීම ප්‍රවර්ධනය කිරීමේ වටිනාකම අවතක්සේරු කළ නොහැක.

නුවරඑළිය, බදුල්ල හා මාතලේ දිස්ත්‍රික්ක ඇසුරෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. දේශගුණික විචලතා, නව හා වැඩි දියුණු කළ තාක්ෂණික ක්‍රම පිළිබඳ අනවබෝධය, බීජ හිඟය හා බීජවල අඩු ගුණාත්මය, අධික යෙදවුම් මිල, උපදේශක සේවා ප්‍රමාණවත් නොවීම, එළවළු බෝගවල විභව අස්වනු නෙළා ගැනීමට ඍජු හෝ වක්‍ර ලෙස බාධා පමුණුවන සාධකයන් වේ. කාලගුණික විචලතාවලට අනුගත වෙමින් සැලසුම් රහිත නිෂ්පාදන රටාවක් අනුගමනය කිරීමේ ප්‍රතිඵලය වන්නේ එළවළු සැපයුමේ කාලීන විචලතාවන්ය. එහි එක් අවසාන අහිතකර ප්‍රතිඵලය වන්නේ එළවළු මිල උච්චාවචනයවීම තුළින් එළවළු නිෂ්පාදකයාගේ ආදායම අවිනිශ්චිත වීමය. එය එළවළු ගොවීන්ගේ ජීවන මට්ටම නඟා සිටුවීම සඳහා පවතින බරපතල අභියෝගයක් වී ඇත. එනමුත් ගොවීන් සාම්ප්‍රදායික ලෙස එළවළු ගොවිතැනේ නියැළෙන්නේ එය ඔවුන්ගේ ජීවනෝපාය වන බැවිනි.

මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූ පරිදි ආරක්ෂිත ගෘහ තුළ මෙන්ම විවෘත වගා භූමිවල වගා කරන එළවළු ද අපනයනය සඳහා භාවිතා කරයි. මාලදිවයින වැනි සංචාරක කර්මාන්තය දියුණු මට්ටමින් ක්‍රියාත්මක වන රටවල් වෙතින් හරිතාගාර එළවළු සඳහාත්, මැදපෙරදිග ජීවත් වන ශ්‍රී ලාංකිකයන් ඇතුළු ආසියාතිකයන් වෙතින් විවෘත භූමිවල වගා කරන උඩරට හා පහතරට එළවළු සඳහාත් වශයෙන් එළවළු ඉල්ලුම නිර්මාණය වී ඇත.

බදුල්ල දිස්ත්‍රික්කයෙන් හමුවන බහුතරයක් ගොවීහු අපනයනය ඉලක්ක කරගත් නිෂ්පාදන රටාවක් අනුගමනය කරනු ලබන අතර ඔවුන්ගේ නිෂ්පාදනයේ වැඩි කොටස අපනයනය සඳහා සපයති. නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ හරිතාගාර එළවළු මෙන්ම විවෘත ක්ෂේත්‍රවල වගා කරන එළවළු අපනයනය සඳහා සපයයි. මාතලේ දිස්ත්‍රික්කයේ ගොවීහු විවෘත භූමිවල වගා කරන පහත රට එළවළු වර්ග බහුල වශයෙන් අපනයනය සඳහා සපයති. මෙම ගොවීන් සිය නිෂ්පාදනවලින් අපනයනය සඳහා සපයනු ලබන්නේ 22%ක් පමණ ප්‍රමාණයකි. එම ගොවීන් එළවළු ගොවිතැනේ නිරතවීමේ මුඛ්‍ය පරමාර්ථය දේශීය වෙළඳපළ වෙත එළවළු සැපයීමයි. සමස්ත නියැදිය තුළ බහුතර ගොවීන් ආරක්ෂිත ගෘහ නොමැති (63%), දේශීය වෙළඳපළ ඉලක්ක කර ගනිමින් එළවළු වගා කරන (77%) ගොවීන්ය. අධ්‍යයනයෙන් තහවුරු වන පරිදි සැපයුම්කරුවන්ගේ ව්‍යාපාරවල ප්‍රගතිය/පසුබෑම ඔවුන් ක්‍රියාත්මක වන ප්‍රදේශය, පළපුරුද්ද, අධ්‍යාපන මට්ටම, වයස හෝ ආයෝජනවල විශාලත්වය යනාදී සමාජ-ආර්ථික සාධක මත වෙසෙසියාත්මක සබඳතා පෙන්නුම් නොකරයි. එබැවින් සැපයුම්කරුවන්ගේ ව්‍යාරවල ප්‍රගතිය හෝ පසුබෑම ඔවුන්ගේ පාලනයෙන් බැහැර වූ සාධක මත තීරණය වී ඇති බව අධ්‍යයනයෙන් තහවුරු වේ.

පොදුවේ ගත් කල එළවළු සැපයුම්කරුවෝ දුෂ්කරතා ගණනාවක් මධ්‍යයේ සිය ව්‍යාපාර පවත්වා ගෙන යති. ඇණවුම් නිසි කලට එළවළු සපයා ගත නොහැකිවීම, ඇණවුම සම්පූර්ණ කිරීමේ

කාලසීමාව අඩුවීම, සිය ගොවි ජාලයන් සතුව අවශ්‍ය එළවළු නොතිබීමෙන් නිත්‍ය නොවන නිෂ්පාදකයන්ගෙන් වැඩි මිලට හා වැඩි ප්‍රවාහන වියදමක් දරා එළවළු ලබා ගැනීමට සිදුවීම එම ගැටලු අතර වේ. අපනයන වෙළඳපළ තුළ ඉල්ලුම සීමාවීම, ගුවන් ගමන් අවලංගු වීම හා අපනයනකරු වෙනස් මාර්ග ඔස්සේ අඩු මිලට එළවළු සපයා ගැනීම යන අවස්ථාවල දී සැපයුම්කරුට ලැබෙන ඇණවුම් සීමා වේ. සමහරවිට මුළුමණින්ම අවලංගු වේ. ගොවීන් සැපයුම්කරුවන් හා අපනයනකරුවන් අතර පවතින දියාරු සබඳතා හේතුවෙන් එළවළු අපනයන කර්මාන්තය සංවිධිත කර්මාන්තයක් ලෙස හැඳින්විය නොහැක. තවද, ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාපාරිකයන්ගේ මැදිහත්වීම අපනයනකරුවන්ට එළවළු සපයා ගැනීම ආශ්‍රිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා අවම කර ගැනීමට උපකාරි වී ඇත. එළවළු තේරීම, ගොවි සබඳතා පලුදුවීම සැපයුම්කරු මුහුණපාන දෙවන ගැටලුව වේ. පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය, ගබඩා හා ශීතාගාර සහිත ප්‍රවාහන පහසුකම් නොමැතිවීම/ප්‍රමාණවත් නොවීම, ණය ලබා ගැනීමේ ගැටලු ද එම දුෂ්කරතා අතර වේ.

අධ්‍යයන සොයා ගැනීම්වලට අනුව එළවළු අපනයන ක්ෂේත්‍රය තුළ උද්ගතවී ඇති ගුණාත්මක, ප්‍රමාණාත්මක හා කාලීන සැපයුම ආශ්‍රිත ගැටලුවල මූලාරම්භය අපනයන එළවළු සඳහා පවතින ඇණවුම් පිළිබඳ අවිනිශ්චිතතාව වේ. අපනයන වෙළඳපොළ වඩා පුළුල් වීම/කිරීම සඳහා එළවළු අපනයනය ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වේ. එබැවින් අපනයන කර්මාන්තය විධිමත් කිරීම සඳහා රාජ්‍ය මැදිහත්වීමකින් අපනයන වෙළඳපොළ පුළුල් කිරීම සඳහා ක්‍රමවත් ක්‍රමවේදයක් සකස් කර වර්තමානයේ අප රටට ලැබෙන ඇණවුම් ප්‍රමාණ ඉහළ නැංවීම සඳහා කටයුතු කළ යුතුය.

ආරක්ෂිත ගෘහ තුළ එළවළු නිෂ්පාදනකරුවන් වර්තමානයේ මුහුණ දෙන විවිධ ගැටලු විසඳීමටත් ඔවුන්ගේ නිෂ්පාදන අපනයනය ඉලක්ක කර ගත් කර්මාන්ත බවට පරිවර්තනය කිරීමටත් පියවර ගත යුතුය. ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව ප්‍රචලිත කිරීම සඳහා ආරක්ෂිත ගෘහ ගොඩනැගීමට අවශ්‍ය සහනාධාර ලබාදීමට අමතරව පළිබෝධ නාශක භාවිතය අවම කිරීම, දියුණු තාක්ෂණය භාවිතය හා සුවිශේෂී අපනයන වෙළෙඳපොළ පහසුකම් සපයා ගැනීම සම්බන්ධයෙන් ගොවීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

ගුණාත්මක, ප්‍රමාණාත්මක හා කාලීන සැපයුම සහතික කරමින් වෙළඳපොළ ඉලක්ක ගත අඛණ්ඩ නිෂ්පාදන-සැපයුම්-අපනයන අගයදාමයන් ඔස්සේ ක්‍රියාත්මක වීම සඳහා එළවළු නිෂ්පාදකයන් වෙතින් උසස් ප්‍රමිතියෙන් යුතු නිෂ්පාදන ලබා ගැනීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වඩා වැඩි අවධානයක් යොමු කළ යුතුය. මේ සඳහා නිරතුරු නව තාක්ෂණ උපදෙස් ලබාදීම අවශ්‍ය වේ. හරිතාගාර වගාවේ දී කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රම භාවිතය හා හරිතාගාර ගොඩනැගීම හා නඩත්තුව, පළිබෝධනාශක භාවිතය අවම කරමින් ගුණාත්මක එළවළු නිපදවීම, අපනයනය සඳහා එළවළු තේරීමේ ප්‍රමිතීන් යන කරුණු ආශ්‍රිතව පුහුණු වැඩසටහන් අත්‍යවශ්‍ය වේ. උසස් ප්‍රමිතියෙන් යුතු හරිතාගාර බෝග බීජ සපයා ගැනීම හරිතාගාර ගොවීන්ට සැලකිය යුතු මට්ටමින් බලපා ඇත. එබැවින් එම ගැටලු විසඳීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය හා බීජ සහතික කිරීමේ සේවාවේ අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. එළවළු අපනයන අගයදාමය තුළ නිෂ්පාදකයන් හා සැපයුම්කරුවන් මුහුණපාන ඇණවුම් පිළිබඳ අවිනිශ්චිතතා අවම කිරීම සඳහා එළවළු එකතු කර අපනයනකරුවන් වෙත සපයන පුද්ගලයන් හට ශීතාගාර පහසුකම් හා ණය සහන ලබාදී එළවළු ගබඩා කර තබා අවශ්‍ය වේලාවට ඇණවුම් ඉදිරිපත් කිරීමට මං සැලසිය යුතුය.

## පටුන

**පෙරවදන**

**ස්තුතිය**

**සංක්ෂිප්තය**

**පළමුවැනි පරිච්ඡේදය**

1.1 අධ්‍යයන පසුබිම 1

1.2 අධ්‍යයන ගැටලුව 2

1.3 අධ්‍යයනයේ වැදගත්කම 2

1.4 අධ්‍යයනයේ අරමුණු 2

1.4.1 විශේෂිත අරමුණු 2

1.5 පර්යේෂණ ක්‍රමවේදය 3

1.5.1 දත්ත රැස් කිරීම 3

1.5.2 ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා නියැදිය තෝරා ගැනීම 4

1.5.3 දත්ත විශ්ලේෂණය 5

1.6 පරිච්ඡේද සැකසුම 6

**දෙවැනි පරිච්ඡේදය**

**දේශීය එළවළු අපනයන කර්මාන්තයේ වත්මන් තත්ත්වය** 7

2.1 එළවළු අපනයනයේ සංයුතිය 7

2.2 අපනයන වෙළඳපොළ 8

2.3 ලෝක එළවළු අපනයන වෙළඳපොළ ප්‍රවණතා 9

2.4 ශ්‍රී ලංකාවේ එළවළු අපනයනය 12

2.5 එළවළු අපනයනයේ නිරතව සිටින සංවිධාන 14

2.6 එළවළු අපනයන ක්ෂේත්‍රයේ වත්මන් ගැටලු 14

2.7 එළවළු අපනයනය සඳහා පවතින අනාගත විභවතා 15

**තෙවැනි පරිච්ඡේදය**


**අපනයනය සඳහා එළවළු නිෂ්පාදනය: ප්‍රතිලාභ හා ගැටලු** 17

3.1 හැඳින්වීම 17

3.2 එළවළු ගොවීන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය 17

3.3 අපනයනය සඳහා එළවළු නිපදවන්නන් තම නිෂ්පාදන බෙදා හරින ආකාරය 22

3.3.1 බදුල්ල දිස්ත්‍රික්කය 22

3.3.2 නුවරඑළිය දිස්ත්‍රික්කය 24

3.3.3 මාතලේ දිස්ත්‍රික්කය 27

3.4 ගොවීන් විසින් අපනයනය සඳහා එළවළු සැපයීම 28

3.4.1 සැපයුම්කරු හරහා අපනයනකරු වෙත එළවළු සැපයුම 30

3.4.2 ගොවියා විසින් අපනයනකරු වෙත සෘජුවම එළවළු සැපයීම 35

3.5 අපනයනය සඳහා ගුණාත්මක එළවළු සැපයීම පිණිස ගනු ලබන පියවර 35

3.5.1 පරිසර හිතකාමී වගා ක්‍රම අනුගමනය කිරීම 36

3.5.2 එළවළු තේරීම 37

3.5.3 එළවළු බහාළුම් භාවිතය 38

3.6 අපනයනය සඳහා එළවළු වගා කරන ගොවීන් අත් කර ගෙන ඇති ප්‍රතිලාභ 38

3.6.1 ව්‍යාපාරයේ ප්‍රගතිය 37

3.6.2 ණය ලබාගැනීම තුළින් ව්‍යාපාරය නඟා සිටුවීම සඳහා පියවර ගැනීම 42

3.6.3 ගොවීන් සංවිධානගත වීම 43

3.6.4 නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලැබීම 44

3.6.5 එළවළු ගොවීන්ගේ ආදායම වර්ධනය වීම 48

3.7 අපනයනය සඳහා එළවළු වගාකරන ගොවීන් මුහුණ පා ඇති ගැටලු 52

3.7.1 ඇණවුම් සීමාසහිත වීම හා අවිනිශ්චිත වීම 53

3.7.2 නිෂ්පාදන අපනයන ප්‍රමිතියට අනුකූල නොවීම 57

3.7.3 මිල ප්‍රමාණවත් නොවීම හා මිල උච්චාවචනය වීම 60

3.7.4 තේරීම මගින් එළවළු ප්‍රතික්ෂේපවීම හා තේරීමේ අක්‍රමිකතා 60

3.7.5 නිෂ්පාදන අලෙවි සබඳතා දුර්වලවීම 63

3.7.6 ණය ලබා ගැනීමේ දුෂ්කරතා 63

3.7.7 මූල්‍ය ගනුදෙනුවල අක්‍රමිකතා 64

**සිව්වැනි පරිච්ඡේදය**

**අපනයනය සඳහා එළවළු සැපයුම: ප්‍රතිලාභ හා ගැටලු** 65

4.1 හැඳින්වීම 65

4.2 සැපයුම්කරුවන්ගේ සමාජ-ආර්ථික තොරතුරු 66

4.3 සැපයුම්කරුවන් විසින් එළවළු මිලදී ගැනීම 69

4.4 එළවළු මිල ගණන් 76

4.4.1 බදුල්ල දිස්ත්‍රික්කය 76

4.4.2 නුවරඑළිය දිස්ත්‍රික්කය 77

4.4.3 මාතලේ දිස්ත්‍රික්කය 79

4.5 එළවළුවල ගැනුම් මිල අපනයන මිල හා සුපිරි වෙළඳපළ මිල ගණන් 80

4.6 එළවළු සැපයුම්කරුවන් අත්කර ගත් ප්‍රතිලාභ 83

4.6.1 සැපයුම්කරුවන්ගේ ආදායම වර්ධනය වීම 83

4. 7 එළවළු සැපයුම්කරුවන් මුහුණපාන ගැටලු 89

4.7.1 ඇණවුම්වලට අනුකූලවන පරිදි එළවළු සපයා ගැනීමේ ගැටලු 89

4.7.2 ගොවි සබඳතා පවත්වා ගැනීම අසීරු වීම 90

4.7.3 පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය 92

4.7.4 යටිතල පහසුකම් ආශ්‍රිත ගැටලු 93

4.7.5 සැපයුම්කරුවන්ට සාමූහිකව කටයුතු කිරීම සඳහා අවස්ථාවක් නොමැති වීම 94

**පස්වැනි පරිච්ඡේදය**

**එළවළු සැපයුම් අගයදාමය** 97

5.1 හැඳින්වීම 97

**හයවැනි පරිච්ඡේදය**

**සාරාංශ, නිගමන හා නිර්දේශ** 103

6.1 හැඳින්වීම 103

6.2 සාරාංශය හා නිගමන 103

6.3 නිර්දේශ 103

111

**ආශ්‍රිත ග්‍රන්ථ**

**ඇමුණුම 1** - ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදනය හා වගා භූමි ප්‍රමාණය

**ඇමුණුම 2** - අපනයනය සඳහා සහ දේශීය වෙළෙඳපොළට එළවළු සැපයූ මිල ගණන්

**ඇමුණුම 3** - ප්‍රධාන අපනයන එළවළු සමාගම්

**වගු අංක**


| | | |
|---|---|---|
| 1.1 | දිස්ත්‍රික්ක අනුව එළවළු ගොවීන්ගේ හා සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය | 5 |
| 2.1 | විවිධ ක්ෂේත්‍ර අංක යටතේ අපනයනය කරනු ලබන එළවළු වර්ග | 7 |
| 2.2 | ශ්‍රී ලංකාව ලෝක අපනයන වෙළඳපළෙහි අත්කර ගෙන ඇති ස්ථානය සහ අපනයනය කරනු ලබන එළවළු ප්‍රතිශතය | 10 |
| 3.1 | වගා ක්‍රමය හා අපනයනය සඳහා සපයන එළවළු ප්‍රමාණය අනුව එළවළු ගොවීන් වර්ගීකරණය | 19 |
| 3.2 | අපනයනය සඳහා එළවළු වගා කරන ගොවීන්ගේ සමාජ-ආර්ථික තොරතුරු | 21 |
| 3.3 | ආරක්ෂිත ගෘහ සහිත අපනයන දායකත්වය 65%ට වැඩි ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදා හැරීම - බදුල්ල දිස්ත්‍රික්කය | 22 |
| 3.4 | ආරක්ෂිත ගෘහ සහිත අපනයන දායකත්වය 65%ට අඩු ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදාහැරීම -බදුල්ල දිස්ත්‍රික්කය | 23 |
| 3.5 | ආරක්ෂිත ගෘහ තුළ එළවළු වගා කරන - අපනයන දායකත්වය 65%ට වැඩි ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදා හැරීම - නුවරඑළිය දිස්ත්‍රික්කය | 24 |
| 3.6 | ආරක්ෂිත ගෘහ රහිත අපනයන දායකත්වය 65%ට වැඩි ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදා හැරීම - නුවරඑළිය දිස්ත්‍රික්කය | 25 |
| 3.7 | ආරක්ෂිත ගෘහ රහිත අපනයන දායකත්වය 65%ට අඩු ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදා හැරීම - නුවරඑළිය දිස්ත්‍රික්කය | 26 |
| 3.8 | ආරක්ෂිත ගෘහ සහිත අපනයන දායකත්වය 65%ට අඩු ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදා හැරීම - නුවරඑළිය දිස්ත්‍රික්කය | 27 |
| 3.9 | ආරක්ෂිත ගෘහ රහිත අපනයනය දායකත්වය 65% අඩු ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදා හැරීම - මාතලේ දිස්ත්‍රික්කය | 28 |
| 3.10 | අපනයනය සඳහා එළවළු සපයන ආකාරය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය | 29 |
| 3.11 | එළවළු අපනයන කර්මාන්තයට යොමුවූ ආකාරය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය | 30 |
| 3.12 | ගොවින් සතු ප්ලාස්ටික් ඇසුරුම් සංඛ්‍යාව අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය | 38 |
| 3.13 | එළවළු අපනයන කර්මාන්තය වර්ධනය වී ඇති මට්ටම | 39 |

3.14 වෙළඳපළ අනුව එළවළු මිල සංසන්දනය - බදුල්ල දිස්ත්‍රික්කය 44
3.15 වෙළඳපළ අනුව එළවළු මිල සංසන්දනය - නුවරඑළිය දිස්ත්‍රික්කය 46
3.16 වෙළඳපළ අනුව එළවළු මිල සංසන්දනය - මාතලේ දිස්ත්‍රික්කය 47
3.17 විවිධ වෙළඳපළ වෙත එළවළු සැපයීමෙන් ලද ආදායම අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය - බදුල්ල දිස්ත්‍රික්කය 48
3.18 වගා ක්‍රම අනුව ලබන ආදායම වෙනස්වීම- බදුල්ල දිස්ත්‍රික්කය 49
3.19 විවිධ වෙළඳපළ වෙත එළවළු සැපයීමෙන් ලද ආදායම අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය - නුවරඑළිය දිස්ත්‍රික්කය 49
3.20 වගා ක්‍රම අනුව ලබන ආදායම වෙනස්වීම - නුවරඑළිය දිස්ත්‍රික්කය 50
3.21 විවිධ වෙළඳපළ වෙත එළවළු සැපයීමෙන් ලද ආදායම අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය - මාතලේ දිස්ත්‍රික්කය 51
3.22 වගා ක්‍රම අනුව ලබන ආදායම වෙනස්වීම - මාතලේ දිස්ත්‍රික්කය 52
3.23 අපනයනය සඳහා එළවළු වගා කරන ගොවීන් මුහුණපාන ගැටලු 53
3.24 වසරේ වැඩිම ඇණවුම් ලැබෙන එළවළු වර්ග හා මාස 56
3.25 වසරේ වැඩිම ඇණවුම් ලැබෙන එළවළු වර්ග හා මාස 57
3.26 අස්වනු මුරය අනුව අපනයන තත්ත්වයේ එළවළු නෙළා ගත හැකි ප්‍රමාණය වෙනස්වීම 58
3.27 එළවළු තේරීමේ ප්‍රමිතීන් 61
3.28 අපනයන කර්මාන්තය පසුබෑමකට ලක් වී ඇති ආකාරය 64
4.1 එළවළු අපනයන කර්මාන්තයට ලබාදෙන දායකත්වය අනුව අධ්‍යයන දිස්ත්‍රික්ක තුළ සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය 66
4.2 එළවළු සැපයුම්කරුවන් එළවළු ලබා ගන්නා ප්‍රභවයන් 66
4.3 එළවළු සැපයුම්කරුවන්ගේ සමාජ-ආර්ථික තොරතුරු 68
4.4 සැපයුම්කරුවන් විසින් මිලදී ගත් හා අපනයනය සඳහා සැපයූ එළවළු වර්ග හා ප්‍රමාණ බදුල්ල දිස්ත්‍රික්කය 70
4.5 සැපයුම්කරුවන් මිලදී ගත් හා අපනයනය සඳහා සැපයූ එළවළු වර්ග හා ප්‍රමාණ නුවරඑළිය දිස්ත්‍රික්කය 70
4.6 සැපයුම්කරුවන් මිලදී ගත් හා අපනයනය සඳහා සැපයූ එළවළු වර්ග හා ප්‍රමාණ මාතලේ දිස්ත්‍රික්කය 72
4.7 ව්‍යවසායන්හි ප්‍රමාණාත්මක විචලතා අනුව (මාසික) සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය 73

| | | |
|---|---|---|
| 4.8 | සැපයුම්කරුවන් එළවළු මිලදී ගත් හා අපනයනය සඳහා සැපයූ සාමාන්‍ය මිල ගණන් බදුල්ල දිස්ත්‍රික්කය | 76 |
| 4.9 | ගැණුම් මිල සහ අපනයනය සඳහා සැපයූ මිල ගණන්වල විචලතා පැවතුන එළවළු වර්ග බදුල්ල දිස්ත්‍රික්කය | 77 |
| 4.10 | සැපයුම්කරුවන් එළවළු මිලදී ගත් හා අපනයනය සඳහා මිල ගණන් නුවරඑළිය දිස්ත්‍රික්කය | 77 |
| 4.11 | ගැණුම් මිල සහ අපනයනය සඳහා සැපයූ මිල ගණන්වල විචලතා පැවතුන එළවළු වර්ග නුවරඑළිය දිස්ත්‍රික්කය | 78 |
| 4.12 | සැපයුම්කරුවන් එළවළු මිලදී ගත් හා අපනයනය සඳහා සැපයූ සාමාන්‍ය මිල ගණන් මාතලේ දිස්ත්‍රික්කය | 79 |
| 4.13 | ගැණුම් මිල සහ අපනයනය සඳහා සැපයූ මිල ගණන්වල විචලතා පැවතුන එළවළු වර්ග මාතලේ දිස්ත්‍රික්කය | 80 |
| 4.14 | අපනයනය සඳහා හා සුපිරි වෙළඳපළට එළවළු සැපයූ මිල ගණන් | 81 |
| 4.15 | අපනයනය සඳහා හා දේශීය වෙළඳපළට එළවළු සැපයූ මිල ගණන් | 82 |
| 4.16 | දිස්ත්‍රික්ක අනුව එළවළු වර්ග මිලදී ගත් වාර ගණන | 83 |
| 4.17 | සැපයුම්කරුවන්ගේ අයවැය (මාසික) විශ්ලේෂණය | 84 |
| 5.1 | එළවළු සැපයුම් අගයදාම නියෝජනය කළ ගොවීන්ගේ ආර්ථික පරාමිතකයන් | 102 |

**ප්‍රස්තාර**

| | | |
|---|---|---|
| 2.1 | ශ්‍රී ලංකාව එළවළු අපනයනය කරන රටවල් - 2013 | 8 |
| 2.2 | ලූනු සහ ලූනු ගස් (shallot), සුදු ලූනු, ලීක්ස් සහ අනෙකුත් ලූනු පවුලට අයත් එළවළු අපනයන ප්‍රවණතා | 11 |
| 2.3 | අනෙකුත් එළවළු සඳහා වන අපනයන ප්‍රවණතා | 11 |
| 2.4 | තාවකාලික කල් තබාගත හැකි රක්ෂිත එළවළු සඳහා වන අපනයන ප්‍රවණතා | 11 |
| 2.5 | ශ්‍රී ලංකාවේ එළවළු අපනයන ප්‍රමාණය හා අපනයන වටිනාකම - 1990-2013 | 12 |
| 3.1 | දිස්ත්‍රික්ක අනුව ප්‍රධාන වගා ක්‍රම දෙක අනුගමනය කරන ගොවීන්ගේ ව්‍යාප්තිය | 18 |
| 3.2 | වගා ක්‍රම අනුව කාබනික එළවළු සඳහා ඉල්ලුම | 36 |
| 3.3 | ව්‍යාපාරයේ දිශානතිය | 39 |
| 3.4 | ව්‍යාපාරයන්හි ප්‍රගතිය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය | 40 |
| 3.5 | ව්‍යාපාරයන්හි වර්ධනයට පාදක වූ හේතු | 41 |
| 3.6 | වගා ක්‍රමය හා ව්‍යාවසායන්හි ප්‍රගතිය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය | 41 |

3.7 අපනයනයට එළවළු සපයන කොටස අනුව ගොවීන්ගේ තත්ත්වය 42
3.8 වර්ෂයේ මාස අනුව වැඩිම හා අඩුම ඇණවුම් ප්‍රමාණවල ව්‍යාප්තිය 54
3.9 දිස්ත්‍රික්ක හා මාස අනුව වැඩිම ඇණවුම්වල ව්‍යාප්තිය 55
4.1 අපනයන සඳහා සැපයූ එළවළු සංඛ්‍යාව අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය 73
4.2 මිලදී ගනු ලබන එළවළුවලින් අපනයනය සඳහා සැපයූ ප්‍රමාණය (ප්‍රතිශතය) අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය 74
4.3 මිලදී ගත් එළවළුවලින් දේශීය වෙළඳපළට සැපයූ ප්‍රමාණය (ප්‍රතිශතය) අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය 75
4.4 එළවළු මිලදී ගැනීම සඳහා මාසික වැය අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය 84
4.5 අපනයනය සඳහා එළවළු සැපයීමෙන් උපයන ආදායම අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය 85
4.6 එළවළු අලෙවිය තුළින් උපයා ඇති මුළු ආදායම අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය 86
4.7 එළවළු අලෙවිය තුළින් උපයා ඇති ලාභය අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය 86
4.8 එළවළු සැපයුම් කර්මාන්තයේ ප්‍රගතිය/වර්ධනය 87
4.9 එළවළු සැපයුම් කර්මාන්තයේ වර්ධනයක් අත්පත් කර ගත් ව්‍යාවසායන්හි ප්‍රගතිය 88
4.10 එළවළු සැපයුම් කර්මාන්තයේ වර්ධනයක් වාර්තා නොවූ ව්‍යාවසායන්හි බිඳ වැටීම 95


**රූපසටහන්**


5.1 නිෂ්පාදකයන් විසින් එළවළු බෙදා හරින සැපයුම් ජාල 98

# පළමුවැනි පරිච්ඡේදය

# හැඳින්වීම

## 1.1 අධ්‍යයන පසුබිම

දේශීය එළවළු නිෂ්පාදන කර්මාන්තය අනෙකුත් කාලීන බෝග වගාවන් මෙන්ම කාලීන උච්චාවචනයන්ට යටත්වීම පොදු ලක්ෂණයකි. එසේ නමුත් රට තුළ පවතින කෘෂි දේශගුණික විවිධත්වය ප්‍රයෝජනයට ගනිමින් එම අභියෝගය යම්තාක් දුරට හෝ ජය ගැනීම සඳහා දේශීය ගොවි ප්‍රජාව සමත් වී ඇති නමුත් අතිරික්ත නිෂ්පාදනය ඉහළ මිලකට අලෙවි කරගත නොහැකි විටදී කෘෂිකාර්මික ආදායම පහත වැටීම එළවළු නිෂ්පාදකයා මුහුණ දෙන ප්‍රධාන ගැටලුවකි. එබැවින් එම අතිරික්ත නිෂ්පාදන අපනයන වෙළඳපොළ ඉලක්ක කොටගත් සුළු හෝ මධ්‍ය පරිමාණ කර්මාන්ත ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ගත හැකි වේ නම් එය එළවළු නිෂ්පාදකයන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා සුදුසු විකල්පයකි.

වර්ෂ 2013 සඳහා වූ අයවැය වාර්තාව අනුව ද සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් දිරිමත් කිරීම එක් ප්‍රධාන අරමුණකි. සංවර්ධනය වෙමින් පවතින රටවල සේවා නියුක්ති අවස්ථාවන් උත්පාදනය කිරීමේ ලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ආර්ථිකයේ විශේෂ වැදගත්කමක් හිමි විය යුතු අංගයක් ලෙස හඳුනා ගෙන ඇත. බොහෝ විද්වතුන් (හම්ප්‍රි සහ ස්මිට්ස් (1996) සහ Aydalot (1998)) සඳහන් කර ඇති පරිදි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය අඩු ආදායම්ලාභීන්ට අතහිත දීමේ හා ඌන සේවා නියුක්තිකයින් හට රැකියා සැපයීමේ මාර්ගයක් ලෙස සලකනු ලැබේ.

මෙම වාර්තාවේ දෙවන පරිච්ඡේදයේ සාකච්ඡා කර ඇති පරිදි ශ්‍රී ලංකාව කාලයක් තිස්සේ දේශීය එළවළු අපනයනයේ නියැළී සිටින නමුත් එම කර්මාන්තය තුළ කැපී පෙනෙන වර්ධනයක් අත්පත් කර ගැනීමට සමත්වී නොමැති බව හෙ.කො.ගො.ප.පු ආයතනයේ අධ්‍යයනයකින් හෙළි දරව් වී ඇත (සුභාෂිනී ඇතුළු පිරිස, පළ නොවූ). එළවළු නිෂ්පාදනයේ සිට අපනයනය දක්වා වූ අගයදාමයේ විවිධ අදියරවල දක්නට ලැබෙන අඩු ලුහුඬුකම් එම පසුබෑමට ප්‍රධාන හේතුවක් බව අපනයනකරුවන්ගේ මතය වේ. අපනයන ප්‍රමිතීන්ට අනුකූල වූ ගුණාත්වයෙන් ඉහළ එළවළු අවශ්‍ය ප්‍රමාණවලින් හා අවශ්‍ය අවස්ථාවන්හි දී සපයා ගත නොහැකිවීම ඔවුන් මුහුණපාන ත්‍රිවිධාකාර මූලික ගැටලු වේ. ඒවා එළවළු අපනයන අගය දාමයේ ප්‍රාරම්භක පියවර හා බෙහෙවින්

බැදී පවතින බැවින් එම ගැටලු මග හරවා ගැනීම සඳහා යම් දායකත්වයක් ලබාදිය හැක්කේ එකී ප්‍රාරම්භක පියවරයන්හි ප්‍රධාන ක්‍රියාකාරීන් වන එළවළු ගොවීන්ට හා සැපයුම්කරුවන්ට ය. ඒ අනුව අපනයනය සඳහා එළවළු වගාකරන ගොවීන්ගේ හා සැපයුම් කරුවන්ගේ කාර්යභාරය විමසුමට ලක් කරමින් එම කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට ඇති ඉඩප්‍රස්තා යෝජනා කිරීම මෙම අධ්‍යයනයේ විෂය පථය වේ.

## 1.2 අධ්‍යයන ගැටලුව

ඉහතින් සඳහන් කළ පරිදි අවශ්‍ය ගුණාත්මයෙන් යුත් එළවළු වර්ග අවශ්‍ය ප්‍රමාණවලින් හා අවශ්‍ය අවස්ථාවන්හි ද සපයා ගත නොහැකි වීම එළවළු අපනයන කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා පවතින ප්‍රධාන බාධකයක් වේ. විටෙක එළවළු නිෂ්පාදනයේ අතිරික්තයක් පවතින රටක ඉහත සඳහන් ගැටලු ජනිත වන්නේ කුමන කරුණු හේතුවෙන් ද යන්න ආමන්ත්‍රණය කිරීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂිතය.

## 1.3 අධ්‍යයනයේ වැදගත්කම

වර්ෂ 2013 අයවැය වාර්තාව තුළින් සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් දිරිමත් කළ යුතු බව ඉදිරිපත් කර තිබේ. මෙය එළවළු අපනයන කර්මාන්තය සඳහා ද පොදු යෝජනාවකි. විදේශ විනිමය උපයා ගැනීමටත්, දේශීය එළවළු ගොවියාගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමටත් මේ තුළින් හැකියාවක් ලැබෙනු ඇත. ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන වේගයට (1.2%) වඩා වැඩි වේගයකින් (2%) වර්ධනය වන ග්‍රාමීය ශ්‍රම බලකායට රැකියා ඉඩප්‍රස්තා ලබා දීමට මෙන්ම අපනයනට ඍජුවම සම්බන්ධ වී සිටින එළවළු සැපයුම්කරුවන් හා නිෂ්පාදකයන් දිරිමත් කිරීම සඳහා ද ඒ තුළින් හැකිවනු ඇත.

ශ්‍රී ලංකාවේ පවතින කෘෂි දේශගුණික විවිධත්වය ප්‍රයෝජනයට ගනිමින් වර්ෂය පුරා එළවළු වගා කිරීම සඳහා ඉහළ විභවයක් පවතී. එම විභවයෙන් ඵල ලබා ගැනීම සඳහා පවතින බාධක ජය ගන්නේ කෙසේ ද යන්න පිළිබඳව මෙම අධ්‍යයනය මගින් හෙළිදරව් කරන අතර එය ඉහත සඳහන් ප්‍රතිලාභ අත් කර දීමට ඉවහල් වනු ඇත.

## 1.4 අධ්‍යයනයේ අරමුණු

අපනයනය සඳහා ඉහළ ගුණාත්වයෙන් යුත් එළවළු අවශ්‍ය ප්‍රමාණවලින් හා අවශ්‍ය අවස්ථාවන්හිදී සපයා ගත නොහැකිවීමට තුඩු දී ඇති හේතු හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය.

### 1.4.1 විශේෂිත අරමුණු

1. අපනයනය සඳහා එළවළු වගා කිරීමේ හා සැපයීමේ ක්‍රියාදාමය විමසුමට ලක් කිරීම හා එමගින් එළවළු ගොවීන් හා සැපයුම්කරුවන් අත්කරගත් ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම
2. එළවළු අපනයන කර්මාන්තයට සම්බන්ධ එළවළු ගොවීන් හා සැපයුම්කරුවන් මුහුණ දෙන ගැටලු හා දුෂ්කරතා හඳුනා ගැනීම.
3. එළවළු අපනයන කර්මාන්තයට සම්බන්ධ එළවළු සැපයුම් ක්‍රියාදාමය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ප්‍රවර්ධනය කිරීම උදෙසා සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රමෝපායන් යෝජනා කිරීම.

## 1.5 පර්යේෂණ ක්‍රමවේදය

### 1.5.1 දත්ත රැස් කිරීම

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ රේගු දෙපාර්තමේන්තුව යන ආයතන හා දෙපාර්තමේන්තුවලින් නිකුත්කළ හා පළනොවූ වාර්තා, පොත්පත් සඟරා හා ලිපිවලින් අධ්‍යයන විෂයපථයට අදාළ, ද්විතීක දත්ත ලබා ගන්නා ලදී.

අධ්‍යයනය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා ක්‍රමෝපායයන් කීපයක් අනුගමනය කරන ලදී.

**අ. විධිමත් ප්‍රශ්නාවලියක් මගින් තොරතුරු රැස් කිරීම**

අපනයනය සඳහා භාවිතා කරන එළවළුවල ගුණාත්මක, ප්‍රමාණාත්මක හා කාලීන සැපයුම පිළිබඳ ගැටලු පිළිබඳව විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය. එළවළු නිෂ්පාදකයන් හා සැපයුම්කරුවන් එකී ගැටලු ආශ්‍රිත ප්‍රධාන ක්‍රියාකාරීන් බව බැලූ බැල්මට

පෙනේ. එබැවින් මෙම අධ්‍යයනයට අදාළ ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා එළවළු ගොවීන් හා සැපයුම්කරුවන් තෝරා ගෙන විධිමත් ප්‍රශ්නාවලි ඇසුරෙන් අවශ්‍ය දත්ත රැස් කරන ලදී. මෙහි දී එක් කුටුම්භයක් එක් නියැදි ඒකකයක් ලෙස සලකන ලදී.

**ආ. පුද්ගල සම්මුඛ සාකච්ඡා**

ප්‍රශ්නාවලි දත්තවලට අමතරව අදාළ අධ්‍යයන ප්‍රදේශ තුළ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය නිලධාරීන්, කෘෂිකර්ම උපදේශකවරුන්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා දත්ත ලබා ගන්නා ලදී. මේ සඳහා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලි අත්වැලක් භාවිතා කරන ලදී.

**ඇ. සමූහ ගොවි සාකච්ඡා**

අපනයනය සඳහා එළවළු වගා කිරීමේ හා එකතු කර සැපයීමේ වත්මන් තත්ත්වය, ගැටලු හා දුෂ්කරතා මෙන්ම එය ප්‍රවර්ධනය කිරීම සඳහා උචිත යෝජනා පිළිබඳ පුළුල් අදහස් ලබා ගැනීමේ අරමුණින් සමූහ ගොවි සාකච්ඡා පවත්වා දත්ත රැස් කරන ලදී.

### 1.5.2 ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා නියැදිය තෝරා ගැනීම

අපනයනය සඳහා එළවළු වගා කරන්නන් හා සැපයුම්කරුවන් පිළිබඳ ලේඛනගත දත්ත නොමැතිවීමෙන් මෙම අධ්‍යයනයට අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා නියැදිය තෝරා ගැනීම දුෂ්කර විය. එබැවින් ප්‍රධාන වශයෙන් එළවළු නිෂ්පාදනය කරනු ලබන දිස්ත්‍රික්කවල සිදු කළ පූර්ව ක්ෂේත්‍ර නිරීක්ෂණ හා පුද්ගල හා සමූහ ගොවි සාකච්ඡා ඔස්සේ ලබාගත් අවබෝධය තුළින් අපනයනය ඉලක්ක කොට ගත් එළවළු ගොවීන් නුවරඑළිය, බදුල්ල හා මාතලේ යන දිස්ත්‍රික්කවල හමු විය හැකි බව අනාවරණය විය. ඒ අනුව එම දිස්ත්‍රික්ක තුන ප්‍රධාන අධ්‍යයන ප්‍රදේශ වශයෙන් තෝරා ගන්නා ලදී.

සැපයුම්කරුවන් පිළිබඳව ද එපරිද්දෙන්ම තොරතුරු අනාවරණය කර ගත් අතර එක් සැපයුම්කරුවෙකු හඳුනා ගත් පසු ඔහු හා දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව අනෙකුත් සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු සොයා ගන්නා ලදී. සමහර සැපයුම්කරුවන් වෙතින් තමා වෙත එළවළු සපයන ගොවීන්ගේ තොරතුරු අනාවරණය කර ගැනීම තරමක් අපහසු විය. තමන් හඳුනා ගත් තමන්ට එළවළු සපයන ගොවීන්ගේ විස්තර පිටස්තර අයට ලබාදීම තුළින් තමන්ගේ සැපයුම් ජාලය අන් අය අතට පත් වේය යන බිය මේ අය තුළ විය. නමුත් සැපයුම්කරුවන් ඉතා

සුළු පිරිසක් පමණක් තමන්ට එළවළු සපයන ගොවීන්ගේ විස්තර ලබා දෙන ලදී. එම ගොවීන් අතරින් සුළු පිරිසක් සිය නිෂ්පාදන අපනයනය සඳහා භාවිතා කරන බවට අවබෝධයක් ලබා නොතිබුණි. ඒ අනුව හඳුනා ගන්නා ලද නියැදිය වගු අංක 1.1 මඟින් දක්වා ඇත. නියැදිය ව්‍යාප්ත වූ ප්‍රදේශ පහත පරිදිය.

- බදුල්ල දිස්ත්‍රික්කය : අඹගස්දෝව, උඩුකිඳ, මූදනාව, ඌවපරණගම, පුළුන්වෙල, වැලිමඩ ලුණුවත්ත, උඩුබාදන හා කළුබුලුලන්ද
- නුවරඑළිය දිස්ත්‍රික්කය : නුවරඑළිය, සීතාඑළිය, හාවාඑළිය, පිදුල, මීපිලිමාන ආදී ප්‍රදේශ
- මාතලේ දිස්ත්‍රික්කය : දඹුල්ල, මඩාටුගම, නාවුල, බිබිල, කැකිරාව, කැටවල හා මාලෙවෙල යන ප්‍රදේශ

**වගු අංක 1.1 : දිස්ත්‍රික්ක අනුව එළවළු ගොවීන්ගේ හා සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය**

| නියැදිය | බදුල්ල | | නුවරඑළිය | | මාතලේ | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| එළවළු ගොවීන් | 29 | 32 | 22 | 24 | 40 | 44 | 91 | 100 |
| එළවළු සැපයුම්කරුවන් | 7 | 27 | 9 | 35 | 10 | 38 | 26 | 100 |
| මුළු එකතුව | 36 | 31 | 31 | 26 | 50 | 43 | 117 | 100 |

**මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014.**

- විවෘත වගා භූමිවල එළවළු නිපදවන්නන්ගේ 2013/14 මහ කන්නයේ නිෂ්පාදන සහ හරිතාගාර නිෂ්පාදකයන්ගේ අවසාන වගා මුරයේ දත්ත විශ්ලේෂණය සඳහා භාවිතා කරන ලදී.

### 1.5.3 දත්ත විශ්ලේෂණය

ප්‍රශ්නාවලි මාර්ගයෙන් රැස්කළ දත්ත SPSS 20 දත්ත විශ්ලේෂණ පැකේජය ඇසුරෙන් පරිගණක ගත කර වගු හා ප්‍රස්තාර ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ඊට අමතරව සංඛ්‍යානමය විශ්ලේෂණ මඟින් සොයාගැනීම්වල වලංගුභාවයන් සහතික කර ඇත (frequency distributions හා cross tabulation දත්ත).

## 1.6 පරිච්ඡේද සැකසුම

අධ්‍යයනයේ පළමු පරිච්ඡේදය තුළින් මූලික හැඳින්වීම, අධ්‍යයනයේ අරමුණු සහ ක්‍රමවේදය විග්‍රහ කෙරෙන අතර දෙවන පරිච්ඡේදය මඟින් දේශීය එළවළු අපනයන කර්මාන්තයේ වත්මන් තත්ත්වය පිළිබඳ සාහිත්‍ය විමර්ශනය ඉදිරිපත් කර ඇත. තෙවන හා සිව්වන පරිච්ඡේද මඟින් පිළිවෙළින් අපනයනය සඳහා එළවළු නිෂ්පාදනය කරන හා සපයන කර්මාන්තකරුවන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය, එළවළු නිෂ්පාදන හා සැපයුම් ක්‍රියාවලිය, එමඟින් ඔවුන් අත් කර ගෙන ඇති ප්‍රතිලාභ මෙන්ම එම කාර්යයන්හි නියැළීමේ දී ඔවුන් මුහුණපාන ගැටලු පිළිබඳව ද සාකච්ඡා කර ඇත. පස්වැනි පරිච්ඡේදය මගින් එළවළු සැපයුම් අගයදාම පිළිබඳ ඉදිරිපත් කර ඇති අතර හයවන පරිච්ඡේදයෙන් අධ්‍යයනයේ සොයා ගැනීම් පිළිබඳ සාරාංශයක් සමග නිගමන හා යෝජනා ඉදිරිපත් කර ඇත.

## දෙවැනි පරිච්ඡේදය

# දේශීය එළවළු අපනයන කර්මාන්තයේ වත්මන් තත්ත්වය

### 2.1 එළවළු අපනයනයේ සංයුතිය

එළවළු අපනයන වෙළඳපළ සඳහා ශ්‍රී ලාංකීය දායකත්වය ඉතා සුළු ප්‍රමාණයකි. වර්ෂ 2012 දී ශ්‍රී ලංකාව නිෂ්පාදනය කළ මුළු එළවළු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 878,687ක් වූ අතර (ඇමුණුම 1) ඉන් මෙට්‍රික් ටොන් 22,737ක ප්‍රමාණයක් අපනයනය කරන ලදී. එය ප්‍රතිශතයක් ලෙස 2.5%කි (ශ්‍රී ලංකා රේගුව හා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012). ශ්‍රී ලංකාවේ විවිධ දේශගුණික කලාපවල වැවෙන විවිධ එළවළු විශේෂ 40ක් පමණ ඊට ඇතුළත් වන අතර බෝංචි, ලීක්ස්, මාළු මිරිස්, ගෝවා, කැරට්, තක්කාලි, බෙල් පෙපර්, ආටිචෝක් සහ ගර්කින් ඒ අතර ප්‍රධාන තැනක් ගනී. මෙම එළවළු නැවුම් හා ශීත කළ එළවළු වශයෙන් ද සකස් කරන ලද එළවළු ලෙස සුළු කොටසක් ද අපනයනය කරනු ලබයි. අපනයන කේත අංක (HS Codes) යටතේ එළවළු අපනයනය කරනු ලබන අතර තවදුරටත් වන එහි වර්ගීකරණයන් කීපයක් 2.1 වගුවෙහි දැක්වේ.


**වගු අංක 2.1 : විවිධ කේත අංක යටතේ අපනයනය කරනු ලබන එළවළු වර්ග**

| කේත අංක | එළවළු කාණ්ඩය | අපනයනය කරනු ලබන ප්‍රමාණ මෙට්‍රික් ටොන් | |
|---|---|---|---|
| | | 2012 | 2013 |
| 0701 | නැවුම් සහ ශීත කළ අර්තාපල් | 6.4 | 5.5 |
| 0702 | නැවුම් සහ ශීත කළ තක්කාලි | 26.6 | 70.4 |
| 0703 | ලූනු සහ ලූනු ගස් (shallot), සුදු ලූනු, ලීක්ස් සහ අනෙකුත් ලූනු පවුලට අයත් එළවළු | 49.4 | 156.2 |
| 0704 | ගෝවා, මල්ගෝවා, නෝකෝල්, ගෝවා කොළ සහ ඒ සමාන කෑමට යෝග්‍ය ගෝවා පවුලට අයත් එළවළු ( නැවුම් හා ශීත කළ) | 24.6 | 1.7 |
| 0705 | සලාද ගස් සහ chicory (නැවුම් සහ ශීත කළ) | - | - |
| 0706 | කැරට්, රාබු, සලාද සඳහා වන රතු අල, celeriac and edible roots (නැවුම් සහ ශීත කළ) | 6.4 | 82.4 |
| 0707 | පිපිඤ්ඤා සහ ගර්කින් (නැවුම් හෝ ශීතකළ) | - | - |
| 0708 | රනිල කුලයේ එළවළු, පොත්ත සහිතව සහ රහිතව (නැවුම් හෝ ශීත කළ) | 27.7 | 28.7 |
| 0709 | අනෙකුත් එළවළු (නැවුම් හෝ ශීත කළ) | 5202.1 | 6772.3 |
| 0710 | හිමායිත/වියළන ලද එළවළු (හුමාලයෙන් තැම්බීමෙන් හෝ ජලයේ තැම්බීමෙන් පිසූ හෝ නොපිසූ) | 144.4 | 535.5 |
| 0711 | තාවකාලිකව කල් තබා ගතහැකි ලෙස සකස් කළ එළවළු | 87.9 | 118.6 |
| 0712 | වියළි එළවළු (සම්පූර්ණ, කැපූ හෝ පිටි වශයෙන්) | 8.9 | 24.8 |
| 0713 | වියළි රනිල කුලයේ එළවළු (පොතු සහිතව, වෙන් කළ හෝ ශුද්ධ කළ) | - | - |
| 0714 | මඤ්ඤොක්කා | 31,76.5 | 33,91.9 |

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2013.**

## 2.2 අපනයන වෙළඳපළ

විවිධ මාදිලින් යටතේ ශ්‍රී ලංකාව මගින් වැඩිම එළවළු ප්‍රමාණයක් අපනයනය කරනු ලබන්නේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයටය. ඒ හැරුණු කොට වර්ෂ 2013 දී එළවළු අපනයනය කරනු ලැබූ ප්‍රමාණයේ අවරෝහණ පිළිවෙළ අනුව පෙළ ගැස්විය හැකි පිළිවෙළ වනුයේ, පකිස්ථානය, මාලදිවයින, ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය, ඉන්දියාව, මැලේසියාව , කැනඩාව හා ස්විට්සර්ලන්තය යනා දී වශයෙනි (ප්‍රස්තාර අංක 2.1).




මූලාශ්‍රය: රේගු දෙපාර්තමේන්තුව, 2013.

**ප්‍රස්තාර අංක 2.1: ශ්‍රී ලංකාව එළවළු අපනයනය කරන රටවල් - 2013**

වැඩිම නැවුම් එළවළු තොගයක් අපනයනය කරනු ලබන්නේ එක්සත් අරාබි එමීර් රාජ්‍යය, මාලදිවයින, ඇමරිකා එක්සත් ජනපදය සහ පකිස්ථානය යන රටවලට වේ. භූගෝලීය සමීපභාවය, ප්‍රවාහන පහසුකම් සහ මෙරට අපනයනවලට ඇති වර්ධනය වන ඉල්ලුම යන හේතු මත මාලදිවයින සහ මැද පෙරදිග රටවලට එළවළු අපනයනය අතින් ප්‍රධාන ස්ථානයක් හිමි කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වී තිබේ. 2013 වර්ෂයේ සමස්ත එළවළු අපනයනයෙන් 22% හා 12%ක් වශයෙන් අපනයනය කරනු ලැබ ඇත්තේ පිළිවෙළින් එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ මාලදිවයිනටයි (: ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, 2013). ශ්‍රී ලංකාව මාලදිවයිනට අපනයනය කරනු

ලබන ප්‍රධාන එළවළු වර්ග වනුයේ අර්තාපල්, ලූනු සහ ලූනු ගස් (shallot), ආටිචෝක්, බිම් මල්, කැරට් සහ ගෝවා වේ. මාලදිවයින සමඟ සිදු කරන අපනයන ගනුදෙනුවෙහි එක් තරඟකරුවෙකු වන්නේ ඉන්දියාවයි. තවත් තරඟකරුවෙකු වන්නේ වෙනත් රටවලින් (විශේෂයෙන් යුරෝපයෙන්) ආනයනය කරනු ලබන ගුණාත්මක එළවළු ප්‍රතිඅපනයනය කරන එක්සත් අරාබි එමීර් රාජ්‍යයයි. ශ්‍රී ලංකාව එක්සත් අරාබි එමීර් රාජ්‍යයට අපනයනය කරනු ලබන ප්‍රධාන එළවළු වර්ග වනුයේ 'අනෙකුත් එළවළු' නම් කේත අංක 0709 සහිත කාණ්ඩය යටතේ එළවළු හා කේත අංක 0714 කාණ්ඩය සහිත එළවළුය.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තු දත්තවලට අනුව පසුගිය වර්ෂ 10 පුරා අපනයනය කරන ලද නැවුම් එළවළුවලින් 87%ක ප්‍රතිශතයක් 'අනෙකුත් එළවළු' නම් කේත අංක 0709 සහිත කාණ්ඩය යටතේ අපනයනය කරනු ලබන අතර ඉන් 42%ක ප්‍රතිශතයක් මාලදිවයිනට සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයට අපනයනය කරනු ලබයි. පසුගිය වසර දහය තුළ මෙම එළවළුවලින් ස්විට්සර්ලන්තය, කුවේට් සහ කටාර් රාජ්‍යයන්ට අපනයනය කරන ප්‍රමාණ වනුයේ පිළිවෙළින් 10%, 9% සහ 12% වශයෙනි (සුභාෂිණී, පළ නොවූ). 'අනෙකුත් එළවළු' යටතේ වෙනම කේත අංකයක් සහිතව අපනයනය කරනු ලබන වටිනාකමින් ඉහළ බෝගය වනුයේ ග්ලෝබ් ආටිචෝක් වන අතර එය ප්‍රධාන වශයෙන් එක්සත් රාජධානිය, ස්විට්සර්ලන්තය, මාලදිවයින සහ කැනඩාව යන රටවලට අපනයනය කරනු ලබයි. අපනයනය කරනු ලබන සෑම එළවළුවක්ම එකිනෙකට වෙනස් වූ කේත අංක යටතේ වර්ග නොකිරීම හේතුවෙන් අපනයන වෙළඳපොළ තුළ විභවතාවයක් සහිත එළවළු බෝග සහ ඒ සඳහා පවතින වෙළඳපළ ප්‍රවණතා හඳුනා ගැනීමේ අපහසුතාවයක් පවතී.

## 2.3 ලෝක එළවළු අපනයන වෙළඳපළ ප්‍රවණතා

වර්ධනය වන ආදායම් සහ නිවැරදි දේ පාරිභෝජනය කිරීම පිළිබඳ පාරිභෝගික දැනුවත්භාවය හේතුවෙන් පලතුරු සහ එළවළු සඳහා අන්තර්ජාතික වෙළඳාම වර්ධනය වෙමින් පවතී. ප්‍රවර්ධන තාක්ෂණයන්ගේ සහ නිෂ්පාදන ක්‍රියාවලීන්ගේ වර්ධනය මෙන්ම මෙම ක්ෂේත්‍රයෙහිලා සංවර්ධිත රටවල් සිදු කරන අන්තර්ජාතික ආයෝජනය ඊට ඉවහල් වී තිබේ. ස්පාඤ්ඤය, නෙදර්ලන්තය, චීනය සහ මෙක්සිකෝව විශාලතම එළවළු අපනයනකරුවන් වන අතර ලෝක මට්ටමින් 64%ක ශුද්ධ එළවළු අපනයනයකට හිමිකම් කියයි. ආසියානු උප මහද්වීපය එළවළු නිෂ්පාදනයේ ප්‍රමුඛයෙක් වනුයේ 61%ක සමස්ත නිමැවුම් ධාරිතාවක් සහ වාර්ෂිකව 51%ක වර්ධනයක් ද

පෙන්නුම් කරමිනි. දිළිඳු සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් විසින් සිදු කරනු ලබන සම්ප්‍රදායික අපනයන නිෂ්පාදනයන් සඳහා පවතින ඉතා ඉක්මනින් වෙනස් වන සුලු සහ මිල පහළ යාමේ ප්‍රවණතාවය හේතුවෙන් ඒ සඳහා විකල්ප ලෙස මෙම ක්ෂේත්‍රය කෙරෙහි ආකර්ෂණීය වී තිබේ. එළවළු අපනයන වෙළඳපොළට බොහෝ රටවල් ප්‍රවේශ වී තිබුණ ද තිරසාර වශයෙන් එය පවත්වා ගෙන යාම අතින් සාර්ථක වී ඇත්තේ රටවල් කිහිපයක් පමණකි.


එළවළු සඳහා වන අපනයන කේත අංක ප්‍රකාරව විවිධ එළවළු වර්ග මත ශ්‍රී ලංකාව එළවළු අපනයනයෙහි සිටින ස්ථානය වෙනස් වේ. කේත අංක 0711 යටතේ වැඩි ප්‍රතිශතයක් අපනයන කරනු ලබන අතර දෙවනුව සමාන ප්‍රතිශතයන්ගෙන් අපනයන කරනු ලබන්නේ කේත අංක 0703 (ලූනු සහ ලූනු ගස් (shallot), සුදු ලූනු, ලීක්ස් සහ අනෙකුත් ලූනු පවුලට අයත් එළවළු) සහ කේත අංක 0709 (අනෙකුත් එළවළු) යටතේ වන එළවළු වර්ග වන අතර එම ප්‍රමාණය ලෝක අපනයනයෙන් 0.06%ක ප්‍රතිශතයකි (වගු අංක 2.2).

**වගු අංක 2.2: ශ්‍රී ලංකාව ලෝක අපනයන වෙළඳපළෙහි අත්කර ගෙන ඇති ස්ථානය සහ අපනයනය කරනු ලබන එළවළු ප්‍රතිශතය**

| | කේත අංකය (HS Code) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 0701 | 0702 | 0703 | 0704 | 0706 | 0708 | 0709 | 0711 | 0714 |
| අපනයනය ප්‍රතිශතය | 0.01 | 0.02 | 0.06 | 0.04 | 0.02 | 0.04 | 0.06 | 0.07 | 0.03 |
| ලෝක අපනයනය මට්ටම | 87 | 61 | 47 | 53 | 62 | 67 | 66 | 44 | 44 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, 2013.


රූපසටහන් අංක 2.2 සිට 2.4 මඟින් 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අංක 0703, 0709 සහ 0711 යන කේත අංක යටතේ යටතේ ශ්‍රී ලංකාව අපනයනය කළ එළවළු ප්‍රතිශතයන් දැක්වෙන අතර අදාළ කේත අංක යටතේ ශ්‍රී ලංකාවෙන් අපනයනය කළ ඉහළම අපනයනයන්හි ප්‍රතිශත ද එම ප්‍රස්තාර මගින් නිරූපණය කර ඇත.




මූලාශ්‍රය : ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, 2013.

ප්‍රස්තාර අංක 2.2: ලූනු සහ ලූනු ගස් (shallot), සුදු ලූනු, ලීක්ස් සහ අනෙකුත් ලූනු පවුලට අයත් එළවළු අපනයන ප්‍රවනතා


2013 වර්ෂයේ මෙම නිෂ්පාදන සඳහා ප්‍රධාන වෙළඳපළ රටවල් වූයේ මාලදිවයින, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජපානය, සිංගප්පූරුව සහ කටාර් රාජ්‍යයයි. ප්‍රස්තාර අංක 2.2න් පෙන්නුම් කරන පරිදි මෙම කාණ්ඩය යටතේ වන විශාලතම ප්‍රමාණය 2011 වර්ෂයේ අපනයනය කර ඇති අතර මෙම වර්ෂයේ වැඩි වශයෙන් අපනයනය කළ එළවළු වන්නේ සුදු ලූනු, රතු ලූනු සහ ලොකු ලූනු වේ.




මූලාශ්‍රය : ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, 2013

ප්‍රස්තාර අංක 2.3: අනෙකුත් එළවළු සඳහා වන අපනයන ප්‍රවණතා

ප්‍රස්තාර අංක 2.3හි දැක්වෙන පරිදි එළවළු වැඩි වශයෙන් අපනයනය කර ඇත්තේ 2010 වර්ෂයේ දී ය. ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ අනෙකුත් එළවළු කාණ්ඩයට අයත් වූ ආටිචෝක් අපනයන ප්‍රමාණය ඉහළ අගයක්(27%) වීමය. මේවා ප්‍රධාන වශයෙන් අපනයනය කරනු ලබන්නේ මාලදිවයින, යුරෝපා රටවල් සහ එක්සත් රාජධානියට වේ. අනෙකුත් එළවළු සඳහා වන අපනයන වටිනාකම සම්බන්ධයෙන් සැලකීමේ දී 2011 වර්ෂයේ සිට ක්‍රමික වර්ධනයක් දැකිය හැකිය. මෙම කාණ්ඩය සඳහා ප්‍රධාන වෙළඳපොළ වන්නේ මාලදිවයින, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, බ්‍රිතාන්‍ය සහ මැද පෙරදිග රටවල්ය.




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| වටිනාකම (රු.මිලියන) | 90 | 75 | 81 | 33 | 35 |
| ප්‍රමාණය(මෙ.ටො) | 1,026 | 873 | 918 | 88 | 119 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, 2013


**ප්‍රස්තාර අංක 2.4: තාවකාලික කල් තබාගත හැකි රක්ෂිත එළවළු සඳහා වන අපනයන ප්‍රවණතා**

මෙම කාණ්ඩය යටතේ (Hs711) පවතින ප්‍රධාන එළවළු වර්ගය වන්නේ තාවකාලිකව කල් තබා ගතහැකි ලෙස සකස් කළ එළවළුවක් වන ගර්කින්ය. එය ප්‍රධාන වශයෙන් ජපානය, ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තයට අපනයනය කරනු ලබයි. ඊට අමතරව සුදු ලූනු සහ ලූනු ද කල්තබා ගත හැකි ලෙස සකස් කර අපනයනය කරනු ලබයි.

## 2.4 ශ්‍රී ලංකාවේ එළවළු අපනයනය

ශ්‍රී ලංකාවේ සමස්ත එළවළු අපනයනය සැලකීමේ දී 2004 වසරේ දී මෙට්‍රික් ටොන් 12190 අපනයනය කර ඇති අතර එම ප්‍රමාණය 2012 වසර වන විට මෙට්‍රික් ටොන් 10844 දක්වා 11%කින් අඩුවී 2013 වසර වන විට මෙට්‍රික් ටොන් 22737 දක්වා 110% වැඩිවී ඇත(රූපසටහන්

අංක 2.5). ලැබූ ආදායම සැලකීමේ දී 2011 වසරේ දී රුපියල් මිලියන 1871ක් ලබා තිබූ අතර එම ප්‍රමාණය 2012 වසර වන විට රුපියල් මිලියන 1694 දක්වා 9.5% අඩුවී 2013 වසර වන විට 91% වැඩිවී ඇත ඇත (ප්‍රස්තාර අංක 2.5). සමස්තයක් ලෙස සැලකීමේ දී දැකිය හැක්කේ එළවළු අපනයනයේ ශීඝ්‍ර අඩුවීමක් නැවත සිදුවී වර්ධනයවීමකි.




| | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රමාණය (මෙ.ටොන්) | 12190 | 14071 | 11005 | 12487 | 19398 | 18670 | 20994 | 13446 | 10814 | 22737 |
| වටිනාකම (රු.මිලියන) | 964 | 1153 | 1005 | 1252 | 2717 | 1394 | 2645 | 1871 | 1694 | 3230 |

**මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ රේගු දෙපාර්තමේන්තුව 2013**

**ප්‍රස්තාර අංක 2.5: ශ්‍රී ලංකාවේ එළවළු අපනයන ප්‍රමාණය හා අපනයන වටිනාකම 1990-2013**

ලෝක වෙළඳපළ තුළ ශ්‍රී ලංකාවේ එළවළු අපනයන වෙළඳාමේ මෑතකාලීන තත්ත්වය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ප්‍රමිති මට්ටම්, ඉහළ මිල විචලතාව සහ ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, තායිලන්තය සහ චීනය සමඟ පවතින තරඟකාරීත්වය වැනි හේතු වේ. ලෝක වෙළඳපළ තුළ ඉන්දියාවේ සහ තායිලන්තයේ නිෂ්පාදන සුලභ වීම සඳහා හේතු වී ඇත්තේ තායිලන්ත බාත් සහ ඉන්දියානු රුපියල් අව ප්‍රමාණ වීම නිසා ලෝක වෙළඳපළ තුළ ඔවුන්ගේ නිෂ්පාදනවල මිල ගණන් අඩු වීමය. ඊට අමතරව, මෙම රටවල් කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා විශාල වශයෙන් ආයෝජනය කර තිබීම හේතුවෙන් වෙළඳපළ අවශ්‍යතාවන්ට ගැළපෙන ආකාරයට තත්ත්වයෙන් උසස් නිෂ්පාදන බිහි කිරීමට හැකි වී තිබේ.

## 2.5 එළවළු අපනයනයේ නිරතව සිටින සංවිධාන

විවිධ ස්වරූපයෙන් ශ්‍රී ලංකාවෙන් එළවළු අපනයනයේ නිරතව සිටින සංවිධාන රැසක් පවතී. මෙරට අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට ඒ අතරින් ප්‍රධාන ස්ථානයක් හිමිවෙයි. තවත් ප්‍රමුඛතම සංවිධාන වන්නේ පලතුරු සහ එළවළු අපනයන සැපයුම් දාමයට දායකවන සියලුම පාර්ශවකරුවන් සම්බන්ධ වී සිටින ශ්‍රී ලංකා පලතුරු සහ එළවළු නිෂ්පාදකයින්ගේ හා අපනයනකරුවන්ගේ සංගමය (LFVPPEA) සහ ශ්‍රී ලංකා *ජාතික* අපනයන වාණිජ මණ්ඩලයයි. මෙම සංවිධාන තුනෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ එහි සාමාජිකයින්ට එළවළු අපනයන ක්‍රියාවලිය සඳහා සහය වන පහසුකාරකයින් ලෙස කටයුතු කිරීමයි. ප්‍රධාන එළවළු අපනයන සමාගම් පිළිබඳ විස්තරයක් ඇමුණුම අංක 03හි දක්වා ඇත. වසර 25-30ත් අතර තරමේ දීර්ඝ කාලයක සිට එළවළු අපනයනය කරන සමාගම් පවතින අතර මෙම සමාගම් සඳහා එළවළු සැපයීම සිදු කරන විවිධ ආයතන රටාවන් පහත අයුරින් හඳුනා ගත හැක.

- තනි තනි ගොවීන් (කුඩා ගොවිපළ සහ ගෙවතු වගා හිමි ගොවීන්)
- පොකුරු සංවිධාන /වාණිජමය වශයෙන් වගා කරන්නන්
- කෘෂි කලාප ව්‍යාපෘති සහ ඒකාබද්ධ කෘෂිකාර්මික ව්‍යාපෘති
- ගම් මට්ටමින් පිහිටා ඇති එකතු කිරීමේ මධ්‍යස්ථාන
- පළාත් මට්ටමේ තොග අලෙවිසැල්

## 2.6 එළවළු අපනයන ක්ෂේත්‍රයේ වත්මන් ගැටලු

එළවළු අපනයන ක්ෂේත්‍රයට බාධා ඇති කරවන ගැටලු රැසක් පවතී. ඒ අතරින් ප්‍රධාන වන්නේ වර්ෂය පුරා ප්‍රමාණවත් සැපයුමක් නොතිබීම, එළවළු වගාව ප්‍රධාන වශයෙන් වර්ෂාපෝෂිත තත්ත්වයන් තුළ පවත්වා ගෙන යාම නිසා අඩු අස්වැන්නක් ලැබීම, පොහොර සහ පළිබෝධනාශක අවිධිමත් ලෙස භාවිතය හේතුවෙන් ඇතිවන ප්‍රමිතිය පිළිබඳ ගැටලු, ඉහළ අස්වැන්නක් ලැබෙන ප්‍රභේදවල හිඟය හා පසු අස්වනු කටයුතු සඳහා නව තාක්ෂණය අවම වීම, එළවළු ගබඩා කිරීමේ හා ප්‍රවාහනයේ දුර්වලතා යනාදියයි. ඊට අමතරව ගොවීන් සහ ප්‍රාග්ධනය ඉතා අවම මට්ටමක පවතින අතර යෙදවුම් සැපයීමේ යාන්ත්‍රණයේ ද දුර්වලතා පවතී. ව්‍යාප්ති සේවයේ දුර්වලතා සහ වෙළඳපළ තොරතුරුවල හිඟකම හේතුවෙන් පාරිභෝගික රුචි අරුචිකම් පිළිබඳ ගොවීන් දැනුවත් නැත.

කෘෂි කර්මාන්තය පදනම් කරගත් කර්මාන්තයන්හි ප්‍රමාණවත් පහසුකම් නොමැතිවීම ගැටලුවකි. බොහොමයක් බාධක සඳහා මූලිකවම හේතු වී ඇත්තේ එළවළු ගොවිතැන වාණිජකරණය නොවීමේ ඌනතාවයයි. කුඩා තනි පුද්ගල ගොවිපළවල් සම්බන්ධයෙන් දැකිය හැකි ලක්ෂණයක් නම් කන්නයකට පමණක් සීමා වීම සහ නවීන තාක්ෂණය භාවිතයේ ඇති අඩුවයි. මේ හේතුව නිසා වෙළඳපළට සපයන එළවළු ප්‍රමාණය කන්නයකට පමණක් සීමා වීමෙන් අවශ්‍ය අවස්ථාවන්හි එළවළු සැපයුම හිඟ වීම සඳහා බලපායි.

සෙමින් දියුණු වන දේශීය ප්‍රවාහන යටිතල පහසුකම් නිසා ද අපනයනකරුවෝ පසුබෑම්වලට මුහුණ දෙති. ඊට අමතරව අපනයනකරුවන්ට දරන්නට සිදුවන අන්තර්ජාතික ප්‍රවාහන වියදම ඉහළ යාමේ ගැටලුව ද පවතී. මෑත කාලයක සිට යුරෝපා සංගමයට අයත් රටවලට අපනයනය කරන සමහර නිෂ්පාදනවල ප්‍රමිතීන් පවත්වා ගෙන යාමට අපනයනකරුවන් අපොහොසත් වීම නිසා (පළිබෝධ සහ අනෙකුත් ප්‍රමිති තත්ත්වයන්) ද ගැටලු මතු වී තිබේ.

## 2.7 එළවළු අපනයනය සඳහා පවතින අනාගත විභවතා

සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් සඳහා එළවළුවල ඇති වැදගත්කම පිළිබඳව වර්ධනය වෙමින් පවතින අවධානය නිසා ලෝක වෙළඳාමෙහි එළවළු සඳහා වන සංයුතියෙහි හා ප්‍රමාණයෙහි ඉහළ යාමක් දක්නට තිබේ. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය විශාල වශයෙන් එළවළු නිෂ්පාදනය සඳහා යෝග්‍ය පසුබිමක් සකස් කර දී තිබේ. ඊට අමතරව විවිධ එළවළු විශේෂයන් නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකාවෙ පවතින නිවර්තන දේශගුණය සහ කාර්යක්ෂම හා පුහුණු ශ්‍රම බලකාය ඉතාමත් යෝග්‍ය වේ. ඇසුරුම්කරණයෙහි සහ ප්‍රමිතිය ඉහළ නැංවීමෙහිලා අපනයනකරුවන් පුහුණු කිරීම පිණිස වන රජයේ ප්‍රතිපත්ති සහ ආයෝජන, ශීතාගාර පහසුකම් ඇති කිරීම සහ තෝරාගත් නිෂ්පාදන අපනයන වෙළඳපොළ සඳහා විවිධාංගිකරණය කිරීම ශ්‍රී ලංකාවේ එළවළු අපනයනය සඳහා විභවතාවයක් ඇති කරවන සාධනීය කරුණු වේ.

ශ්‍රී ලංකාව සහ චීනය අතර නිදහස් වෙළඳ ගිවිසුම් අත්සන් කිරීම මඟින් ශ්‍රී ලාංකික අපයනයකරුවන්ට චීනයේ විශාල වෙළඳපොළ අවස්ථා විවර වේ. ඊට අමතරව දැනට ඉන්දියාව සමඟ වන නිදහස් වෙළඳ ගිවිසුම විස්තීර්ණ ආර්ථික සහයෝගීතා ගිවිසුමක් බවට වැඩි දියුණු කරමින් පවතී. ඉන්දියාවට එළවළු අපනයනය කිරීම සඳහා එය සහයක් වනු ඇත. ජපානය සහ අනෙකුත් රටවල් සමඟ තවත් වෙළඳ ගිවිසුම් අත්සන් කිරීමට අවස්ථා උදා කර ගැනීම මඟින් ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට වෙළඳපළ අවස්ථා වැඩි වශයෙන් උදා වනු ඇත.

2011 වසරේ ඇමරිකානු ඩොලර් මිලියන 36ක සිට 2012 වර්ෂයේ ඇමරිකානු ඩොලර් මිලියන 45ක් දක්වා වශයෙන් ශ්‍රී ලංකාවේ අපනයන වෙළඳාමෙහි ස්ථාවර වර්ධනයක් දැකිය හැකි අතර ශ්‍රී ලංකා පලතුරු සහ එළවළු නිෂ්පාදකයින්ගේ සහ අපනයනකරුවන්ගේ සංගමය 2015 දී එය ඇමරිකානු ඩොලර් මිලියන 88ක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කරයි. මෙම ක්ෂේත්‍රය සඳහා පවතින වත්මන් වර්ධන ප්‍රවණතාව දිගටම පැවතියහොත් 2015 වර්ෂයේ දී මෙම ක්ෂේත්‍රයේ 20%ක වර්ධනයක් අපේක්ෂා කළ හැකිවන බව එම සංගමය සඳහන් කරයි.

වෙළඳාම ගෝලීයකරණය වීම සහ ජනතාවගේ ඒක පුද්ගල ආදායම ඉහළ යාමෙන් ප්‍රමිතියෙන් උසස් එළවළු සහ පලතුරු සඳහා වන ඉල්ලුම ඉහළ යනු ඇත. වර්ෂය පුරාවට එළවළු වගා කිරීමට හැකිවීම සහ අඩු මිල ගණන් මෙන් ම වැඩි දියුණු කළ එළවළු පලතුරු ප්‍රභේද පැවතීම මගින් ලෝක වෙළඳපළට හිතකර අපනයනකරුවෙකු බවට පත්වීමේ හැකියාව ශ්‍රී ලංකාව සතුය.

# තෙවැනි පරිච්ඡේදය

# අපනයනය සඳහා එළවළු නිෂ්පාදනය: ප්‍රතිලාභ හා ගැටලු


## 3.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන කෘෂි අංශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ඒ මත යැපෙන ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා මං සැලසීම වැදගත් වේ. එම අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ගොවි ජනතාවගේ ආදායම ඉහළ නැංවීමට කටයුතු කළ යුතු අතර එළවළු අපනයන කර්මාන්තය නඟා සිටුවීම තුළින් ඒ සඳහා මං පෙත් විවර කළ හැකිය.

කෙසේ නමුත් අපනයනය සඳහා ඇණවුම්වලට සරිලන ප්‍රමාණවලින් හා නිසි ගුණාත්මයෙන් යුතුව කලට වේලාවට එළවළු සපයා ගැනීම අපනයනකරුවන් මුහුණපාන ප්‍රමුඛ ගැටලු අතර වේ. එම ගැටලු සහගත තත්ත්වයන් නිර්මාණය වන්නේ කෙසේද යන්න මෙන්ම ඒවා මඟ හරවා ගනිමින් අපනයන වෙළඳපළ සක්‍රිය කිරීමට එළඹිය යුතු ක්‍රියාදාමයන් කවරේ ද? යන්න පිළිබඳව වඩාත් පැහැදිලිව අවබෝධ කර ගතහැක්කේ අපනයනය සඳහා එළවළු නිෂ්පාදන ක්‍රියාදාමයේ නියැළෙන ගොවි ජනතාව සමඟ සිදු කරන සංවාදයක් තුළිනි. එබැවින් බදුල්ල, නුවරඑළිය හා මාතලේ යන දිස්ත්‍රික්කවලින් හඳුනාගත් අපනයනය සඳහා එළවළු වගා කරන ගොවීන් 91 දෙනෙකුගෙන් රැස් කර ගත් දත්ත පදනම් කර ගනිමින් ඔවුන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය, අපනයනය සඳහා එළවළු වගා කිරීමේ ක්‍රියාවලිය මෙන්ම ඔවුන් අත්කරගත් ප්‍රතිලාභ හා මුහුණපාන ගැටලු පිළිබඳව විග්‍රහයක් මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ.

## 3.2 එළවළු ගොවීන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය

අපනයනය සඳහා එළවළු වගා කරන ගොවීහු ආරක්ෂිත ගෘහ සහිත මෙන්ම, විවෘත වගා ක්ෂේත්‍රවලද එළවළු වගා කරති. ප්‍රස්තාර අංක 3.1 මඟින් වගා ක්‍රම අනුව අධ්‍යයන දිස්ත්‍රික්ක තුළ ගොවීන්ගේ ව්‍යාප්තිය ඉදිරිපත් කර ඇත. ඒ අනුව අපනයනය සඳහා එළවළු සපයන ගොවීන් අතරින් වැඩි ප්‍රතිශතයක් (63%) විවෘත වගා ක්ෂේත්‍ර තුළ එළවළු වගා කරන්නෝ වෙති. තව ද, බදුල්ල දිස්ත්‍රික්කයේ සියලුම ගොවීන්ට ආරක්ෂිත ගෘහ සතු වූ අතර මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්කවල බහුතරයක් ගොවීන් විවෘත වගා භූමිවල එළවළු වගා කර ඇත.




මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**ප්‍රස්තාර අංක 3.1: දිස්ත්‍රික්ක අනුව ප්‍රධාන වගා ක්‍රම දෙක අනුගමනය කරන ගොවීන්ගේ ව්‍යාප්තිය**

නියැදියට අයත් ගොවීහු තම නිෂ්පාදන සියල්ලම හෝ තෝරා ගත් කොටසක් පමණක් අපනයනය සඳහා සපයති. ගොවීන් විසින් නිපදවන එළවළු ප්‍රමාණයෙන් අපනයනය සඳහා සපයන එළවළු ප්‍රමාණය මත ගොවීන් ප්‍රධාන කාණ්ඩ දෙකකට වර්ගීකරණය කරන ලදී. කුමන වගා ක්‍රමයක් අනුගමනය කළද 42%ක් ගොවීන් සිය එළවළු අස්වැන්නෙන් 65%කට අධික ප්‍රමාණයක් අපනයනය සඳහා සපයා තිබූ අතර බහුතරය (58%) අපනයනය සඳහා සපයා ඇත්තේ තම නිෂ්පාදනවලින් 65%කට වඩා අඩු ප්‍රතිශතයකි. ඔවුන් අතරින් තම නිෂ්පාදනවලින් 50%කට වඩා අපනයනය සඳහා සපයා තිබූ ගොවි ප්‍රතිශතය 5%ක් පමණි. එබැවින් ඉහත පළමු ගොවි කණ්ඩායම අපනයන වෙළඳපළ ඉලක්ක කර ගත් එළවළු නිෂ්පාදකයන් ලෙස ද, දෙවන කණ්ඩායම දේශීය වෙළඳපළ ඉලක්ක කර ගත් ගොවීන් ලෙස ද මින් ඉදිරි සාකච්ඡාවල දී හඳුන්වනු ලැබේ.

**(අ) අපනයන වෙළඳපළ ඉලක්ක කර ගනිමින් එළවළු වගා කරන ගොවීන් :**

මෙම කණ්ඩායමට අයත් ගොවීන් සංඛ්‍යාව 38 (42%) කි. ඔවුන් අතරින් 68%ක් එනම් 26 දෙනෙක් ආරක්ෂිත ගෘහ සහිත ගොවීහු වන අතර අනෙකුත් ගොවීහු 32%ක් (එනම් 12 දෙනෙකු) විවෘත වගා භූමිවල එළවළු නිෂ්පාදනයේ නියැළෙති.

**(ආ) දේශීය වෙළඳපළ ඉලක්ක කර ගනිමින් එළවළු වගා කරන ගොවීන් :**

මෙම කාණ්ඩයට අයත් ගොවීන් සංඛ්‍යාව 53 (58%) කි. ඔවුන් අතරින් බහුතරය (45-85%) විවෘත වගා භූමිවල එළවළු වගා කරන අතර ඉතිරි සුළු සංඛ්‍යාව (8-15%) ආරක්ෂිත ගෘහ තුළ එළවළු වගා කරති.

මෙම දත්ත අනුව පැහැදිලි වන්නේ ආරක්ෂිත ගෘහ සහිත ගොවීන් අතර අපනයනය ඉලක්ක කර ගැනීමේ ඉහළ ප්‍රවණතාවක් පවතින බවයි. ගොවීන් ප්‍රධාන අනුගමනය කරන වගා ක්‍රමය හා අපනයනය සඳහා සපයන එළවළු ප්‍රමාණය අනුව අධ්‍යයන දිස්ත්‍රික්ක තුළ නියැදියට අයත් ගොවීන්ගේ ව්‍යාප්තිය වගු අංක 3.1න් ඉදිරිපත් කර ඇත.

**වගු අංක 3.1: වගා ක්‍රමය හා අපනයනය සඳහා සපයන එළවළු ප්‍රමාණය අනුව එළවළු ගොවීන් වර්ගීකරණය**

| වගා ක්‍රමය | ගොවීන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය | අස්වැන්නෙන් අපනයනය සඳහා භාවිතා කරන % | බදුල්ල | නුවරඑළිය | මාතලේ | සමස්තය |
|---|---|---|---|---|---|---|
| ආරක්ෂිත ගෘහ සහිත | 34 (37%) | 65% කට අඩු | 5 (17%) | 2 (9%) | 1 (2%) | 8 (9%) |
| | | 65% කට වැඩි | 24 (83%) | 1 (5%) | 1 (2%) | 26 (28%) |
| විවෘත ගොවිපළ භූමියේ | 57 (63%) | 65% කට අඩු | - | 7 (31%) | 38 (96%) | 45 (49%) |
| | | 65% කට වැඩි | - | 12 (55%) | - | 12 (14%) |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014.

මෙම දෙආකාරයටම එළවළු නිෂ්පාදනයේ නියැළෙන ගොවීන්ගේ සමාජ-ආර්ථික තොරතුරු (වගු අංක 3.2) විමසුමට ලක් කරන ලදී. එළවළු වගා කර අපනයනයට සැපයීමේ කාර්යයේ දි සමස්ත නියැදියේ පුරුෂ සහභාගිත්වය 96%කි. දිස්ත්‍රික්ක වශයෙන් සැලකීමේ දී පුරුෂ පක්ෂයේ දායකත්වය මාතලේ දිස්ත්‍රික්කයේ 100%ක්, බදුල්ල දිස්ත්‍රික්කයේ 90%ක් හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ 96%ක් ලෙසිනි. ඒ අනුව පෙනී යන්නේ කාන්තාවන් එළවළු අපනයන කර්මාන්තයට වැඩි වශයෙන් ආකර්ෂණය වී නැති බවයි.

සමස්ත නියැදියේ වයස් ව්‍යුහය පිළිබඳ සලකා බැලීමේ දී 54%ක ප්‍රතිශතයක් ගොවීහු වයස අවුරුදු 31-50 අතර පරාසයේ වූහ. මේ ප්‍රමාණයෙන් 29%ක්ම අවු. 31-40ක් අතර වූහ. වයස අවුරුදු 30ට අඩු ගොවීන් සංඛ්‍යාව 8%කි. එළවළු අපනයන කර්මාන්තය සඳහා තරුණ ගොවීන් නැඹුරුවීමේ යහපත් ප්‍රවණතාවයක් මෙම දත්තවලින් විද්‍යාමාන වේ. නියැදියට අයත්වූ ගොවීන්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳ විමසීමේ දී පැහැදිලි වන්නේ 38%ක් අ.පො.ස. (සා.පෙ) සමත් වූවන් බවය. එලෙසම ද්විතියික අධ්‍යාපනය ලද 33%ක පිරිසක් ද නියැදියට ඇතුළත්ය. සමස්තයක් ලෙස ගොවීන්ගෙන් බහුතරය ඉහළ අධ්‍යාපනයට යොමු වූ පිරිසක් වුවද අඩු අධ්‍යාපන මට්ටමක් සහිත ගොවි පිරිසක් ද (18%) ඒ අතර වෙති. මෙම ගොවීන් බොහොමයක් සම්ප්‍රදායික ලෙස කෘෂි කර්මාන්තයේ නියැළෙන අතර සැපයුම්කරුවන්ගේ මැදිහත්වීම තුළ තම නිෂ්පාදන අපනයන වෙළඳපළ වෙත යැවීමට අවස්ථාව සලසා ගෙන ඇත. ඉන් යම් පිරිසක් තම නිෂ්පාදන විදේශ වෙළඳපොළ තුළ අලෙවි වන බව පවා නොදනිති.

අධ්‍යයන ප්‍රදේශවල ජීවත් වන ගොවි පවුල් රාශියක් එළවළු වගාව තුළින් තම දිවිය සරු කර ගනු ලබන බව නියැදිය තුළින් තහවුරු වේ. තම ප්‍රධාන රැකියාව ලෙස ගොවිතැන සිදු කරන ගොවීන්ගේ ප්‍රතිශතය 92%ක් විය. දිස්ත්‍රික්ක අනුව එම ව්‍යාප්තිය බදුල්ල දිස්ත්‍රික්කයේ 79%ක් ද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ 91%ක් ද, මාතලේ දිස්ත්‍රික්කයේ 100%ක් ද විය. අනෙකුත් ගොවීන් අතිරේක ආදායම් මාර්ගයක් ලෙස ගොවිතැන තෝරා ගෙන ඇත.

භාවිතා කරන ශ්‍රම ප්‍රභවය අනුව එළවළු වගාවේ දළ ලාභය රඳා පවතී. වගාව සඳහා පවුල් ශ්‍රමය යොදා ගන්නේ නම් ඒ සඳහා වැටුප් නොගෙවන අතර එමඟින් දළ ලාභය ඉහළ නැංවේ. සමස්ත නියැදියේ 40% ක් පවුල්වල සාමාජිකත්වය පහක් හෝ පහකට වැඩි බව පැහැදිලි විය. එළවළු වගාව සඳහා අවශ්‍ය ශ්‍රමයෙන් වැඩි ප්‍රමාණයක් තම පවුල්වලින්ම ලබා ගන්නා බව ද වාර්තා වේ.

එළවළු ගොවීන්ගේ ආදායම් මාර්ග පිළිබඳ සැලකීමේ දී නියැදිය තුළ මාසික ආදායම රු.25,000/-ට වැඩි ආදායමක් ලබන ගොවීන්ගේ නියෝජනය 54%කි. ඔවුන් අතරින් රු.50,000/-කට ඉහළ ආදායමක් ලබා ගන්නා ප්‍රතිශතය 8%ක් වන අතර ඉන් පැහැදිලි වන්නේ එළවළු වගාව ඉහළ ආදායමක් උපයා දෙන බවයි. මෙම ගොවීන් අපනයනය සඳහා එළවළු සැපයීම පිළිබඳ දීර්ඝ පළපුරුද්දක් ලබා නොමැති බව දත්තවලින් පැහැදිලි වේ. අවුරුදු දහයකට අඩු පළපුරුද්ද ඇති ගොවි ප්‍රතිශතය 68%කි. මෙය දිස්ත්‍රික්ක වශයෙන් සැලකීමේ දී බදුල්ල 45%ක් ද, නුවරඑළිය 59%ක් ද මාතලේ 91%ක් ද විය. එළවළු අපනයනය සඳහා ගොවීන් යොමුවීම මෑතකාලීනව වර්ධනය වූ ප්‍රවණතාවක් බව ඉන් තහවුරු වේ. එනමුත් ඉතිරි ගොවීන් වසර 10 සිට 30කට වැඩි කාලයක් පුරා මෙම කාර්යයේ නියැළී තිබේ. නුවරඑළිය හා මාතලේ ආසන්නයේ ආර්ථික මධ්‍යස්ථාන පිහිටා තිබීම එළවළු අපනයන සැපයුම් ජාල අලුතින් ආරම්භවීමටත්, ශක්තිමත්ව පවත්වා ගැනීමටත් සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති බව ගොවි සමූහ සාකච්ඡාවල දී හෙළිදරව් විය.

**වගු අංක 3.2 : අපනයනය සඳහා එළවළු ව**

| |
|---|
| |
| **ගොවි කාණ්ඩය** |
| අපනයනය සඳහා වගා කරන |
| අපනයනයට හා දේශීය වෙළඳපොළට වගා ක |
| |
| ස්ත්‍රී |
| පුරුෂ |
| **වයස් කාණ්ඩය** |
| අවුරුදු 20 - 30 |
| අවුරුදු 31 - 40 |
| අවුරුදු 41 - 50 |
| අවුරුදු 51 - 60 |
| අවුරුදු 60 ට වැඩි |
| |
| පාසල් ගොස් නොමැති |
| ප්‍රාථමික අධ්‍යාපනය ලද (1-5) |
| ද්විතික අධ්‍යාපනය ලද (6-10) |
| සාමාන්‍ය පෙළ සමත් |
| උසස් පෙළ සමත්/ වෘත්තිය අධ්‍යාපනය ලද |
| උපාධිඅපේක්ෂක/උපාධිධාරී |
| **ප්‍රධාන රැකියාව** |
| අපනයනය සඳහා එළවළු වගා කරන |
| අපනයනයට හා දේශීය වෙළඳපොළට වගා ක |
| රජයේ හා පෞද්ගලික අංශයේ රැකියා |
| ස්වයං රැකියා හා ව්‍යාපාර |
| **පවුලේ සාමාජික සංඛ්‍යාව** |
| 2 |
| 3 |
| 4 |
| 5 |

## 3.3 අපනයනය සඳහා එළවළු නිපදවන්නන් තම නිෂ්පාදන බෙදාහරින ආකාරය

නියැදියට අයත්වූ ගොවීන් එළවළු නිෂ්පාදනය කරන ආකාරය, වගා කරන එළවළු වර්ග, ඒවා අපනයනය සඳහා සපයන ප්‍රමාණ මෙන්ම සිය නිෂ්පාදන බෙදාහරින ආකාරය අධ්‍යයන ප්‍රදේශ අනුව විචලනය වී ඇති බවට සාධක පැවතුණි. එබැවින් ඉහත කරුණු පිළිබඳව දිස්ත්‍රික්ක මට්ටමින් විග්‍රහ කරනු ලැබේ.

### 3.3.1 බදුල්ල දිස්ත්‍රික්කය

බදුල්ල දිස්ත්‍රික්කයෙන් නියැදියට අයත්වූ සියලුම ගොවීන්ට ආරක්ෂිත ගෘහ සතු වූ අතර ගොවීන් පිළිබඳ මූලික වර්ගීකරණයට අනුව ඔවුන්ගේ සාතිශය බහුතරයකගේ (24-83%) අපනයන දායකත්වය මුළු නිෂ්පාදනයෙන් 65%ක් ඉක්මවූ කාණ්ඩයට අයත් විය. එම ගොවීන් නිෂ්පාදනය කළ එළවළු වර්ග ප්‍රමාණ හා ඒවා අලෙවිය සඳහා බෙදාහරින ලද ආකාරය පිළිබඳ දත්ත වගු අංක 3.3න් ඉදිරිපත් කර ඇත.

**වගු අංක 3.3 : ආරක්ෂිත ගෘහ සහිත අපනයන දායකත්වය 65%ට වැඩි ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදා හැරීම - බදුල්ල දිස්ත්‍රික්කය**

| එළවළු වර්ගය | එළවළු නිෂ්පාදනය (කි.ග්‍රෑ) | ගොවි % | අපනයනය සඳහා සැපයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | | සුපිරි වෙළඳපළට සැපයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | | | (කි.ග්‍රෑ) | % | (කි.ග්‍රෑ) | % |
| ජපන් පිපිඤ්ඤා | 12650 | 54 | 12650 | 100 | - | - |
| අමුමිරිස් | 1300 | 08 | 1300 | 100 | - | - |
| තක්කාලි | 15350 | 58 | 15350 | 100 | - | - |
| බෙල්පෙපර් | 28560 | 96 | 28260 | 99 | 300 | 1 |
| මාළු මිරිස් | 300 | 04 | 300 | 100 | - | - |
| බෝංචි | 300 | 04 | 300 | 100 | - | - |
| ගෝවා | 300 | 04 | 300 | 100 | - | - |
| මුළු එකතුව | 58760 | - | 58460 | 99.5 | 300 | 0.5 |

**මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014.**

එම දත්තවලින් පැහැදිලි වන පරිදි තක්කාලි, බෙල්පෙපර් හා ජපන් පිපිඤ්ඤා යන බෝග වැඩි ගොවීන් සංඛ්‍යාවක් විසින් වැඩි වශයෙන් නිෂ්පාදනය කර අපනයනය සඳහා සපයා ඇති බව තහවුරු වේ. එම බෝග හැරුණු කොට ගොවීන් කිහිපදෙනෙකු විසින් අමුමිරිස්, මාළු මිරිස්, බෝංචි සහ තක්කාලි යනාදී බෝග අඩු වශයෙන් නිෂ්පාදනය කර අපනයනය සඳහා සපයා ඇත.

සමස්තයක් ලෙස ගත් කළ මෙම ගොවීන්ගේ අපනයන දායකත්වය එළවළු වර්ග අනුව 92% සිට 100% දක්වා විචලනය වී ඇති අතර සාමාන්‍යය අගය 99.5%කි. ඉතිරි සුළු ප්‍රමාණය සුපිරි වෙළඳපළට යොමු කර ඇත.

ආරක්ෂිත ගෘහ සතුවූ නමුත් බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කළ ඉතිරි ගොවීන් පස්දෙනා දේශීය වෙළඳපළ ඉලක්ක කර ගනිමින් අර්තාපල් වැනි බෝග විවෘත වගා භූමිවල වගා කර ඇත. ඔවුන් ආරක්ෂිත ගෘහ තුළ වගාකරන බෙල්පෙපර්, තක්කාලි හා ජපන් පිපිඤ්ඤා යන එළවළු වර්ගවලින් වැඩි ප්‍රමාණයක් අපනයනය සඳහා සපයා ඇත (වගු අංක 3.4). ඔවුන් විවෘත භූමිවල වගාකර බෝංචි, ගෝවා, අර්තාපල්, කැරට් හා බීට් යන එළවළු වර්ග දේශීය වෙළඳපළ වෙත පමණක් සපයා ඇත. එම ගොවීන් වගා කර ඇති ප්‍රමුඛ බෝග වර්ගවලින් වැඩි ප්‍රතිශතයක් (ජපන් පිපිඤ්ඤා-71%), තක්කාලි-(83%), බෙල්පෙපර්-(55%) අපනයනය සඳහා සපයා ඇතත් සමස්තයක් ලෙස ගත් කළ මෙම ගොවීන්ගේ මුළු නිෂ්පාදන ප්‍රමාණයෙන් අපනයන දායකත්වය 45%කි. සුපිරි වෙළඳපළ හා දේශීය වෙළඳපළ වෙත එළවළු සැපයීමේ දායකත්වය පිළිවෙළින් 16% හා 39%ක් වේ. මෙම දත්ත මගින් බදුල්ල දිස්ත්‍රික්කයේ අපනයනය සඳහා එළවළු වගා කරන ගොවීන්ගේ නිෂ්පාදන මෙන්ම එම නිෂ්පාදන බෙදාහැරීමේ රටාව පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලැබේ.

**වගු අංක 3.4: ආරක්ෂිත ගෘහ සහිත අපනයන දායකත්වය 65%ට අඩු ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදාහැරීම - බදුල්ල දිස්ත්‍රික්කය**

| එළවළු වර්ගය | එළවළු නිෂ්පාදනය (කි.ග්‍රෑ) | ගොවි % | අපනයනය සඳහා සැපයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | | සුපිරි වෙළඳපළට සැපයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | | දේශීය වෙළඳපළට සැපයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | (කි.ග්‍රෑ) | % | (කි.ග්‍රෑ) | % | (කි.ග්‍රෑ) | % |
| තක්කාලි | 2390 | 40 | 1990 | 83 | 400 | 17 | - | - |
| බෙල්පෙපර් | 5300 | 60 | 2900 | 55 | 1800 | 34 | 600 | 11 |
| ජපන් පිපිඤ්ඤා | 3100 | 60 | 2200 | 71 | 300 | 10 | 600 | 19 |
| බෝංචි | 1000 | 20 | - | - | - | - | 1000 | 100 |
| ගෝවා | 600 | 20 | - | - | - | - | 600 | 100 |
| අර්තාපල් | 2300 | 40 | - | - | - | - | 2300 | 100 |
| කැරට් | 500 | 20 | - | - | - | - | 500 | 100 |
| බීට් | 500 | 20 | - | - | - | - | 500 | 100 |
| මුළු එකතුව | 15690 | - | 7090 | 45 | 2500 | 16 | 6100 | 39 |

**මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014.**

### 3.3.2 නුවරඑළිය දිස්ත්‍රික්කය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවීහු එළවළු වර්ග 21ක් වගා කරමින් අධ්‍යයනය දිස්ත්‍රික්ක අතර එළවළු වගාව අතින් ඉහළම විවිධත්වයක් පෙන්නුම් කරති. ඔවුන් අනුගමනය කළ වගා ක්‍රමය හා අපනයන දායකත්වය අනුව ප්‍රධාන කාණ්ඩ හතරකට අයත් විය. බදුල්ල දිස්ත්‍රික්කයේ බහුතරයක් ගොවීන් ආරක්ෂිත ගෘහ සහිත එළවළු නිපදවමින් එම නිෂ්පාදනවලින් 65%කට අධික ප්‍රමාණයක් අපනයනය සඳහා සැපයුව ද නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් එවැනි ගොවීන් හමුවන්නේ එක් අයෙකු පමණි. ඔහු අපනයනය සඳහා එළවළු සැපයීම ප්‍රමුඛස්ථානයේ තබමින් රෝස්මරි සහ ඔරිගැනෝ යන බෝග අපනයනය උදෙසා පමණක් ම වගා කර ඇත. ඒ හැරුණු කොට බ්‍රොකෝලි ඇතුළු මිලෙන් අධික එළවළු වර්ග හා පාස්ලි, රෙඩ්කැබේජ් හා කොත්තමල්ලි යන බෝග වර්ග නිපදවා සුපිරි වෙළඳපළට සපයා ඇත. ඔහුගේ අපනයන දායකත්වය 76%කි. ඉතිරි නිෂ්පාදන සුපිරි වෙළඳපළ වෙත ලබා දේ (වගු අංක 3.5).

වගු අංක 3.5: ආරක්ෂිත ගෘහ සහිත එළවළු වගා කරන -අපනයන දායකත්වය 65% ට වැඩි ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදා හැරීම - නුවරඑළිය දිස්ත්‍රික්කය

| එළවළු වර්ගය | එළවළු නිෂ්පාදනය (කි.ග්‍රෑ) | ගොවි % | අපනයනය සඳහා සැපයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | | සුපිරි වෙළඳපළට සැපයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | | | (කි.ග්‍රෑ) | % | (කි.ග්‍රෑ) | % |
| රෝස්මරි | 20 | 100 | 20 | 100 | - | - |
| බ්‍රොකෝලි | 250 | 100 | 200 | 80 | 50 | 20 |
| කොත්තමල්ලි | 300 | 100 | 200 | 67 | 100 | 33 |
| රෙඩ්කැබේජ් | 300 | 100 | 200 | 67 | 100 | 33 |
| ඔරිගැනෝ | 20 | 100 | 20 | 100 | - | - |
| පාස්ලි | 1000 | 100 | 800 | 80 | 200 | 20 |
| මුළු එකතුව | 1890 | - | 1440 | 76 | 450 | 24 |

**මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014.**

නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් හමුවූ ගොවීන් බහුතරයක් (12-55%) ප්‍රධාන වශයෙන් විවෘත වගා භූමියේ එළවළු නිෂ්පාදනය කරන අතර ඔවුන් විසින් අපනයනය සඳහා සපයන එළවළු වර්ග 17ක් පිළිබඳව දත්ත වාර්තා කරන ලදී. වගු අංක 3.6 මගින් ඔවුන්ගේ නිෂ්පාදන, ඒවායේ අපනයන දායකත්වය හා එම නිෂ්පාදන බෙදා හරින ආකාරය පිළිබඳ දත්ත ඉදිරිපත් කර ඇත. සමස්තයක් ලෙස ඔවුන්ගේ අපනයන දායකත්වය 92% කි. ඉතිරිය සුපිරි වෙළඳපළ වෙත සපයා

ඇත. නිෂ්පාදන සියල්ල අපනයනය සඳහා හෝ සුපිරි වෙළඳපළ වෙත පමණක් සැපයීම මෙම ගොවීන්ගේ විශේෂත්වයකි. මෙම ගොවීන් අතරින් බහුතරයක් පාස්ලි, සලාද හා සුකිනි යන එළවළු වර්ග වගා කර ඇති බව දත්තවලින් තහවුරු වේ.

**වගු අංක 3.6 : ආරක්ෂිත ගෘහ රහිත අපනයන දායකත්වය 65% ට වැඩි ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදා හැරීම - නුවරඑළිය දිස්ත්‍රික්කය**

| එළවළු වර්ගය | එළවළු නිෂ්පාදනය (කි.ග්‍රෑ) | ගොවි % | අපනයනය සඳහා සැපයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | | සුපිරි වෙළඳපළට සැපයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | | | (කි.ග්‍රෑ) | % | (කි.ග්‍රෑ) | % |
| මාළු මිරිස් | 300 | 08 | 50 | 17 | 250 | 83 |
| කොත්තමල්ලි | 1185 | 25 | 785 | 66 | 400 | 34 |
| පාස්ලි | 3150 | 50 | 2550 | 81 | 600 | 19 |
| බීට් | 3000 | 17 | 3000 | 100 | - | - |
| චයිනීස් ගෝවා | 3850 | 23 | 3850 | 100 | - | - |
| බෲකෝලි | 1400 | 25 | 1400 | 100 | - | - |
| අර්තාපල් | 6500 | 08 | 6500 | 100 | - | - |
| සලාද | 4920 | 42 | 4370 | 89 | 550 | 11 |
| අයිස්බර්ග් | 325 | 16 | 215 | 66 | 110 | 34 |
| ලීක්ස් | 8000 | 16 | 7000 | 88 | 1000 | 12 |
| කැරට් | 3000 | 16 | 2000 | 67 | 1000 | 33 |
| සුකිනි | 2770 | 42 | .2770 | 100 | - | - |
| සැල්දරි | 1000 | 08 | 1000 | 100 | - | - |
| ගෝවා | 8500 | 17 | 8500 | 100 | - | - |
| බෝංචි | 200 | 08 | 50 | 25 | 150 | 75 |
| නෝකෝල් | 1000 | 08 | 1000 | 100 | - | - |
| රෙඩ්කැබේජ් | 550 | 08 | 550 | 100 | - | - |
| මුළු එකතුව | 49650 | - | 45590 | 92 | 4060 | 8 |

**මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014.**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ආරක්ෂිත ගෘහ රහිත අපනයන දායකත්වය 65%ට අඩු ගොවීන් සංඛ්‍යාව 7 (31%) කි. ඔවුහු ගෝවා, කැරට්, අර්තාපල්, ලීක්ස්, සලාද වැනි බෝග වර්ග විවෘත භූමිය තුළ බහුල වශයෙන් වගා කරන අතර ඉන් වැඩි ප්‍රමාණයක් දේශීය වෙළඳපළ වෙත යොමු කරති. ලීක්ස්, බෲකෝලි වැනි එළවළු වර්ග සුපිරි වෙළඳපළ වෙත ද යොමු කරති. අර්තාපල් හා බීට් හැර අනෙකුත් සියලුම බෝග අපනයනය සඳහා සපයනු ලැබේ. සුකිනි, සලාද, රෙඩ් කැබේජ්, චයිනීස් ගෝවා හා පාස්ලි යන බෝගවලින් වැඩි ප්‍රමාණයක් ද අනෙකුත් බෝග සුළු වශයෙන් ද අපනයනය සඳහා සපයා ඇත. ඒ අනුව ඔවුන්ගේ සමස්ත අපනයනය දායකත්වය 18%කි. සුපිරි වෙළඳපළ සඳහා දායකත්වය 7%කි. ඔවුන්ගේ මුඛ්‍ය පරමාර්ථය දේශීය වෙළඳපළ වෙත එළවළු සැපයීම වේ. ඊට දායකත්වය 74% කි (වගු අංක 3.7).

**වගු අංක 3.7 : ආරක්ෂිත ගෘහ රහිත අපනයන දායකත්වය 65% ට අඩු ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදා හැරීම - නුවරඑළිය දිස්ත්‍රික්කය**

| එළවළු වර්ගය | එළවළු නිෂ්පාදනය | ගොවි % | අපනයනය සඳහා සැපයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | | සුපිරි වෙළඳපළට සැපයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | | දේශීය වෙළඳපළට සපැයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|
| | (කි.ග්‍රෑ) | | (කි.ග්‍රෑ) | % | (කි.ග්‍රෑ) | % | (කි.ග්‍රෑ) | % |
| ලීක්ස් | 13400 | 57 | 2450 | 18 | 4000 | 30 | 6950 | 52 |
| සුකිනි | 2050 | 43 | 1675 | 82 | - | - | 375 | 18 |
| චයිනීස් ගෝවා | 2500 | 71 | 1350 | 54 | - | - | 1150 | 46 |
| බෲකෝලි | 700 | 14 | 400 | 57 | 70 | 10 | 230 | 33 |
| සලාද | 6000 | 57 | 3650 | 60 | - | - | 2350 | 40 |
| රෙඩ්කැබේජ් | 150 | 14 | 150 | 100 | - | - | - | - |
| පාස්ලි | 10 | 14 | 10 | 100 | - | - | - | - |
| කැරට් | 5400 | 43 | 150 | 03 | - | - | 5250 | 97 |
| අර්තාපල් | 10000 | 57 | - | - | - | - | 10000 | 100 |
| පච්චෝයි | 200 | 14 | 50 | 25 | - | - | 150 | 75 |
| ගෝවා | 16000 | 100 | 200 | 01 | - | - | 15800 | 99 |
| බීට් | 500 | 57 | - | - | - | - | 500 | 100 |
| ලෝන්ග් රැඩිෂ් | 200 | 57 | 50 | 03 | - | - | 150 | 97 |
| මුළු එකතුව | 57110 | . | 10135 | 18 | 4070 | 7 | 42905 | 74 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014.

නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් හමුවන තවත් ගොවීන් දෙදෙනෙකු (9%) ගෝවා, අර්තාපල් හා කැරට් යන එළවළු විශාල ලෙස විවෘත ක්ෂේත්‍රවල වගා කරන අතරම, බ්‍රොකෝලි, අයිස්බර්ග්, පාස්ලි, චයිනීස් ගෝවා හා සුකිනි වැනි බෝග වර්ග ද විවෘත වගා භූමිවල වගා කිරීමට උත්සාහ දරා ඇත. එම බෝගවල අස්වැන්නෙන් වැඩි ප්‍රතිශතයක් අපනයනය සඳහා හෝ සුපිරි වෙළඳපළ වෙත සපයන අතර විවෘත වගා ක්ෂේත්‍රවල අස්වැන්න දේශීය වෙළඳපළ වෙත සපයති. කෙසේ නමුත් මෙම ගොවි කාණ්ඩයේ ද මුඛ්‍ය පරමාර්ථය අපනයන වෙළඳපළ සඳහා එළවළු නිපදවීම වන අතර ඒ සඳහා ඔවුන්ගේ දායකත්වය 49%කි. සුපිරි හා දේශීය වෙළඳපළ වෙත දායකත්වය පිළිවෙළින් 8%ක් හා 43%ක් වේ (වගු අංක 3.8).

**වගු අංක 3.8 : ආරක්ෂිත ගෘහ සහිත අපනයන දායකත්වය 65%ට අඩු ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදා හැරීම - නුවරඑළිය දිස්ත්‍රික්කය**

| එළවළු වර්ගය | එළවළු නිෂ්පාදනය | ගොවි % | අපනයනය සඳහා සැපයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | | සුපිරි වෙළඳපළට සැපයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | | දේශීය වෙළඳපළට සපැයූ ප්‍රමාණය හා ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|
| | (කි.ග්‍රෑ) | | (කි.ග්‍රෑ) | % | (කි.ග්‍රෑ) | % | (කි.ග්‍රෑ) | % |
| බ්‍රොකෝලි | 2000 | 50 | 1000 | 50 | 1000 | 50 | - | |
| අයිස්බර්ග් | 350 | 50 | 350 | 100 | - | - | - | |
| පාස්ලි | 200 | 50 | 175 | 88 | - | - | 25 | 12 |
| චයිනීස් ගෝවා | 700 | 50 | 700 | 100 | - | - | - | - |
| සුකිනි | 250 | 50 | 250 | 100 | - | - | - | - |
| අර්තාපල් | 2300 | 50 | 1500 | 65 | - | - | 800 | 35 |
| කැරට් | 2100 | 50 | 800 | 38 | - | - | 1300 | 62 |
| ගෝවා | 5000 | 50 | 1500 | 30 | - | - | 3500 | 70 |
| මුළු එකතුව | 12900 | - | 6275 | 49 | 1000 | 8 | 5625 | 43 |

**මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014**

### 3.3.3 මාතලේ දිස්ත්‍රික්කය

මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කළ ගොවීන් අතරින් සාතිශය බහුතරය (38-96%) දේශීය වෙළඳපළ ඉලක්ක කර ගනිමින් විවෘත භූමියේ වගා කරන ගොවීන්ය. ඔවුන් වගා කළ බෝග වර්ග 16ක් පිළිබඳ දත්ත ලබාගත් අතර (වගු අංක 3.9) පතෝල, කරවිල, වැටකොළු, මෑ කරල්, මුරුංගා, මාළු මිරිස්, කැකිරි, අමුමිරිස් හා දඹල ඔවුන් වැඩිපුරම වගා කරන බෝග අතර වේ. එම ගොවීන්ගේ අපනයන දායකත්වය 22%කට ආසන්න වේ. දේශීය වෙළඳපළ දායකත්වය 78%කට

ආසන්නය. සුපිරි වෙළඳපළ වෙත එළවළු සැපයුම නොගිනිය යුතු තරම්ය. එක් ගොවි මහතෙක් පමණක් පතෝල, වැටකොළු, මාළුමිරිස් හා අමු මිරිස් යන එළවළු වර්ග සුළු වශයෙන් සැපයීම සඳහා සුපිරි වෙළඳපොළ සමඟ සබඳතා පවත්වා ගෙන ඇත. ලෝකයේ බොහෝ රටවල් වෙත ශ්‍රී ලංකාවේ එළවළු අපනයනය කරනු ලබන අතර ශ්‍රී ලාංකිකයන් බහුලව වාසය කරන විදේශ රටවල් වෙත මෙම පහත රට එළවළු වර්ග අපනයනය කරනු ලැබේ.

**වගු අංක 3.9 : ආරක්ෂිත ගෘහ රහිත අපනයනය දායකත්වය 65% අඩු ගොවීන්ගේ නිෂ්පාදන හා ඒවා බෙදා හැරීම - මාතලේ දිස්ත්‍රික්කය**

| එළවළු වර්ගය | එළවළු නිෂ්පාදනය | ගොවි | අපනයනය කළ එළවළු ප්‍රමාණය | | දේශීය වෙළඳපළට අලෙවි කළ ප්‍රමාණය | | සුපිරි වෙළඳපළට අලෙවි කළ ප්‍රමාණය | |
|---|---|---|---|---|---|---|---|---|
| | (කි.ග්‍රෑ.) | % | කි.ග්‍රෑ. | ප්‍රතිශතය | කි.ග්‍රෑ. | ප්‍රතිශතය | කි.ග්‍රෑ | ප්‍රතිශතය |
| පතෝල | 71870 | 55 | 15090 | 20.7 | 56580 | 79 | 200 | 0.3 |
| කරවිල | 53700 | 37 | 9070 | 17.0 | 44630 | 83 | - | - |
| වැටකොළු | 49770 | 50 | 12160 | 24.4 | 37410 | 75 | 200 | 0.6 |
| මැකරල් | 36320 | 34 | 9440 | 26.0 | 26880 | 74 | - | - |
| මුරුංගා | 30800 | 08 | 2800 | 9.0 | 28000 | 91 | - | - |
| මාළුමිරිස් | 23300 | 24 | 6700 | 28.8 | 16400 | 70 | 200 | 1.2 |
| කැකිරි | 16600 | 13 | 5250 | 32.0 | 11350 | 68 | - | - |
| අමු මිරිස් | 14300 | 16 | 4050 | 28.3 | 10050 | 70 | 200 | 1.7 |
| දඹල | 10500 | 11 | 2300 | 22.0 | 8200 | 78 | - | - |
| තක්කාලි | 6000 | 05 | 1100 | 18.0 | 4900 | 82 | - | - |
| බණ්ඩක්කා | 4950 | 03 | 1000 | 20.0 | 3950 | 80 | - | - |
| බීලූනු | 3000 | 03 | 1000 | 33.0 | 2000 | 67 | - | - |
| පිපිඤ්ඤා | 600 | 03 | 150 | 25.0 | 450 | 75 | - | - |
| වම්බටු | 600 | 03 | 200 | 33.0 | 400 | 67 | - | - |
| ගෝවා | 600 | 03 | 200 | 33.0 | 400 | 67 | - | - |
| බෝංචි | 600 | 03 | 150 | 25.0 | 450 | 75 | - | - |
| මුළු එකතුව | 323510 | - | 70660 | 21.8 | 252050 | 77.9 | 800 | 0.3 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

## 3.4 ගොවීන් විසින් අපනයනය සඳහා එළවළු සැපයීම

අපනයනය සඳහා එළවළු සපයන ආකාරය අනුව ගොවීන් කාණ්ඩ දෙකක් හඳුනා ගැනීමට හැකි විය. එනම්, සෘජුවම අපනයනකරුට එළවළු සපයන ගොවීන් (9%) හා සැපයුම්කරුවෙකු හරහා

අපනයනකරුට එළවළු සපයන ගොවීන් (91%) ලෙස ය (වගු අංක 3.10). මේ අනුව එළවළු අපනයන කර්මාන්තය තුළ සැපයුම්කරුවන්ගේ කාර්යභාරය වැදගත් තැනක් හිමි කර ගෙන ඇත.

**වගු අංක 3.10 : අපනයනය සඳහා එළවළු සපයන ආකාරය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය**

| | බදුල්ල | | නුවරඑළිය | | මාතලේ | | මුළු | |
|---|---|---|---|---|---|---|---|---|
| | | % | | % | | % | | % |
| සෘජුවම අපනයනකරුට එළවළු සැපයීම | 2 | 7 | 01 | 5 | 05 | 12 | 08 | 9 |
| සැපයුම්කරු හරහා අපනයනකරුට එළවළු සැපයීම | 27 | 93 | 21 | 95 | 35 | 88 | 83 | 91 |
| මුළු එකතුව | 29 | 100 | 22 | 100 | 40 | 100 | 91 | 100 |

**මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014**

බොහෝ අවස්ථාවල දී ගොවීන් අපනයනකරුවෙකු වෙත එළවළු සැපයීම එක් සැපයුම්කරුවෙකු හරහා පමණක් සිදු කරන නමුත් සැපයුම්කරුවන් කීපදෙනෙකු මැදිහත් වන අවස්ථා ද දක්නට ලැබුණි. මෙම අතරමැදි සැපයුම්කරුවන් ගොවීන්ගෙන් එළවළු මිලදී ගෙන අපනයනකරු හා සෘජු සබඳතා පවත්වන සැපයුම්කරුට ලබා දෙන අතර ඔහු විසින් අපනයනකරුට එළවළු සපයනු ලැබේ.

නියැදියට ඇතුළත් වූ ගොවීන් අපනයනය පිණිස එළවළු සැපයීම සඳහා යොමුවීම විවිධ අයුරින් සිදුවී තිබුණි. තමන් හඳුනන ගොවියෙකු විසින් අපනයන සැපයුම්කරු හඳුන්වා දීම මත සමස්ත නියැදියේ 40%ක් මේ කාර්යයට යොමු වී ඇත (වගු අංක 3.11). ගොවීන් තමන් ලද ඇණවුම් සම්පූර්ණ කිරීමට තම නිෂ්පාදන ප්‍රමාණවත් නොවූ විට වෙනත් ගොවියෙකුගේ එළවළු ලබා ගන්නා අතර ඒ අනුව සැපයුම්කරු හා ගොවීන් අතර සබඳතා තවදුරටත් තහවුරු වීමෙන් මෙසේ සිදුවේ.

වගු අංක 3.11 : එළවළු අපනයන කර්මාන්තයට යොමුවූ ආකාරය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය

| ගොවීන් එළවළු අපනයන කර්මාන්තයට යොමුවූ ආකාරය | බදුල්ල | | නුවරඑළිය | | මාතලේ | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | % |
| වෙනත් ගොවීන් මගින් සැපයුම්කරු හඳුනා ගැනීම | 06 | 21 | 15 | 68 | 15 | 37 | 36(40%) |
| සැපයුම්කරුවන්/අපනයන කරුවන් මගින් දැනුවත් වීම | 08 | 28 | 07 | 32 | 25 | 63 | 40(44%) |
| එළවළු අපනයනකරුවන්ගේ සමිති හරහා දැනුවත්වීම | 15 | 51 | - | - | - | - | 15(16%) |
| මුළු එකතුව | 29 | 100 | 22 | 100 | 40 | 100 | 91(100%) |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

බොහෝවිට සැපයුම්කරුවන් හෝ අපනයනකරුවන් විසින් මේ කාර්යයට යොමුවීම සඳහා ගොවීන් දැනුවත් කර ඇති අතර ඒ අනුව 44%ක ප්‍රතිශතයක් මේ කර්මාන්තයට යොමු වී ඇත. බදුල්ල දිස්ත්‍රික්කයෙන් එළවළු සැපයුම්කරුවන්ගේ සමිතිය මගින් පමණක් ගොවීන් දැනුවත් කර මේ කාර්යයට යොමු කළ ගොවි ප්‍රතිශතය 51%කි.

### 3.4.1 සැපයුම්කරු හරහා අපනයනකරු වෙත එළවළු සැපයුම

බදුල්ල දිස්ත්‍රික්කයේ සියලුම ගොවීන් අපනයන සැපයුම්කරුවෙකු වෙත සිය නිෂ්පාදන ලබා දී තිබුණි. එම සැපයුම්කරු ඌව පරණගම හරිතාගාර පොදු අපනයන සමාගම නම් සංවිධානයකි. මෙම සමාගම 2003 වසරේ ආරම්භ වී ඇත. ඒ සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය මූල්වී කටයුතු කර ඇත. ආරම්භයේ දී ගොවීන් 600කට හරිතාගාර වගාව සම්බන්ධයෙන් බිඳුණුවැව කෘෂි පර්යේෂණ ආයතනයේ පුහුණුව ලබා දී ඇත. මෙම ගොවීන් සියලු දෙනාටම හරිතාගාර ඉදි කිරීම සඳහා ආධාර ලබා දෙන බව සඳහන් වුවද ආරම්භයේ දී ගොවීන් 100 දෙනෙකුට ඉන්දියන් ආධාර යටතේ හරිතාගාර 100ක් ලබාදී ඇත. තවද එක් අයෙකුට ගෙවීමේ පදනම මත රුපියල් ලක්ෂ දෙකහමාරක ද්‍රව්‍යමය ආධාර ලබා දී ඇත.

ආරම්භයේදී හරිතාගාරවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා තාක්ෂණ නිලධාරීන් හයදෙනෙකු, කළමනාකරුවෙකු, ලිපිකරුවන් දෙදෙනෙකු හා ගණකාධිකාරීවරයෙකු සේවයට බඳවා ගෙන එම

ගොවීන් සියදෙනාගේම එළවළු නිෂ්පාදන මිලදී ගෙන අපනයනයට යොමු කර ඇත. ප්‍රධාන බෝග අතර තක්කාලි, බෙල්පෙපර්, බටු, මාළුමිරිස් විය. මෙම ආයතනය මගින් වාරික ගෙවීමේ පදනම යටතේ ගොවීන්ට බීජ, පොහොර හා ජල ටැංකි ලබාදී ඇත. පසුව පැවති රජය වෙනස්වීමත් සමඟ සියලු ආධාර ක්‍රම නතර වී අපනයන සංවර්ධන මණ්ඩලය මේ කාර්යයෙන් ඉවත් වී ඇත.

වර්තමානයේ ගොවීන් විසින් පස් දෙනෙකුගෙන් යුතු අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ගෙන හරිතාගාර නිෂ්පාදන පමණක් මිලදී ගැනීම සිදු කරයි. මෙම ආයතනය හරිතාගාරවල නිෂ්පාදනය කරන සියලුම නිෂ්පාදන මිලදී ගනු ලැබේ. මේ අනුව හරිතාගාර ගොවීන්ට තම සියලු නිෂ්පාදන අලෙවි කර ගැනීමේ හැකියාව ලැබී ඇත. සමාගම විසින් මිලදී ගැනීමට කැමති එළවළු වර්ග පිළිබඳව ගොවීන් දැනුවත් කර ඇති අතර ගොවීන් තම නිෂ්පාදන ප්ලාස්ටික් බහාලුම් භාවිතයෙන් ප්‍රවේශම් සහිතව ප්‍රවාහනය කරන බව නිරීක්ෂණය කළ හැකි විය. මෙම ආයතනයට අපනයන ඇණවුම් නොමැති අවස්ථාවලදී පවා ගොවීන්ගෙන් ලැබෙන සියලු නිෂ්පාදන මිලදී ගනු ලබන්නේ ගොවියා වෙනත් වෙළඳපළක් වෙත ඇදී යාම වැළැක්වීමේ අභිප්‍රායෙනි. මැනිං වෙළඳපළ හා සුපිරි වෙළඳසැල් ඊට නිදසුන්ය. ගොවියාට ලබා දුන් මිල සමහර අවස්ථාවලදී අපනයනකරුගෙන් නොලැබී යන අවස්ථා ද පවතින බව සඳහන් විය. ඕනෑම ප්‍රමාණයේ ඇණවුමක් සැපයීමේ හැකියාව සහිත මෙම ආයතනයට පවතින ඇණවුම් ප්‍රමාණවත් නොවේ.

මෙම ආයතන කළමනාකරු මඟින් ව්‍යාප්ති සේවය ලබා දේ. බිඳුණු වැව කෘෂි මධ්‍යස්ථානයේ පුහුණුව ලබා ඇති ඔහු නිරතුරු ගොවීන් හා සම්බන්ධ වී සිටී. මේ නිසා ගොවීන් හා සමාගම අතර දැඩි සම්බන්ධයක් ගොඩ නැගී ඇත. ඉහළ අස්වනු ලබා දෙන බීජ නොමැතිකම හා බීජ සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදුවීම හරිතාගාර එළවළු නිෂ්පාදනය ආශ්‍රිත ගැටලු වශයෙන් සඳහන් විය. මෙම සමාගමෙන් ඉවත් වූ කළමනාකරුවකු විසින් ද එළවළු සැපයුම සිදුකරන අතර ගොවීන්ගේ එළවළු සඳහා සමාගමට සාපේක්ෂව ඉහල මිලක් ඔහු ලබා දේ. නමුත් අපනයන සමාගමට මධ්‍යස්ථානය සඳහා වැයවන කුලිය, සේවක වැටුප්, විදුලි බිල්, ජල බිල් හා වෙනත් වියදම් ද පියවා ගැනීමට සිදුවී ඇති නිසා නිෂ්පාදකයාට වැඩි මිලක් ලබා දීම අපහසු වී ඇත.

නුවරඑළිය හා මාතලේ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන සැපයුම්කරුවන් කීපදෙනෙක් ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයන් හරහා හඳුනාගත් ගොවීන් සමඟ සබඳතා ගොඩ නඟාගෙන ඇත.

සැපයුම්කරුවන් ඇණවුමක් ලද වහාම තමන් සබඳතා පවත්වනු ලබන ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයෝ සමඟ එම ඇණවුම සපුරාලීම සඳහා අවශ්‍ය එළවළු ලබාගත හැකි නිෂ්පාදකයන් පිළිබඳව සාකච්ඡා කර එළවළු සපයා ගැනීම සඳහා පියවර ගනිති.

මාතලේ දිස්ත්‍රික්කයේ එලෙස හඳුනාගත් ගොවීන්ගේ ගොවිපළවලදී නියමිත ප්‍රමිතියෙන් යුත් නිෂ්පාදන තෝරා ගනු ලැබේ. එම ගොවීහු ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයන්ට එළවළු සපයන නිත්‍ය සැපයුම්කරුවෝ වෙති. සැපයුම්කරු පැමිණ ගොවියාගෙන් එළවළු තෝරා ගනු ලැබුවද මූල්‍ය ගනුදෙනු සිදු වන්නේ අදාළ ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයන් හරහාය. මෙහිදී සුපුරුදු පරිදි එළවළුවල වටිනාකමට අදාළ කොමිස් මුදල ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයා අය කර ගනියි. සැපයුම්කරු හා ගොවියා අතර සෘජු මූල්‍ය ගනුදෙනුවක් සිදු නොවීම මෙහිදී විශේෂත්වයකි. තම නිෂ්පාදනවලින් අපනයනය සඳහා වෙන්කරන කොටස හැරුණු කොට ඉතිරිය අලෙවිය සඳහා ආර්ථික මධ්‍යස්ථානයේ අදාළ වෙළඳසැලට යොමු කරන බැවින් ගොවීහු එම ව්‍යාපාරිකයා හරහා කෙරෙන මෙම අපනයන කටයුත්තට කැමැත්තෙන් හෝ අකමැත්තෙන් එකඟ වෙති. ඒ සඳහා අකමැත්තක් දක්වන පිරිසගේ අදහස වූයේ අපනයනකරු හොඳම කොටස තෝරා ගත් පසු ඉතිරිය සඳහා ඉතා අඩු මිලක් නියමවීම තුළ නිෂ්පාදකයාට ඉහළ ආදායමක් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වන බවයි.

මෙම ක්‍රමයේ දී ගොවියාට ලැබෙන මිල ආර්ථික මධ්‍යස්ථානයේ තොග මිලට සාපේක්ෂව තීරණය වේ. ඒ අනුව ගොවියාට ලැබෙන මිල පිළිබඳව තීරකයා වන්නේ ආර්ථික මධ්‍යස්ථානයේ තොග මිලය. එනම් දේශීය වෙළඳපළ මිල ඉහළ පහළ යන ස්වරූපය අනුව අපනයනය සඳහා සපයනු ලබන එළවළු මිල ද වෙනස් වේ. අපනයනය සඳහා එළවළු ගැණුම් මිල පරාසය හැමවිටම ආර්ථික මධ්‍යස්ථානයේ මිලට වඩා ඉහළ අගයක් ගනී. එනමුත් අපනයන මිළ ඉහළ යාමේ ප්‍රතිලාභය නිෂ්පාදකයාට සෘජුව හිමි නොවේ.

දඹුල්ල ප්‍රදේශයේ දේශීය එළවළු වෙළඳපොළ සමඟ බැඳී ඇති දැඩි ඒකාධිකාරී බලය, එළවළු අපනයන වෙළඳපොළ කෙරෙහි ද බලපෑමක් සිදු කර ඇති බව නිරීක්ෂණය කරන ලදී. එළවළු අපනයනය සිදු කරන කිසිදු ආයතනයකට/සැපයුම්කරුවෙකුට දඹුල්ලට පැමිණ සෘජුවම එළවළු මිල දී ගත නොහැක. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ එළවළු ව්‍යාපාරිකයෙකු හරහා මෙම කර්තව්‍යයට පිවිසිය යුතුමය. අපනයනය සිදු කරන ආයතනය/සැපයුම්කරු අදාළ ව්‍යාපාරිකයා විසින් හඳුන්වා දෙන ලද ගොවීන්ගෙන් එළවළු මිලදී ගැනීම සිදු කළ යුතුය. සැපයුම්කරු සහ ගොවීන් අතර කිසිදු මූල්‍යමය ගනුදෙනුවක් සිදු නොවන අතර ගොවියාට ලබා දෙන්නේ තෝරා

ගත් එළවළු ප්‍රමාණයට අදාළ බිල්පතක් පමණි. ඔහු එම බිල්පත ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයා වෙතින් මුදල් බවට පත් කර ගත් පසු ගනුදෙනුව අවසන් වේ.

මෙම ව්‍යාපාරය මේ ආකාරයට සිදුවීමට බලපාන ප්‍රධාන හේතුවක් වනුයේ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය හා බැඳී පවතින ණය චක්‍රයයි. මෙම ප්‍රදේශයේ බොහෝ ගොවීහු වගා කටයුතු සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය, කෘෂි රසායනික ද්‍රව්‍ය හෝ වෙනත් මූල්‍යමය අවශ්‍යතා ණය පදනම මත ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයෙකුගෙන් ලබා ගනිති. එවිට ණය ආපසු ගෙවීම සඳහා එම ව්‍යාපාරිකයා වෙතම තම නිෂ්පාදන අලෙවි කිරීමට ගොවීහු බැඳී සිටිති.

නිෂ්පාදන මිලදී ගැනීමේ දී ගොවියා ලබා ගත් ණය මුදල් එළවළු සඳහා ගෙවිය යුතු මුදලින් අඩු කරමින් ගනුදෙනුව සම්පූර්ණ කරයි. මේ හේතුවෙන් පිටතින් පැමිණෙන අපනයනකරුට /සැපයුම්කරුට තම නිෂ්පාදන අලෙවි කිරීමට ගොවීන්ට හැකියාවක් නැත. ගොවීන් තම නිෂ්පාදන ආගන්තුක ගැණුම්කරුවන්ට අලෙවි කිරීම මගින් ආර්ථික මධ්‍යස්ථානයේ අලෙවිසැල් හිමියන් සමඟ පවත්නා සබඳතාවය පලුදු වේ. විටෙක ඒවා බහින් බස්වීම්වල සිට පහරදීම් දක්වා තීව්‍ර වන අතර තවත් විටෙක ගොවීන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම දක්වා වර්ධනය වේ. තවද ආගන්තුක ගැණුම්කරුවන් ගොවීන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම ද ඔවුහු පාලනයට ලක් කරති. සෘජු බලපෑම් කරති. විශේෂයෙන්ම ගොවීන්ට ගෙවන මිල පිළිබඳ සැලකිලිමත් වෙති.

එමෙන්ම මෙම ප්‍රදේශවල ගොවීහු තම සුභසාධන අවශ්‍යතා සපුරා ගැනීමට ව්‍යාපාරික සම්බන්ධතා භාවිතා කරති. තම සමාජ සංස්කෘතික උත්සව (දානමාන, මංගල්‍ය, අවමංගල්‍ය) සඳහා අවශ්‍ය මූල්‍ය, භෞතික හා මානව සම්පත් මෙම ව්‍යාපාරිකයන් හරහා ලබා ගනිති. මෙම සමාජ, සංස්කෘතික හා කෘෂිකාර්මික අවශ්‍යතා හරහා ගොඩනැගුනු සම්බන්ධතා ජාලය විසින් දේශීය එළවළු වෙළඳාම පාලනය කරයි. මෙමගින් පැහැදිලි වනුයේ එළවළු අපනයන කර්මාන්තය තුළින් ගොවියාට උපරිම ඵල නෙළා ගැනීමට ඇති ඉඩකඩ ඇසිරී ඇති බවයි.

වඩාත් සංවිධානාත්මක ලෙස එළවළු අපනයන කර්මාන්තය ක්‍රියාත්මක වන අවස්ථාවක් පිළිබඳව මාතලේ ප්‍රදේශයෙන් වාර්තා වූ අතර සිද්ධි අධ්‍යයන 01 මගින් ඒ පිළිබඳව විග්‍රහ කෙරේ. ඉන් පැහැදිලි වනුයේ අපනයනය සඳහා එළවළු ලබාදීමට ඉහළ විභවතාවයක් ඇති ස්ථාන සහ ක්‍රමවේද විවිධ ස්ථානවල විවිධ මට්ටමෙන් ක්‍රියාත්මක වන බවයි. විශේෂයෙන්ම සාමූහික ක්‍රියාකාරකම් හරහාත් අපනයනකරුවන් හා ගොවීන් අතර සෘජු සම්බන්ධතා ගොඩනැගීම

හරහාත් ගොවීන්ට අපනයනය සඳහා එළවළු වගා කිරීමටත් ඉන් ඉහළ ලාභයක් ලබා ගැනීමටත් හොඳ පසුබිමක් නිර්මාණය කළ හැකි බව මින් පැහැදිලි වේ.

**සිද්ධි අධ්‍යයන 01**

මෙම ක්ෂේත්‍ර චාරිකාවේ දී මාතලේ නාඋල අඹන ප්‍රදේශයේ එක් ප්‍රධාන ගොවියෙක් අපනයන ආයතනයක් සමග (මීගමුව) සම්බන්ධවී ප්‍රදේශයේ ගොවීන් ඒකරාශී කර ගෙන අපනයනය සඳහා එළවළු වගාව සිදු කරයි. ඉහත සඳහන් අපනයනකරුගේ ප්‍රධාන සැපයුම්කරු ලෙස ක්‍රියා කරන ඔහු සෑම ගොවි බිමකම මූලික බිම් සැකසීමේ සිට අස්වනු නෙළීම දක්වාත් ඉන් අනතුරුව ප්‍රවාහනය දක්වාත් අධීක්ෂණයට ලක් කරයි. ඔවුහු රසායනික පොහොර භාවිතය අවම වශයෙන් සිදු කරන අතර වැඩිපුර කාබනික පොහොර භාවිතා කරති. කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය ද අවම මට්ටමකින් පවතී. මෙම ගොවීන් විසින් බීජ නිෂ්පාදනය පවා සිදු කරන අතර ගොවිතැන් කටයුතු සඳහා අත්තම් ශ්‍රමය භාවිතා කිරීම කැපී පෙනෙන ලක්ෂණයකි.

මෙම කාර්යයට මූලිකත්වය ලබා දෙන ගොවි මහතා ශීතාගාර සහිත ලොරියක හිමිකරුවෙකු වන අතර ප්‍රවාහනයේ දී අස්වනුවල ප්‍රමිතිය රඳවා ගැනීමට එය වැදගත් වේ. රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ මැදිහත්වීමකින් තොරව ගොවීන්ගේ එකමුතුකම හා කැපවීම මත ඔවුන් කණ්ඩායමක් ලෙස ක්‍රියාත්මක වී ඉහළ ප්‍රතිඵල අත් කර ගෙන ඇත.

මෙම කණ්ඩායමට අපනයනය සඳහා මදුරුතලා, අඹකොළ, කෙසෙල් කොළ, කුරුම්බා වැනි විශාල පරාසයකින් යුත් ඇණවුම් ලැබී ඇත. එහෙත් එම කණ්ඩායම එවැනි පුළුල් පරාසයක් තුළ ක්‍රියාත්මක වීමට තරම් සමත්වී නැත. මෙම ගොවීන්ට අතරමැදියන්ගේ මැදිහත්වීම පිළිබඳ ගැටලු නොමැති අතර, අනෙකුත් ගොවීන්ට මෙන් ප්‍රමිතියෙන් ඉහළ කොටස අපනයනය සඳහා තෝරා ගත් පසු ඉතිරි කොටස අඩු මිලකට අලෙවි කිරීමට සිදුවීම වැනි ගැටලු ද නැත. මන්ද ඔවුන් සමස්ත වගාවම හොඳින් නඩත්තු කරන බැවිනි. ඔවුනට අවශ්‍ය බීජ පවා නිෂ්පාදනය කර ගැනීම මීට ප්‍රධාන හේතුවකි.

### 3.4.2 ගොවියා විසින් අපනයනකරු වෙත සෘජුවම එළවළු සැපයීම

එළවළු නිෂ්පාදකයන් සෘජුවම අපනයනකරු හා සබඳතා පවත්වා ගන්නා ආකාර තුනක් හඳුනා ගත හැකි විය. එවැනි සබඳතා පවත්වා ගන්නා ගොවීන්ගේ ව්‍යාප්තිය දිස්ත්‍රික්ක අනුව බදුල්ල-7%, නුවරඑළිය-5%, මාතලේ-12% ක් වේ.

- එළවළු මිලදී ගැනීම සඳහා අපනයනකරු විවිධ ප්‍රදේශවල වගා කටයුතුවල නියැළෙන ගොවීන් පෞද්ගලිකව හඳුනා ගෙන ඒ අයට දුරකථන මාර්ගයෙන් අවශ්‍ය ඇණවුම ලබාදීම සිදු කරයි. අපනයනකරු ගොවිපලට පැමිණ ගොවියා විසින් තෝරා දෙනු ලැබූ එළවළුවලින් තමාට අවශ්‍ය ප්‍රමාණය නැවත තෝරා ප්ලාස්ටික් ඇසුරුම්වල බහා රැගෙන යයි.
- අපනයනකරු සැපයුම්කරුගේ දැනහැඳුනුම්කම් මත සෘජුවම ගොවියා වෙත පැමිණේ. සැපයුම්කරුගේ උපදෙස් මත ගොවීන් හමුවන අපනයනකරු ඔහු සතු ශීතකරණ සහිත වාහනවලින් තෝරන ලද එළවළු ප්ලාස්ටික් බහාළුම්වල අසුරා ගෙන යනු ලැබේ. මුදල් ගෙවනු ලබන්නේ සැපයුම්කරුටය. ගොවියාගේ තේරී ඉතිරි වන එළවළු ප්‍රාදේශීය වෙළඳපොළට හෝ ආර්ථික මධ්‍යස්ථානවලට අලෙවි කරනු ලැබේ.
- අපනයනකරු ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයන් හරහා හඳුනා ගත් ගොවීන් වෙතයාම සිදුවන බව නුවරඑළිය හා මාතලේ දිස්ත්‍රික්කවල දී අනාවරණය විය. ආර්ථික මධ්‍යස්ථානයේ සෑම ව්‍යාපාරිකයෙකුටම තමන් හා ගනුදෙනු කරන ගොවි ජාලයක් ඇත. එම ගොවීන් ඔහුට පමණක් එළවළු සපයනු ලැබේ. අපනයනකරු තෝරා ගනු ලබන එළවළු ප්‍රමාණ සඳහා අත්සන් කළ බිල්පතක් ගොවියාට ලබා දෙන අතර ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයා විසින් අදාළ කොමිස් මුදල් අඩු කර ගැනීමෙන් පසු ඉතිරි මුදල් ගොවියාට ලබා දේ. ගොවියා හා අපනයනකරු අතර සෘජු මූල්‍ය ගනුදෙනු සිදු නොවේ.

## 3.5 අපනයනය සඳහා ගුණාත්මක එළවළු සැපයීම පිණිස ගනු ලබන පියවර


අපනයනය සඳහා ගුණාත්මක එළවළු සැපයීම පිණිස ගොවිහු විවිධ පියවර අනුගමනය කරති.

### 3.5.1 පරිසර හිතකාමී වගා ක්‍රම අනුගමනය කිරීම

කාබනික එළවළු සඳහා විශේෂ ඉල්ලුමක් පවතින බව අපනයනකරුවන් සමඟ සිදු කළ සාකච්ඡාවල දී අනාවරණය විය. නමුත් ගොවීන් කාබනික එළවළු නිෂ්පාදනය කිරීම සඳහා යොමු කිරීම අපහසු තත්ත්වයක පවතී. කාබනික එළවළු ලෙස ඉතා සීමිත ප්‍රමාණයක් අපනයනය කිරීමත් ඒ සඳහා ඉහළ මිලක් ගෙවීමට නොහැකිවීමත් ඊට හේතු වේ. කාබනික එළවළු නිෂ්පාදනය කළ ද විශේෂ මිලක් නොලැබේ. එබැවින් කාබනික එළවළු නිපදවීම සඳහා යොමුවීමට සාතිශය බහුතරයක් ගොවීහු පසුබට වී සිටිති.

නියැදිය තුළ කාබනික එළවළු වගා කරන ගොවීන්ගේ ප්‍රතිශතය 12%කි. බදුල්ල, නුවරඑළිය හා මාතලේ දිස්ත්‍රික්ක සඳහා එම අගයන් පිළිවෙළින් 7%, 12% හා 18%ක් විය. මෙම නිෂ්පාදකයින් සමඟ කළ සාකච්ඡාවල දී පැහැදිලි වූයේ පුද්ගලිකව හඳුනාගත් ගැණුම්කරුවන් වෙත පවතින මිලට වඩා සැලකිය යුතු ඉහළ මිලකට (රු. 20-30 වැඩි මිලක්) මෙම කාබනික එළවළු අලෙවි කරන බවයි. කාබනික එළවළු සඳහා පවතින ඉල්ලුම එළවළු වර්ග කීපයකට සීමාවී තිබුණේ පහත පරිදිය.

| | |
|---|---|
| බදුල්ල දිස්ත්‍රික්කය | : ගෝවා, බෝංචි, තක්කාලි, කොලි ෆ්ලවර්, නෝකෝල් |
| නුවරඑළිය දිස්ත්‍රික්කය | : ගෝවා, ලීක්ස්, බීට්, සුකිනි, චයිනිස් ගෝවා |
| මාතලේ දිස්ත්‍රික්කය | : කරවිල, බණ්ඩක්කා, තක්කාලි |




මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**ප්‍රස්තාර අංක 3.2 : වගා ක්‍රම අනුව කාබනික එළවළු සඳහා ඉල්ලුම**

වගා ක්‍රමය අනුව සැලකීමේ දී විවෘත භූමියේ වගා කරන 65%කට වැඩි ප්‍රතිශතයක් අපනයනය සඳහා ලබා දෙන ගොවීන් අතරින් 17%කගේ කාබනික එළවළු සඳහා ඉල්ලුමක් නිර්මාණය වී තිබුණි. මේ අනුව පැහැදිලි වන්නේ දේශීය වශයෙන් කාබනික එළවළු සඳහා ඉහළ ඉල්ලුමක් පැවති බවයි. අපනයනය සඳහා එළවළු වගා කිරීම ප්‍රධාන ආකාර දෙකකින් සිදු කරන බව මින් පෙර ද සඳහන් කරන ලදී. එනම් ආරක්ෂිත ගෘහ සහිත වගා කිරීම හා ගොවිපල භූමිය තුළ වගා කිරීම වශයෙනි. මේ කුමන ක්‍රමයකට එළවළු නිෂ්පාදනය කරනු ලැබුව ද කිසිදු ගොවියෙකු විසින් අපනයනය ඉලක්ක කර ගනිමින් විශේෂ වගා ක්‍රම අනුගමනය කර නොතිබූ අතර ස්වල්ප වශයෙන් පරිසර හිතකාමී වගා ක්‍රම අනුගමනය කර ඇත. එනම්:

- "ඇල්බීසියා කොළ තලා පල් කිරීමෙන් සාදා ගන්නා දියරය කරවිල, පතෝල, මාළු මිරිස්, අමු මිරිස් වැනි වගා සඳහා භාවිතා කිරීම".

- "වගා බිමට මාසයකට පෙර ගොම පොහොර හෝ කොම්පෝස්ට් මිශ්‍රණ යෙදීමෙන් පසේ ව්‍යුහය වර්ධනය වීමට ඉඩහැර රසායනික පොහොර භාවිතය අවම කිරීම".

### 3.5.2 එළවළු තේරීම

ගුණාත්මක එළවළු සැපයීම සඳහා අවස්ථා කීපයක දී එළවළු තේරීම සිදු කරනු ලැබේ. සැපයුම්කරුවන්ගෙන් 95%ක්ම එළවළු තේරීම සිදුකරන්නේ ගොවිපළ තුළ දී හෝ ගොවියාගේ නිවසේදීය. මෙලෙස තේරීමේ දී එළවළු වර්ගය අනුව, දිග, වර්ණය, කෘමි හානි, මේරීම හා භෞතික හානි යන කරුණු පිළිබඳ අවධානය යොමු කෙරේ.

පළමුව ගොවියා විසින් එළවළු තේරීමෙන් අනතුරුව සැපයුම්කරු නැවත තේරීම සිදු කරයි. සමහර අවස්ථාවල සැපයුම්කරු, ගොවිපළට ගොස් නියමිත ප්‍රමිතියෙන් යුතු අස්වනු නෙළා ගත් අවස්ථා පිළිබඳව අනාවරණ විය. සමස්ත නියැදියේ 85%ක ගොවීන් පිරිසක් එළවළු තේරීම පිළිබඳ දැනුවත් වී ඇති අතර දිස්ත්‍රික් වශයෙන් සැලකීමේ දී එම ප්‍රතිශත බදුල්ල 93%ක්, නුවරඑළිය 91% ක් හා මාතලේ 70%ක් ලෙසිනි.

### 3.5.3 එළවළු බහාලුම් භාවිතය

ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය තුළින් නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය ආරක්ෂා වේ. තවද නිෂ්පාදනවල සීරීම් හා තැලීම් අඩුවන අතර වාතාශ්‍රය ලැබෙන අයුරින් ඇසුරුම් සකස් කර ඇති නිසා එළවළු අධික ලෙස රත්වීමට භාජනය නොවේ.

එළවළු අස්වැන්න නෙළා ගොවිපළේ සිට නිවසට ගෙන ඒම හා නිවසේ සිට සැපයුම්කරු හෝ අපනයනකරු වෙත රැගෙන යාම සඳහා ප්ලාස්ටික් බහාලුම් භාවිතා කරනු ලැබේ. සමස්ත නියැදියේ සියලුම ගොවීන් සතුව ප්ලාස්ටික් බහාලුම් පවතී. ඉන් 85%ක ප්‍රතිශතයකට ප්ලාස්ටික් ඇසුරුම් දහයක් හෝ ඊට අඩු ප්‍රමාණයක අයිතිය සතු විය. ඇසුරුම් 20ට වැඩි ප්‍රමාණයක් හිමි ගොවීන් පවා නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කවලින් වාර්තා විය (වගු අංක 3.12).

වගු අංක 3.12 : ගොවීන් සතු ප්ලාස්ටික් ඇසුරුම් සංඛ්‍යාව අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය


| ගොවීන් සතු ප්ලාස්ටික් ඇසුරුම් සංඛ්‍යාව | දිස්ත්‍රික්කය | | | | | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | බදුල්ල | | නුවරඑළිය | | මාතලේ | | | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 10 හෝ ඊට අඩු | 26 | 90 | 13 | 59 | 39 | 95 | 78 | 85 |
| 11 සිට 20 දක්වා | 03 | 10 | 05 | 23 | 01 | 2.5 | 09 | 10 |
| 21 සිට 30 දක්වා | 0 | 0 | 04 | 18 | 01 | 2.5 | 05 | 05 |
| මුළු එකතුව | 29 | 100 | 22 | 100 | 41 | 100 | 92 | 100 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

## 3.6 අපනයනය සඳහා එළවළු වගා කරන ගොවීන් අත් කර ගෙන ඇති ප්‍රතිලාභ

### 3.6.1 ව්‍යාපාරයේ ප්‍රගතිය

ව්‍යවසායකයෙකුගේ පරම අභිලාෂය සිය ව්‍යාපාරය දියුණු කර ගැනීමයි අපනයනය සඳහා එළවළු වගා කරන ගොවීන් පිළිබඳ සැලකීමේ දී ඔවුන් අතර බහුතරයක් (53%) සිය ව්‍යාපාරවල වර්ධනයක් අත්විඳ ඇත. ප්‍රස්තාර අංක 3.3 මගින් එම ව්‍යවසායන්හි දිශානතිය ඉදිරිපත් කර ඇත.




මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

ප්‍රස්තාර අංක 3.3 : ව්‍යාපාරයේ දිශානතිය


වගු අංක 3.13 : එළවළු අපනයන කර්මාන්තය වර්ධනය වී ඇති මට්ටම්

| සතියකට සපයන එළවළු ප්‍රමාණයේ වැඩිවීම (කි.ග්‍රෑ) | ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 5-50 | 10 | 21% |
| 51 - 250 | 25 | 52% |
| 251 - 2500 | 13 | 27% |
| මුළු එකතුව | 48 | 100 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

ව්‍යාපාරයන්හි වර්ධනය සතියකට සපයන එළවළු ප්‍රමාණය (කි.ග්‍රෑ.) අනුව ගණනය කළ විට වර්ධනය වූ මට්ටම මත ගොවීන්ගේ ව්‍යාප්තිය වගු අංක 3.13න් දැක්වේ. ව්‍යාපාරවල ප්‍රගතිය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය දිස්ත්‍රික්ක මට්ටමින් ඉදිරිපත් කර ඇති අතර (ප්‍රස්තාර අංක 3.4) ඉන් පැහැදිලි වන ආකාරයට මාතලේ දිස්ත්‍රික්කය තුළ දේශීය වෙළඳපළ ඉලක්ක කර ගනිමින් පහත රට එළවළු වගා කරන ගොවීන්ගේ බහුතරයක ව්‍යවසායන්හි වැඩි වර්ධනයක් පෙන්නුම් නොකරයි. නමුත් නුවරඑළියේ තත්ත්වය වඩාත් සාර්ථක බව පෙනේ. ඊට හේතු කවරේද යන්න


විමසා බැලීම වැදගත් වේ. එමෙන්ම අපනයනය ඉලක්ක කර ගත් බහුතරයක් ගොවීන් හමුවූ බදුල්ල දිස්ත්‍රික්කය තුළ සැලකිය යුතු ගොවීන් ප්‍රතිශතයකගේ (35%) ව්‍යාපාර බිඳ වැටී ඇත. කුමන කරුණු මුල් කර ගෙන එසේ බිඳ වැටී ඇත්ද යන්න සොයා බැලීම ද වැදගත් වේ.




**මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014**

**ප්‍රස්තාර අංක 3.4 : ව්‍යාපාරයන්හි ප්‍රගතිය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය**


සිය ව්‍යවසායන් වර්ධනය වූ ගොවීන් ප්‍රකාශ කරන පරිදි ඊට ප්‍රධාන හේතුව එළවළු නිෂ්පාදන ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ යාමයි. එනම් සැපයුම ඉහළ යාමයි. මෙම තත්ත්වය බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් වලංගු වේ. නමුත් මාතලේ දිස්ත්‍රික්කයට අනුව ව්‍යාපාර වර්ධනය වීමට ප්‍රධාන හේතුව වැඩිපුර ඇණවුම් ලැබීම හෙවත් ඉල්ලුම ඉහළ යාමයි. එළවළු සඳහා ඉහළ මිලක් ලබාදීම තවත් හේතුවකි (ප්‍රස්තාර අංක 3.5).




මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014


ප්‍රස්තාර අංක 3.5 : ව්‍යාපාරයන්හි වර්ධනයට පාදක වූ හේතු

එළවළු අපනයන කර්මාන්තයට යොමුවීමත් සමඟ ගුණාත්මක බීජ භාවිතය හා උචිත වගා ක්‍රම අනුගමනය කිරීම තුළින් ගුණාත්මක එළවළුවල සැපයුම ප්‍රමාණාත්මකව ඉහළ ගිය බව සාකච්ඡාවලදී අනාවරණය විය. ඉල්ලුම වර්ධනයවීම කෙරෙහි ප්‍රධාන කරුණු දෙකක් පාදක වී තිබුණි. එනම් සැපයුම්කරුට වැඩි ඇණවුම් ප්‍රමාණයක් ලැබීමත්, සමහර ගොවීන්ගේ නිෂ්පාදන හානිවීම මගින් අනෙකුත් ගොවීන් වෙත වැඩි ඇණවුම් ලැබීමත්ය. එමගින් සමහර එළවළු සඳහා ඉහළ මිලක් ලැබී ඇත.




මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

ප්‍රස්තාර අංක 3.6: වගා ක්‍රමය හා ව්‍යාවසායන්හි ප්‍රගතිය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය




මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**ප්‍රස්තාර අංක 3.7: අපනයනයට එළවළු සපයන කොටස අනුව ගොවීන්ගේ තත්ත්වය**

ප්‍රස්තාර අංක 3.6න් දැක්වෙන පරිදි විවෘත භූමිවල එළවළු වගාකරන ගොවීන් හා සැසැඳූ කල ආරක්ෂිත ගෘහ සහිත වගා කරන ගොවීන් වැඩි සංඛ්‍යාවක් සිය ව්‍යාපාරවල ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. එමෙන්ම අපනයන දායකත්වය 65% ඉක්මවූ ගොවීන් අතර වැඩි සංඛ්‍යාවකගේ ව්‍යාපාර වර්ධනය වී ඇත. නමුත් වගා ක්‍රමය හෝ අපනයන දායකත්වය අනුව ව්‍යාපාරයේ වර්ධනය හෝ ප්‍රගතිය තීරණය වී නොමැති බව සංඛ්‍යානමය වශයෙන් වෙසෙසියාත්මක නොවීමෙන් පැහැදිලි වේ (වගා ක්‍රමය සඳහා $\chi^2$ අගය = 0.804; P අගය = 0.370, අපනයන දායකත්වය සඳහා $\chi^2$ අගය = 0.168; P = 0.684).

### 3.6.2 ණය ලබාගැනීම තුළින් ව්‍යාපාරය නඟා සිටුවීම සඳහා පියවර ගැනීම

සමස්ත නියැදියේ එළවළු ගොවීන්ගෙන් 49%ක ප්‍රතිශතයක් අධ්‍යයනය සිදු කළ වර්ෂය ආරම්භයේ සිට ණය මුදල් ලබා ගෙන තිබුණි. එම ණය ලබාගත් ප්‍රමුඛ ප්‍රභවයන් වූයේ ගොවිජන බැංකුව, ලංකා බැංකුව, සමෘද්ධි සංවර්ධන බැංකුව හා සංවර්ධන බැංකුවයි. ලබාගත් ගොවි ණයවලින් 80%ක් එම ණය ආපසු ගෙවමින් පැවත තිබුණි. ණය ආපසු ගෙවීම සඳහා ගොවිතැනින් ලබන ආදායම භාවිත කර ඇති අතර බොහෝවිට එය අපනයනය සඳහා මෙන්ම දේශීය වෙළඳපළට එළවළු සැපයීමෙන් සපුරා තිබුණි. නැවත ණය මුදලක අවශ්‍යතාවය 38%ක් වූ එළවළු ගොවීන් වෙතින් ප්‍රකාශ විය. මෙම අවශ්‍යතාවය කෘෂි යෙදවුම් මිලදී ගැනීමට හා නිෂ්පාදන කාර්යයේ පහසුකම් වැඩි කිරීමට වෙයි.

### 3.6.3 ගොවීන් සංවිධාන ගත වීම

එළවළු අපනයනය සඳහා යොමුවූ ගොවීන් සංවිධානගතවීම ධනාත්මක ප්‍රවණතාවකි. බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව පරණගම හරිතාගාර අපනයන පොදු සමාගම හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ 'ඇක්වෝ' ආයතනය, දිමුතු ගොවි සංවිධානය හා කන්දේ ඇළ ගොවි සංවිධානය ඒ අතර විය.

බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවීන් 68%ක් හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවීන් 53%ක් මෙම සමිතිවල සාමාජිකත්වය දැරූ නමුත් මාතලේ දිස්ත්‍රික්කය තුළ එවැනි ගොවි සංවිධානවල පැවැත්ම පිළිබඳ තොරතුරු අනාවරණ වූයේ නැත. සාමාජිකත්වයේ එළවළු නිෂ්පාදන මිලදී ගැනීම, අවශ්‍ය යෙදවුම් සහන මිලට ණය පදනම මත ලබා දීම, අපනයන කර්මාන්තය සඳහා අවශ්‍ය දැනුම හුවමාරු කර ගැනීම, ණය ලබා ගැනීමේ දී අවශ්‍ය උපදෙස් හා පහසුකම් සැලසීම මෙම සංවිධානවල කාර්යභාරය වේ.

සමස්ත නියැදියේ සමිතිවල සාමාජිකත්වය දරන 28%ක් වූ ගොවි ප්‍රතිශතයක් විසින් එළවළු අපනයනය සඳහා සංවිධානගත වීමේ වැදගත්කම පිළිබඳව හේතු රාශියක් පෙන්වා දෙන ලදී.

- සමිති මගින් චක්‍රීය අරමුදලක් ක්‍රියාත්මක කර ගොවීන්ට ණය ලබාදීමේ ක්‍රමයක් ආරම්භ කළහැකි වීම.
- ගොවීන් සැපයුම්කරුවන් හා අපනයනකරුවන් අතර සම්බන්ධතාවයක් ඇති කිරීම තුළින් ලැබෙන ඇනවුම් ප්‍රමාණ ඉහළ නංවා ගත හැකි වීම.
- අපනයනය සඳහා එළවළු සැපයීමේ දී ගොවීන් අතර පවත්නා ගැටලු සාකච්ඡා කර ඒවා අවම කර ගැනීමට හැකිවීම.
- සියලු ගොවීන් එකමුතු වීම තුළ කේවල් කිරීමේ ශක්තිය වර්ධනයවී ගොවි නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබා ගැනීමට හැකිවීම.
- සමිතියක් ලෙස එකමුතුවීම තුළ රාජ්‍ය ආයතන හා නිරතුරු සම්බන්ධයක් ඇති කර ගැනීමට හැකිවීම.

### 3.6.4 නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලැබීම

**බදුල්ල දිස්ත්‍රික්කය**

අපනයනය ඉලක්ක කර ගනිමින් වගා කරන එළවළු වර්ගවලට සමහර අවස්ථාවල දී සුපිරි වෙළඳසැල් හා සංචාරක හෝටල්වලින් වැඩි මිලක් ගෙවනු ලැබේ. මෙවැනි අවස්ථාවලදී මෙම බෝග අපනයන වෙළඳපොළට යැවීමට වඩා සුපිරි වෙළඳපළ වෙත අලෙවි කිරීම තුළින් වැඩි ආර්ථික වාසි ලබා ගත් අවස්ථා දක්නට ලැබුණි. මෙහිදී නිෂ්පාදකයා සැමවිටම බලාපොරොත්තු වනුයේ වැඩි අලෙවි ඉඩ ප්‍රස්ථා ඇති කරගැනීම බැවින් ඔවුහු සැමවිටම අපනයනය සඳහා අපහසුවෙන් වුවද ඇණවුමෙන් කොටසක් හෝ සම්පූර්ණ කර ඒ සැම අලෙවි මාර්ගයක්ම විවෘතව තබා ගැනීමට කටයුතු කරති. වගු අංක 3.14න් පැහැදිලි වන පරිදි තක්කාලි, බෙල්පෙපර්, මාළු මිරිස් වැනි බෝග අපනයනය සඳහා සැපයීමෙන් ලැබී ඇති ඉහළ මිල පිළිවෙළින් 74%, 59%, 125% වූ අතර එම අගයන් සංඛ්‍යානමය වශයෙන් වෙසෙසියාත්මක වේ.

**වගු අංක 3.14 : වෙළඳපළ අනුව එළවළු මිල සංසන්දනය - බදුල්ල දිස්ත්‍රික්කය**

| එළවළු වර්ගය | වෙළඳපළ අනුව මධ්‍යනය මිල (රු./කි.ග්‍රෑම්) | | දේශීය වෙළඳපළ මිලට සාපේක්ෂව මිලෙහි වෙනස | | t අගය | Sig |
|---|---|---|---|---|---|---|
| | දේශීය | අපනයන | (රු./කි.ග්‍රෑම්) | % | | |
| අමු මිරිස් | 130 | 300 | 170 | 131 | NA | NA |
| තක්කාලි | 54 | 94 | 40 | 74 | 7.902 | .000 |
| බෙල්පෙපර් | 164 | 261 | 97 | 59 | 14.457 | .000 |
| ජපන් පිපිඤ්ඤා | 55 | 109 | 54 | 98 | N A | NA |
| මාළුමිරිස් | 100 | 225 | 125 | 125 | 4.456 | .000 |
| බෝංචි | 55 | 100 | 45 | 82 | N A | NA |
| ගෝවා | 10 | 60 | 50 | 500 | N A | NA |

සටහන: NA - අදාළ නොවේ.

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

### නුවරඑළිය දිස්ත්‍රික්කය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවීන් අපනයන වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් වගා කළ එළවළු වර්ග අපනයනය සඳහා සැපයීමෙන් සැලකිය යුතු ඉහළ මිලක් ලබා ගැනීමට හැකි වී ඇත. වගු අංක 3.15 දත්ත වලට අනුව පාස්ලි, සුකිනි, චයිනීස් ගෝවා, බෲකෝලි, සලාද හා කොත්තමල්ලි යන බෝග වර්ග සඳහා ලැබී ඇති ඉහළ මිල ගණන් සංඛ්‍යානමය වශයෙන් වෙසෙසියාත්මක වේ. ගෝවා, ලීක්ස්, බීට්, කැරට් යනාදී දේශීය වෙළඳපොළ සඳහා වගා කරන බෝගවලින් හොඳම කොටස අපනයනයට යොමු කළත් ඒ සැමවිටම ලැබෙන්නේ දේශීය වෙළඳපළ මිලට සාපේක්ෂ වූ සුළු වැඩිවීමක් පමණි. එය දේශීය වෙළඳපොළට ඉදිරිපත් කරන බෝගවලට සැම විටම සිදුවන අසාධාරණයක් බවට නිෂ්පාදකයින්ගේ අදහස විය. ගෝවා දේශීය වෙළඳපොළ මිල රු. 41/-ක් වූ අතර අපනයනය සඳහා සපයා රු.43/-කටය. සැපයුම්කරු ගොවියාගේ සියලු නිෂ්පාදන මිලදී ගෙන එයින් කොටසක් පමණක් අපනයනය සඳහා සැපයීමේදී අපනයන හා දේශීය මිල ගණන් අතර විශාල වෙනසක් නොපවතී. අපනයනය සඳහා ලබා දීමේ දී ගෝවා ගෙඩියේ මතුපිට කොළ විශාල ලෙස ඉවත් කිරීමට සිදුවන අතර සාමාන්‍යයෙන් ග්‍රෑම් 250ක් අතර ප්‍රමාණයක කොළ අපතේ දැමීමට සිදුවේ. සියල්ල මිලදී ගැනීම හේතුවෙන් ගොවීන්ට ප්‍රවාහන වියදම පමණක් ලාභයක් ලෙස ඉතිරි වේ.

වගු අංක 3.15 : වෙළඳපළ අනුව එළවළු මිල සංසන්දනය - නුවරඑළිය දිස්ත්‍රික්කය

| එළවළු වර්ගය | මධ්‍යයන මිල (රු./කි.ග්‍රෑම්) | | දේශීය වෙළඳපළ මිලට සාපේක්ෂව මිලෙහි වෙනස | | t අගය | Sig |
|---|---|---|---|---|---|---|
| | දේශීය | අපනයනය | (රු./කි.ග්‍රෑම්) | % | | |
| මාළු මිරිස් | 150 | 160 | 10 | 07 | NA | NA |
| ගෝවා | 41 | 43 | 02 | 05 | 0.132 | .903 |
| බෝංචි | 110 | 120 | 10 | 09 | NA | NA |
| කොත්තමල්ලි | 195 | 385 | 190 | 97 | 3.403 | .042 |
| පාස්ලි | 81 | 164 | 83 | 102 | 2.863 | .021 |
| ලීක්ස් | 36 | 47 | 11 | 31 | 1.668 | .171 |
| බීට | 60 | 85 | 25 | 42 | 1.000 | .500 |
| කැරට් | 96 | 100 | 04 | 04 | 1.567 | .215 |
| සුකිනි | 66 | 128 | 62 | 94 | 3.173 | .013 |
| චයිනීස් ගෝවා | 74 | 111 | 37 | 50 | 6.905 | .000 |
| බෲකෝලි | 231 | 510 | 279 | 121 | 3.228 | .023 |
| අර්තාපල් | 93 | 125 | 32 | 34 | 1.063 | .480 |
| නෝකෝල් | 40 | 45 | 05 | 13 | NA | NA |
| සලාද | 55 | 73 | 18 | 33 | 5.093 | .001 |
| රෙඩ්කැබේජ් | 98 | 144 | 46 | 47 | 1.223 | .309 |
| සැල්දරි | 40 | 60 | 20 | 50 | NA | NA |
| ලෝන්ග් රැඩිෂ් | 20 | 40 | 20 | 100 | NA | NA |
| රෝස් මෙරි | 200 | 1300 | 1100 | 550 | NA | NA |
| ඔරියානා | 100 | 350 | 250 | 250 | NA | NA |
| පචෝලි | 50 | 75 | 25 | 50 | NA | NA |
| අයිස්බර්ග් | 70 | 181 | 111 | 159 | 1.354 | 0.308 |

සටහන: NA - අදාළ නොවේ.
මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**මාතලේ දිස්ත්‍රික්කය**

මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගොවීහු ප්‍රධාන වශයෙන් පහතරට එළවළු අපනයනය සඳහා සපයති. එසේ සපයනු ලබන බොහෝ එළවළු වර්ග සඳහා දේශීය වෙළඳපළ මිලට වඩා සැලකිය යුතු ඉහළ මිලක් ලැබී ඇත (වගු අංක 3.16). එළවළු වර්ග අනුව මිලෙහි වැඩිවීම රු.9/- සිට රු.32/- දක්වාත් මිලෙහි වැඩිවීම ප්‍රතිශතයක් ලෙස 17% සිට 60% දක්වාත් විචලනය වී ඇති අතර එම මිල ගණන් වල වෙනස සංඛ්‍යාත්මය වශයෙන් වෙසෙසියාත්මක වේ.

**වගු අංක 3.16 : වෙළඳපළ අනුව එළවළු මිල සංසන්දනය - මාතලේ දිස්ත්‍රික්කය**

| එළවළු වර්ගය | මධ්‍යයන මිල (රු./කි.ග්‍රෑම්) | | දේශීය වෙළඳපළ මිලට සාපේක්ෂව මිලෙහි වෙනස | | t අගය | Sig |
|---|---|---|---|---|---|---|
| | දේශීය | අපනයනය | (රු./කි.ග්‍රෑම්) | % | | |
| වැටකොළු | 45 | 59 | 14 | 31 | 8.571 | .000 |
| දඹල | 84 | 99 | 15 | 18 | 5.196 | .014 |
| පතෝල | 41 | 55 | 14 | 34 | 8.913 | .000 |
| මැකරල් | 59 | 70 | 11 | 17 | 5.740 | .000 |
| කැකිරි | 21 | 30 | 09 | 43 | 8.777 | .001 |
| කරවිල | 66 | 85 | 19 | 29 | 6.439 | .000 |
| මුරුංගා | 53 | 85 | 32 | 60 | 7.000 | .020 |
| බීළුණු | 58 | 73 | 15 | 26 | 3.000 | .205 |
| මාළු මිරිස් | 99 | 126 | 27 | 27 | 4.269 | .004 |
| බණ්ඩක්කා | 60 | 70 | 10 | 17 | NA | NA |
| පිපිඤ්ඤා | 20 | - | - | - | - | - |
| අමුමිරිස් | 88 | 110 | 22 | 25 | 8.386 | .000 |
| වම්බටු | 80 | - | - | | - | - |
| ගෝවා | 80 | - | - | | - | - |
| බෝංචි | 75 | 90 | 15 | 20 | NA | |
| තක්කාලි | 73 | 93 | 20 | 27 | NA | |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

### 3.6.5 එළවළු ගොවීන්ගේ ආදායම වර්ධනය වීම

**බදුල්ල දිස්ත්‍රික්කය**

විවිධ වෙළඳපළ වෙත එළවළු සැපයීමෙන් ලද ආදායම තම මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස ගත්විට ගොවීන්ගේ ව්‍යාප්තිය වගු අංක 3.17න් ඉදිරිපත් කර ඇත. ඒ අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවීන් අතරින් බහුතරයක් (83%) අපනයනය සඳහා එළවළු සැපයීම තුළින් ඔවුන් ඉපැයූ මුළු ආදායමෙන් 75%කට වඩා උපයා ගෙන ඇත. සුපිරි වෙළඳපළට එළවළු සැපයීමෙන් ද ගොවීන් ආදායම් උපයා ඇති නමුත් ඒ සුළු සංඛ්‍යාවක් (9% ක්) මෙන්ම මුළු ආදායමෙන් 75%ක් හෝ ඊට අඩු අගයකි.

අපනයනය සඳහා එළවළු සැපයීම බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ගොවීන්ට හොඳ ආදායම් මාර්ගයක් වී ඇත. අපනයන දායකත්වය 65% ඉක්ම වූ හරිතාගාර නිෂ්පාදකයන්ගේ එළවළු අපනයනය සඳහා සැපයීම මගින් මධ්‍යනය ආදායම 66%කින් ඉහළ ගොස් ඇති අතර එම ප්‍රමාණය සංඛ්‍යානමය වශයෙන් වෙසෙසියාත්මක වර්ධනයක් වේ (වගු අංක 3.18). අපනයන දායකත්වය 65%ට අඩු ගොවීන්ගේ මධ්‍යනය ආදායම් වර්ධනය 33%ක් වන අතර එය සංඛ්‍යානමය වශයෙන් වෙසෙසියාත්මක වර්ධනයක් නොවේ. මේ අනුව පෙනී යන්නේ අපනයනය ඉලක්ක ගතව ආරක්ෂිත ගෘහ තුළ එළවළු වගා කිරීම තුළින් ගොවීන් හට සැලකිය යුතු මට්ටමින් සිය ආදායම් ඉහළ නංවා ගත හැකි බවයි.

**වගු අංක 3.17: විවිධ වෙළඳපළවළ වෙත එළවළු සැපයීමෙන් ලද ආදායම අනුව ගොවීන් ගේ ව්‍යාප්තිය බදුල්ල දිස්ත්‍රික්කය**

| එළවළු අලෙවියෙන් ලද ආදායම සමස්ත ආදායමේ ප්‍රතිශතයක් ලෙස | අපනයන වෙළඳපොළට සැපයූ ගොවීන් | | සුපිරි වෙළඳපොළට සැපයූ ගොවීන් | | දේශීය වෙළඳපොළට සැපයූ ගොවීන් | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 0 | - | - | 26 | 91 | 19 | 85 |
| 1-25 | - | - | 1 | 03 | 07 | 05 |
| 26-50 | 02 | 07 | 1 | 03 | 02 | 07 |
| 51-75 | 03 | 10 | 1 | 03 | 01 | 03 |
| 75 ට වැඩි | 24 | 83 | - | - | - | - |
| මුළු එකතුව | 29 | 100 | 29 | 100 | 29 | 100 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

වගු අංක 3.18: වගා ක්‍රම අනුව ලබන ආදායම වෙනස්වීම- බදුල්ල දිස්ත්‍රික්කය

| විස්තරය | මුළු නියැදිය සඳහා | වගා ක්‍රමය හා අපනයන දායකත්වය අනුව ගොවි කාණ්ඩ | |
|---|---|---|---|
| | | ආරක්ෂිත ගෘහ සහිත වගා කරන අපනයන දායකත්වය 65% ට වැඩි | ආරක්ෂිත ගෘහ සහිත වගා කරන අපනයන දායකත්වය 65%ට අඩු |
| වර්තමාන මධ්‍යනාය ආදායම (රු.) | 454,114 | 445,090 | 497,430 |
| සියලුම එළවළු දේශීය වෙළඳපළට අලෙවි කළේ නම් ලබා ගතහැකි මධ්‍යනාය ආදායම (රු.) | 286,655 | 268,610 | 373,270 |
| ඉහත ආදායම් අතර වෙනස (රු.) | 167,459 | 176,480 | 124,160 |
| ඉහත වෙනස ප්‍රතිශතයක් ලෙස | 58% | 66% | 33% |
| t අගය | 5.374 | 4.911 | 2.190 |
| වෙසෙසියාත්මක මට්ටම (Sig. level) | .000 | .000 | 0.094 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

නුවරඑළිය දිස්ත්‍රික්කය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ තත්ත්වය බදුල්ලට වඩා තරමක් වෙනස් ස්වරූපයක් ගනී. මුළු ආදායමෙන් අපනයන ආදායම 75% ඉක්මවන ගොවි ප්‍රතිශතය 45%ක් පමණි. ගොවීන් අතරින් 50%කට වැඩි පිරිසක් දේශීය වෙළඳපළ සමඟ ගනුදෙනු කරන අතරම එමගින් ඉහළ ආදායම් උපයා ඇති බව දත්තවලින් පැහැදිලි වේ (වගු අංක 3.19).

වගු අංක 3.19 : විවිධ වෙළඳපළ වෙත එළවළු සැපයීමෙන් ලද ආදායම අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය - නුවරඑළිය දිස්ත්‍රික්කය

| එළවළු අලෙවියෙන් ලද ආදායම සමස්ත ආදායමේ ප්‍රතිශතයක් ලෙස | අපනයන වෙළඳපොළට සැපයූ ගොවීන් | | සුපිරි වෙළඳපළට සැපයූ ගොවීන් | | දේශීය වෙළඳපොළට සැපයූ ගොවීන් | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 0 | - | - | 19 | 88 | 09 | 41 |
| 1-25 | 03 | 14 | 01 | 04 | 03 | 14 |
| 26-50 | 03 | 14 | 01 | 04 | 06 | 27 |
| 51-75 | 06 | 27 | 01 | 04 | 02 | 09 |
| 75 ට වැඩි | 10 | 45 | - | - | 02 | 09 |
| මුළු එකතුව | 22 | 100 | 22 | 100 | 22 | 100 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

වගු අංක 3.20 මගින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ ආදායම් මට්ටම් පිළිබඳ දත්ත ඉදිරිපත් කර ඇත. එම දත්තවලට අනුව සමස්තයක් ලෙස නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවීන් අපනයනය සඳහා එළවළු සැපයීම තුළින් 49%කින් මධ්‍යනය ආදායම ඉහළනංවා ගෙන ඇත. තවද අපනයන දායකත්වය 65%කට වැඩි ගොවීන්ගේ මධ්‍යනය ආදායම් වර්ධනය 65%කි. ඉහත ගොවි කාණ්ඩ දෙකේම මධ්‍යනය ආදායම් වර්ධනයවීම් සංඛ්‍යානමය වශයෙන් වෙසෙසියාත්මක වේ. අපනයන දායකත්වය 65%ට අඩු ගොවීන්ගේ මධ්‍යනය ආදායම් වර්ධනය 9%ක් පමණක් වන අතර එය සංඛ්‍යානමය වශයෙන් වෙසෙසියාත්මක වර්ධනයක් නොවන බව තහවුරු වේ.

**වගු අංක 3.20 : වගා ක්‍රම අනුව ලබන ආදායම වෙනස්වීම - නුවරඑළිය දිස්ත්‍රික්කය**

| විස්තරය | මුළු නියැදිය | වගා ක්‍රමය හා අපනයන දායකත්වය අනුව ගොවි කාණ්ඩ | | | |
|---|---|---|---|---|---|
| | | ආරක්ෂිත ගෘහ තුළ වගා කරන අපනයන දායකත්වය 65%ට වැඩි | විවෘත භූමියේ වගා කරන අපනයන දායකත්වය 65%ට වැඩි | ආරක්ෂිත ගෘහ තුළ වගා කරන අපනයන දායකත්වය 65%ට අඩු | විවෘත භූමියේ වගා කරන අපනයන දායකත්වය 65%ට අඩු |
| වර්තමාන මධ්‍යනය ආදායම (රු.) | 480,345 | 698,500 | 448,687 | 1,008,950 | 352,421 |
| සියලුම එළවළු දේශීය වෙළඳපොළට අලෙවි කළේ නම් ලබා ගතහැකි මධ්‍යනය ආදායම (රු.) | 323,150 | 413,500 | 271,833 | 583,825 | 323,735 |
| ඉහත ආදායම් අතර වෙනස (රු.) | 157,195 | 285,000 | 176,854 | 425,125 | 28,686 |
| ඉහත වෙනස ප්‍රතිශතයක් ලෙස | 49% | 69% | 65% | 72% | 9% |
| t අගය | 3.484 | - | 2.831 | - | 2.388 |
| වෙසෙසියාත්මක මට්ටම (Sig. level) | .002 | - | .016 | - | .054 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**මාතලේ දිස්ත්‍රික්කය**

මාතලේ දිස්ත්‍රික්කයේ ගොවීන් ප්‍රධාන වශයෙන් පහතරට එළවළු වගා කර ඇති අතර ඒවා අපනයනය සඳහා ද සපයා ඇත. ඔවුන් බහුතරයකගේ මුළු ආදායමෙන් අපනයනය සඳහා එළවළු සැපයීමෙන් ලබන ආදායම 50%ට අඩු වේ. එනමුත් බහුතරයකගේ දේශීය වෙළඳපොළ ආදායම මුළු ආදායමෙන් 50% ඉක්මවා ඇති බව වගු අංක 3.21 දත්තවලින් පැහැදිලි වේ. එම ගොවීන් අතරින් බහුතරයක් දේශීය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් වගා කටයුතුවල නියැළී ඇති අතර අපනයනය සඳහා එළවළු සැපයීම තුළින් ඔවුන් 90%ක මධ්‍යනාය ආදායම් වර්ධනයක් ලබා ඇති අතර එම අගය සංඛ්‍යානමය වශයෙන් වෙසෙසියාත්මක වේ (වගු අංක 3.22).

**වගු අංක 3.21 : විවිධ වෙළඳපොළ වෙත එළවළු සැපයීමෙන් ලද ආදායම අනුව ගොවීන් ගේ ව්‍යාප්තිය මාතලේ දිස්ත්‍රික්කය**

| එළවළු අලෙවියෙන් ලද ආදායම සමස්ත ආදායමේ ප්‍රතිශතයක් ලෙස | අපනයන වෙළඳපොළට සැපයූ ගොවීන් | | සුපිරි වෙළඳපොළට සැපයූ ගොවීන් | | දේශීය වෙළඳපොළට සැපයූ ගොවීන් | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 0 | - | - | 38 | 98 | - | - |
| 1-25 | 17 | 43 | 01 | 02 | 01 | 02 |
| 26-50 | 12 | 30 | - | - | 10 | 25 |
| 51-75 | 10 | 25 | - | - | 15 | 38 |
| 75%ට වැඩි | 01 | 02 | - | - | 14 | 35 |
| මුළු එකතුව | 40 | 100 | 39 | 100 | 40 | 100 |

**මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014**

වගු අංක 3.22 : වගා ක්‍රම අනුව ලබන ආදායම වෙනස්වීම - මාතලේ දිස්ත්‍රික්කය

| විස්තරය | මුළු නියැදිය | වගා ක්‍රමය හා අපනයන දායකත්වය අනුව ගොවි කාණ්ඩ | | |
|---|---|---|---|---|
| | | ආරක්ෂිත ගෘහ තුළ වගා කරන අපනයන දායකත්වය 65%ට වැඩි | ආරක්ෂිත ගෘහ තුළ වගා කරන අපනයන දායකත්වය 65%ට අඩු | විවෘත භූමියේ වගා කරන අපනයන දායකත්වය 65%ට අඩු |
| වර්තමාන මධ්‍යන්‍ය ආදායම (රු.) | 525,260 | 38,000 | 2,521,000 | 485,563 |
| සියලුම එළවළු දේශීය වෙළඳපළට අලෙවි කළේ නම් ලබා ගතහැකි මධ්‍යන්‍ය ආදායම (රු.) | 288,247 | 30,000 | 1,800,000 | 255,261 |
| ඉහත ආදායම් අතර වෙනස (රු.) | 237,012 | 8,000 | 721,000 | 230,303 |
| ඉහත වෙනස ප්‍රතිශතයක් ලෙස | 82% | 27% | 40% | 90% |
| t අගය | 3.274 | - | - | 3.075 |
| වෙසෙසියාත්මක මට්ටම (Sig. level) | .002 | - | - | .004 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

## 3.7 අපනයනය සඳහා එළවළු වගාකරන ගොවීන් මුහුණ පා ඇති ගැටලු

අපනයනය සඳහා එළවළු වගා කරන පොදුවේ අත්විඳින ගැටලු කීපයකි (වගු අංක 3.23).

වගු අංක 3.23 : අපනයනය සඳහා එළවළු වගා කරන ගොවීන් මුහුණපාන ගැටලු

| අපනයනය සඳහා එළවළු වගා කරන ගොවීන් මුහුණපාන ගැටලු | බදුල්ල N=29 | | නුවරඑළිය N=22 | | මාතලේ N=40 | | සමස්ත නියැදිය N=91 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ගොවීන් සංඛ්‍යාව | % | ගොවීන් සංඛ්‍යාව | % | ගොවීන් සංඛ්‍යාව | % | ගොවීන් සංඛ්‍යාව | % |
| ඇනවුම් සීමාසහිත වීම හා අවිනිශ්චිත වීම | 06 | 21 | 20 | 91 | 36 | 90 | 62 | 68 |
| නිෂ්පාදන අපනයන ප්‍රමිතියෙන් යුක්ත නොවීම | 07 | 24 | 05 | 23 | 27 | 68 | 39 | 43 |
| මිල ප්‍රමාණවත් නොවීම හා අස්ථාවර වීම | 02 | 07 | 03 | 14 | 01 | 03 | 06 | 07 |
| තේරීම මගින් එළවළු වැඩිපුර ප්‍රතික්ෂේප වීම | 03 | 10 | 14 | 64 | 13 | 33 | 27 | 30 |
| නිෂ්පාදන අලෙවි සබඳතා දුර්වලවීම | 04 | 14 | 11 | 50 | 24 | 60 | 39 | 43 |
| ණය ලබා ගැනීමේ දුෂ්කරතා | 06 | 21 | 12 | 55 | 20 | 50 | 38 | 42 |
| මුල්‍ය ගනුදෙනුවල අක්‍රමිකතා | 01 | 03 | - | - | 01 | 03 | 02 | 02 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

### 3.7.1 ඇණවුම් සීමාසහිත වීම හා අවිනිශ්චිත වීම

එළවළු ගොවීන් අතරින් සාතිශය බහුතරය (68%) පෙන්වා දෙන පරිදි සීමිත ඇණවුම් ප්‍රමාණයක් ලැබීම හා එසේ ලැබෙන ඇණවුම්වල පවතින අවිනිශ්චිතභාවය ඔවුන් අත්විඳින ප්‍රධානතම ගැටලුව වේ. මෙම තත්ත්වය ප්‍රබල ලෙස බලපා ඇත්තේ මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්කවල එළවළු ගොවීන්ටයි (පිළිවෙළින් 90% හා 91% ක් ගොවීන්ට). අපනයනය ඉලක්ක කර ගනිමින් බහුල වශයෙන් හරිතාගාර එළවළු නිපදවන බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවීන්ට එය ප්‍රබල ගැටලුවක් නොවේ. ඔවුන් අතරින් 21%ක් පමණක් මේ ගැටලුවට මුහුණපා ඇත. එළවළු නිෂ්පාදනය ඉහළ ගිය අවස්ථාවලදී සැපයුම්කරුවන්ට ලැබෙන ඇණවුම් සුළු වශයෙන් හෝ සියලුම නිෂ්පාදකයන් අතර බෙදී යාම හේතුවෙන් මෙසේ ඇණවුම් ප්‍රමාණය සීමා වේ. එවිට ගොවියාගේ නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් දේශීය වෙළඳපළට සැපයිය යුතු වේ.

තවද ගොවීන් වෙත වසර

දෙසැම්බර් සහ ජනවාරි

දී අවම ඇණවුම් ප්‍රමාණය

බොහෝ දුරට බැඳී පවතී.

එළවළු වර්ගවල ප්‍රධානත


ව්‍යාපාරය තීව්‍ර ලෙස ක්‍රි


නිර්මාණය වේ. මාලදිවයි


හා ජූලි මාසවල දී දේශීය


ව්‍යාපාරයේ සිදුවන උච්ච

කරන ප්‍රධාන සාධකයක්






මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**ප්‍රස්තාර අංක 3.9: දිස්ත්‍රික්ක හා මාස අනුව වැඩිම ඇණවුම්වල ව්‍යාප්තිය**

ප්‍රස්තාර අංක 3.9න් දැක්වෙන පරිදි බදුල්ල දිස්ත්‍රික්කයේ සියලුම ගොවීන් හරිතාගාර බෝග නිපදවන්නන් වූ අතර ඔවුන්ගේ සැපයුම වසර පුරා අඛණ්ඩව පවතී. ඔවුන් වෙත අඛණ්ඩ ඉල්ලුමක් ද පවතී. බදුල්ලේ හරිතාගාර පොදු සමාගම මගින් සිය සාමාජිකත්වයේ සියලුම නිෂ්පාදන මිලදී ගන්නා අතර ඒවා අපනයන ඇණවුම් සැපිරීමට මෙන්ම දේශීය වෙළඳපොළ නිකුත් කිරීමට ද භාවිතා වේ. එබැවින් බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවීන්ට සෑම මාසයකදීම යම් ඇණවුම් ප්‍රමාණයක් පැවතීම සඳහා ඔවුන් සංවිධාන ගත වී සිටීම රුකුලක් වී ඇත.

අනෙකුත් දිස්ත්‍රික්ක මෙන් නොව නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවීන්ට අප්‍රේල් සිට ජූලි දක්වා කාලය තුළ සාපේක්ෂ වශයෙන් ඉහළ ඇණවුම් සංඛ්‍යාවක් ලැබී ඇත (ප්‍රස්තාර අංක 3.9). ඊට හේතුව දේශීය සංචාරක කාල පරාසය තුළ මෙම එළවළු සඳහා ඉහළ ඉල්ලුමක් නිර්මාණය වීමයි. මෙහිදී සැපයුම්කරුවන් මිලදී ගන්නා නිෂ්පාදන දේශීය සංචාරක හෝටල් සඳහා ලබා දීම සිදු කරයි.

පහත රට එළවළු වර්ග පමණක් අපනයනය සඳහා සපයා ඇති මාතලේ දිස්ත්‍රික්කයේ තත්ත්වය අනෙකුත් දිස්ත්‍රික්ක දෙකටම වඩා වෙනස් ස්වරූපයක් උසුලයි (ප්‍රස්තාර අංක 3.9). එම එළවළු සඳහා සුපුරුදු පරිදි ජනවාරි, නොවැම්බර් හා දෙසැම්බර් මාසවල වැඩිම ඇණවුම් ලැබෙන අතර අනෙකුත් මාසවල දී සැලකිය යුතු තරම් ඇණවුම් ලැබී ඇති බව දත්තවලින් පැහැදිලි වේ. පහත රට එළවළු බොහෝ දුරට මැදපෙරදිග ශ්‍රී ලාංකිකයින්ගේ පරිභෝජනය උදෙසා අපනයනය කරන අතර මාස් පතා එම එළවළු සඳහා පවතින අඛණ්ඩ ඉල්ලුම පහතරට එළවළු සඳහා පවතින ඇණවුම්වල අවම විචලතා වාර්තාවීමට හේතු වී ඇත.

සාමාන්‍යයෙන් ගොවීන් වෙත අපනයන ඇනවුම් ලබා දෙන්නේ එළවළු අවශ්‍ය දිනට පෙර දින බව සියලුම දිස්ත්‍රික්කවලින් වාර්තා විය. අපනයනකරුවෙකු වෙත ඇණවුමක් ලැබුණු පසු ඒ පිළිබඳව තම සැපයුම්කරු හෝ අතරමැදි සැපයුම්කරුවන් හෝ තම සැපයුම් ජාලයට අයත් ගොවීන් දැනුවත් කරනු ලැබේ. එම දැනුවත්වීම අනුව ක්‍රියාත්මක වන ගොවීන් ඔවුන් සතුව පවත්නා බෝග අනුව ඇණවුම් සඳහා එළවළු සපයනු ලැබේ. සැපයුම්කරු ඇණවුම් ලබාදීමෙන් අනතුරුව නිශ්චිත දිනට නොපැමිණීමෙන් එළවළු අපතේ යාමත්, ඇණවුම් කළ ප්‍රමාණය එලෙසම රැගෙන නොයාමත් හේතුවෙන් ඇණවුම මුළුමනින්ම හෝ කොටසක් ප්‍රතික්ෂේප වේ.මෙයට හේතු කිපයක් බලපා තිබුණි. එනම්,

- i එළවළු නිසි ප්‍රමිතියට නොමැති වීම.
- ii සැපයුම්කරු වටා ඒකරාශී වී සිටින ගොවීන් අතර ඇණවුම් බෙදා හැරීම.
- iii අදාළ ඇණවුම් ලබා දෙන විදේශික නියෝජිතයන් හදිසි දැනුම්දීම හරහා ඇණවුම් අඩු කිරීම/ ප්‍රතික්ෂේප කිරීම.
- iv සැපයුම්කරුට වෙනත් ස්ථානයකින් අඩු මිලට එළවළු සපයා ගැනිමට හැකි වීම.

තවද එක් එක් කාලසීමාව තුළ ලැබෙන ඇණවුම්වල සංයුතිය පවා වෙනස්වන බව වගු අංක 3.24 හා 3.25 මගින් පැහැදිලි වේ.

**වගු අංක 3.24 : වසරේ වැඩිම ඇණවුම් ලැබෙන එළවළු වර්ග හා මාස**

| දිස්ත්‍රික්කය | මාසය | එළවළු වර්ග |
|---|---|---|
| බදුල්ල | ජනවාරි | බෙල්පෙපර්, තක්කාලි, පිපිඤ්ඤා |
| | නොවැම්බර් | |
| | දෙසැම්බර් | |
| නුවරඑළිය | ජනවාරි | සලාද, සුකිනි, කැරට් |
| | අප්‍රේල් | සිකිනි, සලාද, බීට් |
| | දෙසැම්බර් | ලීක්ස්, සුකිනි, බීට්, චයිනීස් ගෝවා |
| මාතලේ | ජනවාරි | වැටකොළු, පතෝල, මැකරල්, කරවිල |
| | නොවැම්බර් | පතෝල, මැකරල්, මාළුමිරිස් |
| | දෙසැම්බර් | පතෝල, වැටකොළු, මැකරල්, කරවිල |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

වගු අංක 3.25: වසරේ අඩුම ඇණවුම් ලැබෙන එළවළු වර්ග හා මාස

| දිස්ත්‍රික්කය | මාසය | එළවළු වර්ග |
|---|---|---|
| බදුල්ල | මාර්තු | බෙල්පෙපර්, තක්කාලි, පිපිඤ්ඤා |
| | මැයි | |
| | ජූනි | |
| නුවරඑළිය | පෙබරවාරි | සුකිනි, ලීක්ස්, චයිනීස් ගෝවා |
| | මාර්තු | බීට් |
| | සැප්තැම්බර් | තක්කාලි |
| මාතලේ | ජූනි | වැටකොළු, පතෝල, මැකරල්, කරවිල |
| | ජූලි | පතෝල, කරවිල |
| | සැප්තැම්බර් | කරවිල, එළබටු |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014.

මෙසේ මාසික වශයෙන් හා ඇණවුමෙන් ඇණවුමට සිදුවන විචලතා හමුවේ ගොවීහු සැලසුම් සහගත ලෙස එළවළු නිෂ්පාදනයට යොමු නොවෙති. ඒ වෙනුවට එකිනෙකාට පොදු තීරණ ගැනීමේ රටාව මත පදනම් වෙමින් සිය ගොවිපළ පද්ධති පවත්වා ගෙන යනු ලබන අතර එමඟින් අවශ්‍ය අවස්ථාවන්හි දී අවශ්‍ය ප්‍රමාණවලින් ඇණවුම් සම්පූර්ණ කිරීමට අපහසු වේ.

### 3.7.2 නිෂ්පාදන අපනයන ප්‍රමිතියට අනුකූල නොවීම

සියලුම නිෂ්පාදන අපනයන ප්‍රමිතියෙන් යුක්ත නොවීම දෙවනුවට ප්‍රමුඛ (43%) ගැටලුව වේ. අපනයන ප්‍රමිතීන්ට අනුකූල වූ ඉහළ ගුණාත්මයෙන් යුත් එළවළු අස්වැන්නක් ලබා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම ගොවීහු කෘෂි ව්‍යාප්ති සේවාවෙන් අපේක්ෂා කරති. එනමුත් වර්තමානයේ එළවළු වගාවේ රෝග පළිබෝධ ආසාදන ඉහළ යමින් පවතින බවටත්, ඒවා මර්දනය සඳහා වැඩි වියදමක් දැරීමට සිදුවන බවටත් ගොවීහු මැසිවිලි නඟති. රෝග පළිබෝධ හේතුවෙන් අපනයන වෙළඳපළ සඳහා එළවළු සැපයීමට අසමත් වූ ගොවීන් අධ්‍යයනයේ දී හමු විය. පැළ මැක්කාගේ හානිය මඟින් කරවිල වකුටුවීම ඊට එක් නිදසුනකි. පළිබෝධ පාලනය සඳහා රසායන ද්‍රව්‍ය භාවිතය පවා අසාර්ථක වී පරිභෝජනයට නුසුදුසු බැවින් ඉවත දැමීමට සිදුවන එළවළු ප්‍රමාණය ද සාපේක්ෂව ඉහළ ගොස් ඇත. මෙම රෝගවලට පිළියම් ලබා ගැනීම හා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා ගැනීම අත්‍යවශ්‍ය වන නමුත් කෘෂි ව්‍යාප්ති නිලධාරීන් වගා ක්ෂේත්‍රවලට පැමිණීම ඉතාම

පහළ මට්ටමක පවතින බව ගොවීහු ප්‍රකාශ කරති. සමස්ත නියැදියේ 35% ගොවි ප්‍රතිශතයකට කිසිදු උපදෙසක් ලැබී නොමැත. දිස්ත්‍රික්ක වශයෙන් සැලකීමේ දී එසේ ව්‍යාප්ති සේවාවන් නොලද ගොවී ප්‍රතිශතයන් බදුල්ලෙන් 14%ක්, නුවරඑළියෙන් 50%ක් හා මාතලෙන් 42%ක් වශයෙන් විය.

මෙම ගොවීන්ගේ ප්‍රධාන අවශ්‍යතාව වී ඇත්තේ තම වගාවෙන් අපනයන ප්‍රමිතියට සරිලන අස්වනු ලබා ගැනීම වන අතර නිසි උපදෙස් හා දැනුම ලබා දෙන්නේ නම් අපනයනය සඳහා උසස් ප්‍රමිතියෙන් යුතු එළවළු නිෂ්පාදනය කිරීමට තමන්ට හැකි බව ගොවි සාකච්ඡාවල දී ප්‍රකාශ විය. නියමිත ප්‍රමිතියට එළවළු වගා කිරීම, ප්‍රදේශයට අදාළ සුදුසු බෝගය තෝරා ගැනීම, හරිතාගාර පාලනය, වැඩි ඵලදාව සහිත බීජ සපයා ගැනීම හා අපනයනය සඳහා එළවළු වගාවේදී තාක්ෂණය භාවිතය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම කෘෂි ව්‍යාප්ති සේවයෙන් අපේක්ෂා කරන අතර එළවළු අපනයනය සඳහා සැපයීමේ දී නිසි මඟ පෙන්වීමක් ද බලාපොරොත්තු වෙයි.

තවද දේශගුණික බලපෑම හේතුවෙන් අවාරයේ දී නිෂ්පාදනවල ගුණාත්මය අඩුවන බැවින් ඇණවුම් නිසි පරිදි සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් එළවළු ප්‍රමාණයක් සපයා ගැනීමට ගොවීහු අසමත් වෙති. වගාවේ වර්ධන අවධිය අනුව අපනයන තත්ත්වයේ එළවළු නෙළා ගත හැකි ප්‍රමාණය වෙනස් වන අතර ආරම්භයේ දී ගුණාත්මයෙන් වැඩි එළවළු වැඩි ප්‍රමාණයක් සැපයිය හැකි නමුත් වගාවේ අවසාන කාලවලදී එසේ කළ නොහැක. අස්වනු මුරය අනුව නෙළා ගත හැකි අස්වැන්න වෙනස් වන ආකාරය පිළිබඳ ගොවි මහතුන්ගේ ඇස්තමේන්තුවක් වගු අංක 3.26 මගින් දැක් වේ.

**වගු අංක 3.26 : අස්වනු මුරය අනුව අපනයන තත්ත්වයේ එළවළු නෙළා ගත හැකි ප්‍රමාණය වෙනස්වීම**

| මුරය | අපනයන තත්ත්වයේ අස්වනු ප්‍රමාණය |
|---|---|
| 01 | 85% |
| 02 | 90% |
| 03 සිට 08 දක්වා | 60% |
| 09 සිට 20 දක්වා | 20% |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

මෙකී අවිනිශ්චිත තත්ත්වය තුළ සැපයුම්කරුවන් හා අපනයනකරුවන් ගොවීන්ට නිශ්චිත ඇණවුම් ලබා දීමට මැලි වන අතර ගොවීන් ද ලැබෙන ඇණවුම් සම්පූර්ණ කිරීම සඳහා විශේෂයෙන් හැඩ ගැසෙන්නේ නැත.

ගුණාත්මක බීජ හිඟය සහ ගුණාත්මයෙන් අඩු පොහොර භාවිතය අපනයන ප්‍රමිතියෙන් යුත් එළවළු නෙළා ගැනීම සඳහා පවතින අනෙකුත් බාධාවන් වේ. ගොවීන් සිය වගා කටයුතු සඳහා බීජ සපයා ගැනීම ආකාර කීපයකින් සිදු කර තිබුණි. ස්වයං බීජ නිෂ්පාදනය, බීජ හුවමාරු කර ගැනීම හා ආනයනය කළ බීජ භාවිතය එම ආකාර තුන වේ. හරිතාගාර තුළ එළවළු වගා කිරීමේ දී ආනයනය කළ බීජ වර්ග භාවිතවන අතර අනෙකුත් අවස්ථාවන් හි දී බොහෝ විට දේශීය බීජ වර්ග භාවිතා වේ. කවර අන්දමින් බීජ සපයා ගනු ලැබුව ද, බීජවල අඩු ගුණාත්මය පිළිබඳව අදහස් දැක්වූ ගොවි ප්‍රතිශතය 84%කි. දශක දෙකකට පමණ ආසන්න කාල සීමාව තුළ තමන් භාවිතා කළ බීජවලින් ලබා ගත හැකි අස්වැන්න ක්‍රමෙන් අඩු වෙමින් පවතින බවත් සමහර බීජ වර්ග වගා කළ විට එලදාව ලැබෙන තුරු කුමන වර්ගයේ එල නෙළා ගත හැකි වේ ද යන්න අවිනිශ්චිත බවත් ගොවීන්ගේ මතය වේ.

වසර ගණනාවක් තිස්සේ හරිතාගාර බෝග වගා කිරීම සඳහා ආනයනය කරනු ලබන බීජවල අඩු ගුණාත්මය හේතුවෙන් ලබා ගත හැකි අස්වැන්න අඩු වෙමින් පවතින අතර අපනයන ප්‍රමිතීන්ට අනුව අස්වනු නෙළා ගත නොහැකි බව නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වේ. තවද ආනයනික බීජ භාවිතයේ දී බෝග ලෙඩ රෝගවලට ගොදුරු වන අතර එය මර්දනය කිරීම සඳහා කෘමි හා වල් නාශක වැඩි වාර ගණනක් යෙදීමට සිදුවීමෙන් නිසා නිෂ්පාදන වියදම ඉහළ යයි. මේ හේතුව නිසා අපනයනයට සුදුසු තත්ත්වයේ නිෂ්පාදන සපයා ගැනීමට නොහැකි වී ඇත. උදා: බ්‍රොකෝලි සඳහා ඉහළ ඉල්ලුමක් විදේශ රටවල පැවතුණ ද බ්‍රොකෝලි හිඟයක් රට තුළ පවතී. මාර්තු මස මෙම බෝගයේ බීජ රෝපණය කළ යුතු අතර මැයි මාසයේ අස්වනු නෙළීම සිදු කරයි. අවශ්‍ය අවස්ථාවල දී බ්‍රොකෝලි සැපයීමට නොහැකිවීමට ප්‍රධාන හේතුව බීජ හිඟය වේ.

එළවළු වගාව සඳහා බොහෝ දුරට රසායනික පොහොර භාවිතා කරන අතර පොහොර නිසි ප්‍රමිතියෙන් යුක්ත නොවන බවට ගොවීන් අදහස් ප්‍රකාශ කරන ලද්දේ නිදසුන් ගෙන හැර පාමින්ය. ගෝවා වගාව සඳහා පොහොර යෙදූ විට ගෝවා අල බැසීම සිදු වේ. එබැවින් එළවළුවල ප්‍රමිතිය ආරක්ෂා කර ගත නොහැකිවී ඇත. සම්පූර්ණයෙන් කාබනික පොහොර භාවිතා කර අපේක්ෂිත අස්වනු ලබා ගත නොහැකි බවද ගොවීන්ගේ මතය වේ.

### 3.7.3 මිල ප්‍රමාණවත් නොවීම හා මිල උච්චාවචනය වීම

බොහෝ ප්‍රදේශවල ගොවීහු තම නිෂ්පාදන අපනයන වෙළඳපොළට යොමු කිරීම එක් සැපයුම්කරුවෙකු හෝ දෙදෙනෙකු මගින් සිදු කරති. සැපයුම්කරුවන් සීමිත සංඛ්‍යාවක් සිටීම ගොවි නිෂ්පාදන වැඩි ප්‍රමාණයක් වෙත ඇණවුම් ලැබීමට බාධාවක් වී ඇත. එළවළු අපනයනයේ තිරසාර පැවැත්ම සඳහා ගොවියාට ඉහළ මිලක් ලබාදීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ සඳහා තරඟකාරිත්වයකින් යුතුව නිෂ්පාදන මිලදී ගැනීමේ පසුබිමක් නිර්මාණය වී නැත. එබැවින් මිල තීරණයවීමේ දී සැපයුම විශාල ලෙස බලපෑමක් කරනු ලැබේ.

මෙම අධ්‍යයනයෙන් ද තහවුරු වූ පරිදි එළවළු මිල අස්ථාවරවීම සියලුම දිස්ත්‍රික්කවල ගොවීන්ට එක සේ බලපා ඇත. එළවළු මිල පහත වැටුණු අවස්ථාවල දී සුපිරි වෙළඳපොළ සමඟ සබඳතා පවත්වන ගොවීන් එමගින් අපනයන මිලට වඩා ඉහළ මිලක් ලබා ගත හැකි නම් අපනයනය සඳහා එළවළු සැපයීම ප්‍රතික්ෂේප කරන අවස්ථා ද ඇත.

තමන්ගේ එළවළු වගාව සඳහා ලබාගත් පොහොර හා කෘෂි ණය ආදී ගෙවීම් ඇතුළු එදිනෙදා ගේ දොර අවශ්‍යතා සඳහා ගොවීන්ට තම අස්වනු අලෙවි කළ සැනින් මුදල් අවශ්‍ය වේ. සැපයුම්කරුවන් ගොවීන්ට මුදල් ලබාදීම ආකාර කීපයක් යටතේ සිදුකර තිබුණි. සමස්ත නියැදියේ 40%කගේ නිෂ්පාදන ලබා ගත් සැනින් ඒ ඒ ගොවීන්ට මුදල් ලබාදී තිබුණි. මුදල් ගෙවීම සඳහා මාසයකට වැඩි කාල සීමාවක් ගතවූ නියැදි ප්‍රතිශතය 32%ක් විය. ඉතිරි ගොවීන් සඳහා (28%) සතියක් හෝ සති දෙකක් ඇතුළත මුදල් ලබාදී තිබුණි. මෙම මුදල් ගෙවීමේ ප්‍රමාදයන් දරා සිටීමේ හැකියාව බොහෝ ගොවීන් සතු නොවුණි.

### 3.7.4 තේරීම මගින් එළවළු ප්‍රතික්ෂේප වීම හා තේරීමේ අක්‍රමිකතා

අපනයන ප්‍රමිතීන්ට සරිලන පරිදි එළවළු තේරීමේ දී යම් ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වීම සිදුවේ. අපනයනය සඳහා තෝරා ගන්නා සෑම එළවළුවක්ම පොදුවේ රෝග පළිබෝධවලට ගොදුරු නොවී තිබිය යුතුය. අනවශ්‍ය කරම් මෝරා නොතිබිය යුතුය. තැලීම් හා සීරීම්වලින් තොර විය යුතුය. එක් එක් එළවළු වර්ගයට හා ඇණවුම් ලබා දෙන ප්‍රභේදවලට අදාළ වර්ණවලින් යුක්ත විය යුතුය. පැහැපත් විය යුතුය. ඒ හැරුණු කොට එක් එක් එළවළුවල තිබිය යුතු විශේෂිත ප්‍රමිතීන් වගු අංක 3.27 මගින් දක්වා ඇත

වගු අංක 3.27 : එළවළු තේරීමේ ප්‍රමිතීන්

| එළවළු වර්ගය | තේරීමේ ප්‍රමිතීන් |
|---|---|
| ගෝවා | ගෙඩියක බර ග්‍රෑම් 800-1000 අතර |
| ලීක්ස් | ගසක බර ග්‍රෑම් 300ක් පමණ |
| තිබ්බටු | නටුව රහිත එකම ප්‍රමාණයේ ගෙඩි |
| තලන බටු | බටු ගෙඩියේ පැහැදිලි වර්ණය හා නටුව ගුරු පාට වීම |
| වම්බටු | ගෙඩියක දිග අඟල් 8ක් පමණ, ලේන ඉරි බටුවලට විශේෂ ඉල්ලුම |
| දඹල | මධ්‍යම ප්‍රමාණයේ කොළපාට කරල්, දාරවලට හානි නොවීම |
| අමු මිරිස් | K 1 හා K 2 ප්‍රභේද සඳහා වැඩි ඉල්ලුම, පැහැදිලි කොළ වර්ණය |
| මාළු මිරිස් | තද කහ වර්ණය |
| වැටකොළු | සෘජු කොළපාට පිරිපුන් කරල්, දාරවලට හානි නොවීම |
| පතෝල | අඩි 3ක් පමණ දිග සෘජු කරල් |
| මුරුංගා | කොළ පැහැති වර්ණයෙන් යුත් පිරිපුන් කරල් |
| සුකිනි | වර්ණය කොළ හෝ කහපාට කිලෝ එකකට වඩා බර අඩු පිරිපුන් ගෙඩි |
| බණ්ඩක්කා | අඟල් 4ක් පමණ දිග ළපටි කරල් |
| මෑකරල් | තද කොළ වර්ණය |
| කරවිල | තද කොළ පැහැති පිරිපුන් කරල් |

**මූලාශ්‍රය: හෙ.කො.ගො .ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014.**

එළවළු ප්‍රමිතිකරණයේ දී ගෝවා ගෙඩියකින් ග්‍රෑම් 250ක් බර මතුපිට කොළ ඉවත් කිරීමට සිදු වේ. ලීක්ස් ගසකින් ග්‍රෑම් 50ක පමණ කොළ ඉවත් වන අතර තිබ්බටුවල නටුව ඉවත් කිරීම නිසා බර අඩු වේ. අවසානයේ මේ සියල්ල ගොවියාගේ වැය පක්ෂය ඉහළ නංවන බව ගොවීන්ගේ අදහස වේ. එබැවින් සමස්ත නියැදියේ 30%ක ප්‍රතිශතයක් එළවළු තේරීම පිළිබඳ අතෘප්තිමත්ය. වගා ක්‍රමය හා අපනයන දායකත්වය අනුව වර්ග කළ සියලුම ගොවීන්ට මෙය එකසේ බලපා ඇත.

එළවළු තේරීම සඳහා ගොවීන්ට අමතර කාලයක් ගත වේ. අමතර ශ්‍රමිකයින් යෙදීමට සිදු වේ. සමහර ගොවීන්ට තේරීමේ ප්‍රමිතිය පිළිබඳ මනා අවබෝධයක් ද නැත (බදුල්ල 7%, නුවරඑළිය 9%, මාතලේ 18%). අපනයන දායකත්වය ඉහළ ගොවීන් අතර තේරීම පිළිබඳ දැනුම අනෙකුත්

ගොවීන්ට වඩා ඉහළ මට්ටමක පැවතුණි. එනමුත් එළවළුවල හොඳම කොටස තේරීම මගින් ඉතිරි එළවළු සඳහා අඩු මිලක් නියම වීම පිළිබඳව ගොවීන් අතෘප්තිමත්ය.

ප්ලාස්ටික් බහාලුම් භාවිතයේ පවතින දුෂ්කරතා එළවළු තේරීමේ දී ප්‍රතික්ෂේප වන ප්‍රමාණය ඉහළ නංවා ඇත. ප්ලාස්ටික් බහාලුමක ගෝනියකට සාපේක්ෂව අඩු එළවළු ප්‍රමාණයක් පමණක් ඇසිරිය හැක. ප්ලාස්ටික් බහාලුමක අසුරා ගොවිපළේ සිට නිවසට ගෙන ඒමට සිදුවන වාර ගණන වැඩි ය. ගෝනියක ඇසිරීම සිදු කරන්නේ නම් එවන් 5-6 ගුණයක එළවළු එකවර ගෙන ඒමට හැකිය. තවද කඳු ප්‍රදේශවල සිට කුලීකරුවන් මාර්ගයෙන්ද ප්ලාස්ටික් බහාලුම් ප්‍රවාහනය සිදු වේ. එවිට එක් අයකුට හිස මත ගෙනයා හැක්කේ එක් ඇසුරුමක් පමණි. එමගින් අවශ්‍ය ශ්‍රමිකයන් සංඛ්‍යාව දෙගුණයකි. මෙය එළවළු ප්‍රවාහන වියදම වක්‍ර ලෙස වැඩිවීමකි.

බදුල්ල දිස්ත්‍රික්කයේ ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය දුෂ්කරවී තිබුණේ අධික කඳු හා දුෂ්කර මාර්ග පද්ධතිය නිසාවෙනි. තවද ඇසුරුම් විශාල බැවින් පරිහරණයට අපහසුවීම, වාහන භාවිතයේ දී අඩු එළවළු ප්‍රමාණයක් රැගෙන යාමට ඉහළ මිලක් ගෙවීමට සිදුවීම, නැවත ගෙන ඒමේදී ද ප්‍රවාහන වියදමක් දැරීමට සිදුවීම, බහාලුම් සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදුවීම, වෙළඳපළ තුළ බහාළුම් හිඟවීම හා බහාළුම් හැසිරවීමේ දී අනතුරු සිදුවීම වැඩිවීම ප්ලාස්ටික් බහාළුම් භාවිතය ආශ්‍රිත ගැටලු වේ. එබැවින් එළවළු ප්‍රවාහනයේ දී ගොවියෝ විශාල වශයෙන් ගෝනි හෝ දැල් ගෝනි භාවිතා කරති. දැල් ගෝනිවල ඇසිරිය හැකි උපරිමය තැන්පත් කර අත් ට්‍රැක්ටර් හෝ ලොරිවල ප්‍රවාහනය කිරීමේ දී විශාල වශයෙන් තැලීම් හා සීරීම්වලට භාජනය වේ. ඒවා අපනයනය සඳහා සැපයීම අපහසුය. එමගින් තේරීමේ දී වැඩි එළවළු ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වේ.

විශේෂයෙන් අස්වනු වැඩි අවස්ථාවල දී සැපයුම්කරුවන් තේරීම් ක්‍රමවේදයට වැඩි බර තැබීමක් කර නිෂ්පාදනයෙන් වැඩි කොටසක් නුසුදුසු ගණයෙහි ලා අඩු මිලකට ගනු ලැබේ. නමුත් අස්වනු අඩුවී ඇණවුම් සැපිරීමට ප්‍රමාණවත් නොවන කාලවල දී මෙම තේරීම් ක්‍රමවේදයම භාවිතා කළත් නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් අපනයන ප්‍රමිතීන්ට අනුකූලබව සලකා මිලදී ගනී. සැපයුම්කරුවන්ගේ මෙවැනි ක්‍රියාදාමයන් තුළ ගොවීයාගේ නිෂ්පාදනයට ලැබිය යුතු වටිනාකම අහිමි වී ඇත. තවද සැපයුම්කරු/අපනයනකරු වෙතින් කීප වතාවක් එළවළු තේරීමට ලක්වීමෙන් එළවළුවලට හානි වේ. ඔවුන් එළවළු ශ්‍රේණි දෙකකට වර්ග කර දෙවන ශ්‍රේණිය සඳහා ගොවියාට අඩු මිලක් ලබාදී එකම ශ්‍රේණිය යටතේ අපනයනකරුට අලෙවි කරන බව සමහර ගොවීන්ගේ මතය වේ. මෙය එළවළු තේරීම වංචනික ලෙස භාවිතා කිරීමකි.

### 3.7.5 නිෂ්පාදන අලෙවි සබඳතා දුර්වලවීම

බහුතරයක් ගොවීහු ආර්ථික මධ්‍යස්ථාන හා ඒ අවට ප්‍රාදේශීය ව්‍යාපාරික ස්ථානවලට හා වෙළඳපොළවලට තම නිෂ්පාදන අලෙවි කරන අතර එම වෙළඳසැල්වලින් ණය පදනම මත බීජ, රෝපණ ද්‍රව්‍ය, කෘෂිරසායනික පොහොර ආදී යෙදවුම් මෙන්ම මුදල් ද ලබා ගනිති. ඒ තම අස්වනු අදාළ වෙළඳසැළට අලෙවි කරන පදනම මතය. නැවත ණය මුදල් අයකර ගැනීම සිදුවන්නේ අස්වනු අදාළ වෙළඳසැළට අලෙවි කිරීමෙන් අනතුරුව ය. වෙනත් අපනයනකරුවෙකුට හෝ අපනයන සැපයුම්කරුවෙකුට තම අස්වැන්නේ ගුණත්වයෙන් ඉහළ කොටස අලෙවි කර වැඩි ආදායමක් උපයා ගැනීම සඳහා ගොවීන් අතරින් 40%ක් කැමති වුවත් ඒ පිළිබඳව ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාපාරිකයෝ අප්‍රසාදය පළ කරති. ගොවීන් එසේ සිදු කරන අවස්ථා අනාවරණය වූ විට ගොවීන් හා ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාපාරිකයන් අතර පවතින සුහද සබඳතා පලුදු වී යන අතර ගොවියාගේ නිෂ්පාදන මිලදී නොගැනීමට ව්‍යාපාරිකයෝ පෙළඹෙති. එය ආර්ථික වශයෙන් දුර්වල ගොවීන්ට දැඩි පීඩනයකි.

### 3.7.6 ණය ලබා ගැනීමේ දුෂ්කරතා

ගොවීන්ට අවශ්‍ය ආකාරයට ණය ලබා ගැනීමට විශේෂ පහසුකම් නැත. ගොවිජන බැංකුවෙන් ණය ලබා ගැනීමට ගොවීන් කණ්ඩායම් ලෙස ඉදිරිපත් විය යුතු අතර එක් ගොවියෙකු හෝ ණය ගෙවීමට අපොහොසත් වුවහොත් ඔවුන් සියලුදෙනාටම නැවත ණය දීම ගොවිජන බැංකුව ප්‍රතික්ෂේප කරයි. එම නිසා ණය බලාපොරොත්තු වන ගොවීන්ට ණයක් ලබා ගැනීමට පහසු මාර්ගය අහිමි වී යයි. සමහර ගැණුම්කරුවෝ අත්පිට මුදලට ගණුදෙනු සිදු නොකරන අතර සති දෙක තුන ප්‍රමාද වී ගොවියන්ට මුදල් ලබාදෙති. මෙම තත්ත්වය ණය ආපසු ගෙවීම සඳහා බාධකයක් වී ඇත.

ණය ලබාගැනීමට රජයේ හෝ පුද්ගලික අංශයේ සේවයේ ඇපකරයක් අවශ්‍යවන අතර එවැනි පුද්ගලයන් සොයා ගැනීමට ගොවීන්ට අපහසුය. බැංකුවකින් ණය ලබා ගැනීමේ දී ඇප සඳහා නිරවුල් ඔප්පු අවශ්‍ය වන අතර නිරවුල් ඉඩම් නොමැතිවීමෙන් ගොවීන්ට තම වත්කම පෙන්වීමට නොහැකි වී ඇත. එබැවින් තනි තනිවම ණය ලබා ගැනීමට නොහැකිවීම ද විශාල ගැටලුවක් බව ගොවි සාකච්ඡාවල දී පැහැදිලි විය. සමස්ත නියැදියේ 42%කට ණය ලබා ගැනීම ආශ්‍රිත ගැටලු පැවතුණි. මෙය දිස්ත්‍රික් වශයෙන් සැලකීමේ දී බදුල්ල 21%ක් නුවරඑළිය 55%ක් හා මාතලේ 50% වශයෙනි.

විශේෂයෙන් හරිතාගාර ඉදි කිරීම සඳහා සැලකිය යුතු පිරිවැයක් දැරීමට සිදුවීම තුළ ගොවීන්ට ඒ සඳහා යොමුවීමට අපහසු වී ඇත. බදුල්ල දිස්ත්‍රික්කය තුළ යකඩ බට භාවිතයෙන් හරිතාගාර ඉදි

කර තිබුණි. ලීවලින් තැනීමේ දී වර්ග අඩි 1000ක හරිතාගාරයක් සඳහා රු.100000ක් පමණ වැය වන බවත්, යකඩ බට ආශ්‍රයෙන් තැනීමේ දී වර්ග අඩි 1000ක හරිතාගාරයක් සඳහා රු.175,000 – 200,000ක් පමණ වැය වන බවත් අනාවරණය විය. මෙම ගොවීන් ණය ලබා ගැනීම සඳහා එතරම් උනන්දුවක් දක්වා නැති අතර ණය ලබා ගනු ලැබුව ද එම මුදල් බොහෝ දුරට හරිතාගාර අලුත්වැඩියා කිරීම සඳහා යොදවා තිබුණි.

### 3.7.7 මූල්‍ය ගනුදෙනුවල අක්‍රමිකතා

මුදල් ගෙවීම ප්‍රමාද වීම හා සමහර සැපයුම්කරුවන් විසින් එක් ඇණවුමක වටිනාකම රඳවා ගැනීම පිළිබඳව ගොවීන් අතෘප්තිමත්ය. නමුත් එම ගැටලුව නියැදියේ 2%කට පමණක් පොදුවේ.

ඉහත සඳහන් ගැටලු එක් එක් ගොවියාට විවිධ අයුරින් බලපා ඇති අතර නියැදියට අයත් වූ ගොවීන් තිස්දෙනෙකු (33%) තම ව්‍යාපාරයන්හි ප්‍රගතියක් අත්පත් කර ගැනීමට අසමත් වී ඇත. ඔවුන් අතරට බදුල්ලෙන් දහදෙනෙකු ද (35%), නුවරඑළියෙන් දෙදෙනෙකු ද (9%), මාතලෙන් දහඅටදෙනෙකු ද (45%) ඇතුළත් විය. සතියක කාලයක් තුළ සපයනු ලැබූ එළවළු ප්‍රමාණයේ පහත වැටීම අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය වගු අංක 3.28න් ඉදිරිපත් කර ඇත.

**වගු අංක 3.28: අපනයන කර්මාන්තය පසුබෑමකට ලක් වී ඇති ආකාරය**

| එළවළු සැපයුම පහත වැටීම (සතියකට කි. ග්‍රෑම්) | ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 5-50 | 13 | 43 |
| 51-250 | 14 | 47 |
| 251 - 800 | 03 | 10 |
| මුළු එකතුව | 30 | 100 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

ඉහතින් සඳහන් ගැටලු සහගත තත්ත්වයන් හමුවේ අපනයන ප්‍රමිතීන්ට අනුව ගුණාත්මක එළවළු නිපදවීමත් අවශ්‍ය ප්‍රමාණවලින් අවශ්‍ය අවස්ථාවන්හිදී ඇණවුම් කරන එළවළු වර්ග අඛණ්ඩව සැපයීම සඳහා සැලසුම් සහගත ලෙස එළවළු නිෂ්පාදනය කිරීමත් යන කරුණු පිළිබඳ සහතික වීම ගොවීන්ගේ වගකීමක් බවට පත්වී නැති බව මෙම අධ්‍යයනයෙන් තහවුරු වේ.

# සිව්වැනි පරිච්ඡේදය

# අපනයනය සඳහා එළවළු සැපයුම: ප්‍රතිලාභ හා ගැටලු

## 4.1 හැඳින්වීම

මෙම අධ්‍යයනයේ දී සැපයුම්කරු ලෙස අර්ථ දක්වන්නේ එළවළු අපනයන කර්මාන්තයේ දී ගොවීන් විසින් වගා කරන එළවළු අපනයනකරු වෙත සැපයීම සඳහා මැදිහත් වන අතරමැදියාය. කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි ක්ෂේත්‍රයේ දී 'අපනයනය සඳහා නිෂ්පාදන එකතු කරන්නා' ලෙස හැඳින්වීම වඩාත් උචිත වුවද මෙම වාර්තාව තුළ භාවිතයේ පහසුව උදෙසා 'සැපයුම්කරු' වශයෙන් හඳුන්වා ඇත. නියැදියට අයත් වූ ඉතා සුළු ගොවීන් සංඛ්‍යාවක් පමණක් අපනයනකරු වෙත සෘජුවම එළවළු සපයා ඇතත් ගොවීන් බහුතරයකගේ එළවළු අපනයනකරු වෙත ළඟා වන්නේ සැපයුම්කරුවෙකුගේ මැදිහත්වීම තුළිනි. ඉතා සුළු අවස්ථා ගණනකදී පමණක් මේ කාර්යය සඳහා සැපයුම්කරුවන් කීපදෙනෙක් සම්බන්ධ වන බව වාර්තා විය.

අපනයනකරුවන් ලබා දෙන ඇණවුම්වලට අනුව ගොවීන්ගෙන් එළවළු එකතු කර අපනයනකරු වෙත සැපයීම සහ එසේ එකතු කරන එළවළුවල ප්‍රමිතිය පාලනය කිරීම සැපයුම්කරුවන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ. ඒ හැරුණු කොට සැපයුම්කරුගෙන් සිදුවන අනෙකුත් සේවාවන් අතර අපනයන වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් වගා කටයුතුවල නියැළීම සඳහා ගොවීන් යොමු කිරීම, එළවළු තේරීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් පිළිබඳව ගොවීන්ට දැනුම ලබාදීම, ප්‍රවාහන පහසුකම් සැපිරීම හා මුදල් ගනුදෙනු සඳහා මැදිහත්කරුවෙකු වශයෙන් ක්‍රියාත්මක වීම ආදිය වේ. එබැවින් අපනයන වෙළඳපොළ වෙත අවශ්‍ය ප්‍රමාණවලින් හා අවශ්‍ය වේලාවන්හි දී ගුණාත්මක එළවළු සැපයීමේ ලා සැපයුම්කරුවන්ගේ කාර්යභාරයට විශේෂ තැනක් හිමිවේ.

අධ්‍යයන දිස්ත්‍රික්ක තුනේ දී හමුවූ සැපයුම්කරුවන් 26 දෙනෙකුගෙන් රැස් කළ දත්ත පදනම් කර ගනිමින් අපනයනය සඳහා එළවළු සැපයීමේ ක්‍රියාවලිය හා එමගින් ඔවුන් අත් කර ගත් ප්‍රතිලාභ මෙන්ම එම ක්‍රියාවලියේ දී ඔවුන් මුහුණපාන ගැටලු පිළිබඳව මේ පරිච්ඡේදයෙන් විග්‍රහ කෙරේ.

## 4.2 සැපයුම්කරුවන්ගේ සමාජ-ආර්ථික තොරතුරු

මෙම සමීක්ෂණයේ දී තොරතුරු රැස් කළ සැපයුම්කරුවන් 26 දෙනා අතරින් බහුතරයක් (69%) එළවළු වගා කටයුතුවල ද නියැළෙති (වගු අංක 4.1). ඔවුහු අපනයනකරුගෙන් ඇණවුමක් ලැබුන විට ඒ සඳහා අවශ්‍ය එළවළු තම ගොවිපලෙන් හෝ වෙනත් ගොවීන්ගෙන් ලබා ගෙන ඇණවුම් සම්පූර්ණ කරති. අනෙකුත් සැපයුම්කරුවෝ එළවළු සැපයුම පමණක් සිදු කරන අතර ඔවුන්ට ලැබෙන අපනයන ඇණවුම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය එළවළු තමා සමඟ සබඳතා පවත්වන ගොවීන්ගෙන් හෝ තොග වෙළඳපොළෙන් ලබා ගනිති (වගු අංක 4.2).

**වගු අංක 4.1 : එළවළු අපනයන කර්මාන්තයට ලබාදෙන දායකත්වය අනුව අධ්‍යයන දිස්ත්‍රික්ක තුළ සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය**

| සැපයුම්කරුවන්ගේ කාර්යය | බදුල්ල | නුවරඑළිය | මාතලේ | මුළු එකතුව | |
|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව | % |
| එළවළු සැපයීම පමණි | 01 | 04 | 03 | 08 | 31 |
| එළවළු සැපයීම සහ වගා කිරීම | 06 | 05 | 07 | 18 | 69 |
| | 07(27%) | 09(35%) | 10(38%) | 26 | 100 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**වගු අංක 4.2 : එළවළු සැපයුම්කරුවන් එළවළු ලබා ගන්නා ප්‍රභවයන්**

| එළවළු ලබාගන්නා ප්‍රභවයන් | සැපයුම්කරුවන් සංඛ්‍යාව | | | එකතුව | |
|---|---|---|---|---|---|
| | බදුල්ල | නුවරඑළිය | මාතලේ | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| නිත්‍ය නිෂ්පාදකයන් පමණි | 03 | - | 05 | 08 | 31 |
| නිත්‍ය නොවන නිෂ්පාදකයන් පමණි | 01 | 01 | 01 | 03 | 12 |
| ඉහත දෙවර්ගයම | 03 | 08 | 03 | 14 | 53 |
| තොග වෙළඳපොළ | - | - | 01 | 01 | 04 |
| මුළු එකතුව | 07 | 09 | 10 | 26 | 100 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

සැපයුම්කරුවන්ගේ අදහස්වලට අනුව එළවළු සැපයීම තරමක් දුෂ්කර කාර්යයකි. ලැබෙන ඇනවුමට අනුව විවිධ එළවළු වර්ග සපයා ගත යුතු අතර සමහර අවස්ථාවල දී ඒ සඳහා දින එකක පමණ වූ සීමිත කාල සීමාවක් පමණක් ලැබෙන බැවින් දිවා රාත්‍රී නොතකා එළවළු රැස් කිරීමේ නියැළිය යුතුය. එබැවින් සැපයුම්කරුවන් ලෙස ක්‍රියාත්මක වන්නේ පිරිමි පාර්ශ්වය පමණි. එළවළු සැපයීමේ කාර්යය සඳහා අවුරුදු 50 දක්වා වූ වයස් කාණ්ඩයේ සහභාගිත්වය 77%කි. මේ අතුරින් අවු. 30ට අඩු තරුණයන්ගේ සහභාගිත්වය 11%ක් වන අතර එය එක්තරා ධනාත්මක ලක්ෂණයක් බව සඳහන් කළ යුතුය (වගු අංක 4.3).

අපනයනය සඳහා එළවළු සැපයීමේ දී ලැබෙන ඇනවුම් විද්‍යුත් තැපැල මඟින් හෝ දුරකථන ඇමතුම් මඟින් ලබා දේ. ඒ අනුව සැපයුම්කරුවන්හට පරිගණක දැනුම තිබීම මේ කර්මාන්තයේ නියැළීම සඳහා වැදගත් වේ. එළවළු සැපයීමේ කාර්යය සිදු කිරීමට අපනයනකරු හා සෘජුව සම්බන්ධ වීම සඳහා ඉහළ අධ්‍යාපනයක් ලද පිරිසක් සම්බන්ධ වී ඇති බව නිරීක්ෂණය විය. අ.පො.ස. (සා.පෙ) සමත් හා ඊට ඉහළ අධ්‍යාපනය ලද සැපයුම්කරුවන්ගේ ප්‍රතිශතය 70%ක් වන අතර මේ අතුරින් උපාධි අපේක්ෂක/උපාධිධාරී ප්‍රතිශතය 4%කි. අපනයනකරුට එළවළු සපයන සැපයුම්කරු වෙත එළවළු සැපයීම සිදු කරන අතරමැදි කණ්ඩායමක් ද හඳුනා ගැනීමට හැකි විය.

**වගු අංක 4.3 : එළවළු සැපයුම්කරුවන්ගේ සමාජ-ආර්ථික තොරතුරු**

| සමාජ-ආර්ථික සාධක | ගොවීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| **වයස් කාණ්ඩය (අවුරුදු)** | | |
| 20-30 | 03 | 12 |
| 31-40 | 08 | 30 |
| 41-50 | 09 | 35 |
| 51-60 | 04 | 15 |
| > 60 | 02 | 08 |
| **අධ්‍යාපන මට්ටම** | | |
| ප්‍රාථමික අධ්‍යාපනය ලද (වසර 1-5) | 01 | 04 |
| ද්විතියික අධ්‍යාපනය ලද (වසර 6-11) | 07 | 27 |
| සාමාන්‍ය පෙළ සමත් | 12 | 46 |
| උසස් පෙළ සමත් හා වෘත්තිය අධ්‍යාපනය ලද | 05 | 19 |
| උපාධි අපේක්ෂක, උපාධිධාරී | 01 | 04 |
| **ප්‍රධාන රැකියාව** | | |
| අපනයනය සඳහා එළවළු සැපයීම | 10 | 40 |
| අපනයනය සඳහා එළවළු සැපයීම හා ගොවිතැන | 10 | 40 |
| රජයේ හා පෞද්ගලික අංශයේ රැකියා | 02 | 08 |
| ස්වයං රැකියා හා ව්‍යාපාර | 04 | 12 |
| **කර්මාන්තය සඳහා යොමුවූ ආකාරය** | | |
| වෙනත් සැපයුම්කරුවන් හරහා අපනයනකරු හඳුනා ගැනීම | 12 | 46 |
| අපනයනකරුවන්/සැපයුම්කරුවන්ගේ දැනුවත් කිරීම් අනුව | 14 | 54 |
| **අපනයනය සඳහා එළවළු සපයන ආකාරය** | | |
| අපනයනකරුට සෘජුවම එළවළු සැපයීම | 21 | 73 |
| සැපයුම්කරුවෙකු හරහා අපනයනකරුට එළවළු සැපයීම | 05 | 27 |
| **පවුලේ මාසික ආදායම (රු.)** | | |
| > 15,000 | 01 | 04 |
| 15,000 < 25,000 | 01 | 04 |
| 25,000 < 35,000 | 02 | 08 |
| 35,000 < 50,000 | 03 | 11 |
| 50,000 < 100,00 | 08 | 31 |
| 100,000 < | 11 | 42 |
| **පළපුරුද්ද (අවුරුදු)** | | |
| < 5 | 02 | 08 |
| 5 < 10 | 12 | 46 |
| 10 < 20 | 11 | 42 |
| 20 > | 01 | 04 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

අපනයනය සඳහා එළවළු සැපයීමේ අධික කාර්ය බහුලත්වය හේතුවෙන් වෙනත් රැකියාවක නිරතවීමට බොහෝවිට අවස්ථාව නොලැබේ. එබැවින් සැපයුම්කරුවන් බහුතරය (80%) එළවළු සැපයීම සිය ප්‍රධාන රැකියාව ලෙස තෝරා ගෙන ඇත. සැපයුම්කරුවන් බහුතරයක් (54%) අපනයනකරුවන් හෝ වෙනත් සැපයුම්කරුවන් සිදු කළ දැනුවත් කිරීම් මත මේ සඳහා යොමුවී ඇත. තවද සැපයුම්කරුවන් තමන් ලද ඇනවුම් සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් තරම් එළවළු නිත්‍ය නිෂ්පාදකයන්ගෙන් සපයා ගත නොහැකි විටදී වෙනත් ගොවීන්ගේ එළවළු ලබා ගැනීමට යොමුවීම තුළින් එම ගොවීන් ද ක්‍රමයෙන් අපනයනකරුවන් හඳුනා ගෙන සෘජු සැපයුම්කරුවන් බවට පත්ව ඇත. මීට අමතරව ස්වයං රැකියා හා ව්‍යාපාර සිදුකරන 12%ක ප්‍රතිශතයක් මේ කාර්යයට යොමුවී ඇත. වෙනත් රැකියාවක් සිදු කරමින් මෙයට යොමුවී ඇත්තේ 8%ක් වැනි සුළු ප්‍රතිශතයකි.

එළවළු සැපයුම්කරුවන්ගේ ආදායම් ව්‍යාප්තිය තුළින් මේ කාර්යයේ පවතින ලාභදායකත්වය පැහැදිලි වේ. එනම් මාසික ආදායම රුපියල් 35,000/-කට වැඩි සමස්ත නියැදි ප්‍රතිශතය 73%කි. මේ ප්‍රමාණයෙන් 42% ක් රුපියල් ලක්ෂයකට වඩා ඉහළ ආදායමක් ලබයි. එසේ ඉහළ ආදායම් ලබන ගොවීන් දිස්ත්‍රික්ක වශයෙන් සැලකීමේ දී බදුල්ල 43%ක්, නුවරඑළිය 45%ක් හා මාතලේ 40%ක් ලෙසින් වේ. මින් පැහැදිලි වන්නේ අපනයනය සඳහා එළවළු සැපයීම ආකර්ෂණීය ව්‍යවසායක් බවයි. සැපයුම්කරුවන් පිරිසක් (4%)ක් අවුරුදු 20කට වඩා දීර්ඝ කාලයක් එළවළු සැපයීමේ කාර්යයට සම්බන්ධ වී සිටීම තුළින් ද එය තහවුරු වේ. අවුරුදු 10ට අඩු කාලයක් ඊට සම්බන්ධ වූ ගොවි ප්‍රතිශතය 54%කි.

### 4.3 සැපයුම්කරුවන් විසින් එළවළු මිලදී ගැනීම

අධ්‍යයනයේ දී හමුවූ සැපයුම්කරුවන් විසිහයදෙනා විසින් අපනයනය සඳහා එළවළු වර්ග 42ක් සපයා ඇති බවත් අධ්‍යයන ප්‍රදේශ අනුව එසේ සපයනු ලැබූ එළවළු වර්ග වෙනස්වන බවත් දත්තවලින් තහවුරු වේ.

වගු අංක 4.4 : සැපයුම්කරුවන් විසින් මිලදී ගත් හා අපනයනය සඳහා සැපයූ එළවළු වර්ග හා ප්‍රමාණ (එක් කන්නයක් තුළදී) - බදුල්ල දිස්ත්‍රික්කය

| එළවළු වර්ගය | මිලදී ගත් ප්‍රමාණය | අපනයනය සඳහා සැපයූ ප්‍රමාණය | |
|---|---|---|---|
| | කි. ග්‍රෑම් | කි. ග්‍රෑම් | ප්‍රතිශතය |
| වැටකොළු | 150 | 150 | 100 |
| පතෝල | 130 | 130 | 100 |
| කරවිල | 1250 | 1050 | 84 |
| මාළු මිරිස් | 800 | 650 | 81 |
| ජපන් පිපිඤ්ඤා | 345 | 270 | 78 |
| අමු මිරිස් | 300 | 295 | 98 |
| කොළ බෝංචි | 500 | 400 | 80 |
| අළුකෙසෙල් | 270 | 200 | 74 |
| තක්කාලි | 770 | 600 | 78 |
| බෙල්පෙපර් | 450 | 372 | 83 |
| චයිනීස් ගෝවා | 170 | 115 | 68 |
| බ්‍රොකෝලි | 20 | 20 | 100 |
| කෝලිෆ්ලවර් | 20 | 20 | 100 |
| සැල්දිරි | 40 | 20 | 50 |
| රෝස්මරි | 60 | 30 | 50 |
| ඔරිගැනෝ | 40 | 20 | 50 |
| බැසිල් | 50 | 25 | 50 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

වගු අංක 4.4න් දැක්වෙන පරිදි බදුල්ල දිස්ත්‍රික්කයේ සැපයුම්කරුවන් උඩරට මෙන්ම පහත රට එළවළු වර්ග ද අපනයනය සඳහා සපයා ඇත. වැටකොළු, පතෝල, කරවිල හා අළු කෙසෙල් එසේ සපයා ඇති පහත රට එළවළු අතර වේ. එමෙන්ම උඩරට ගොවිපළ තුළ විවෘත භූමියේ වගා කරනු ලබන බෝංචි, මාළු මිරිස් හා අමු මිරිස් වැනි බෝග වර්ග ද, හරිතාගාර තුළ වගා කරනු ලබන එළවළු වර්ග රාශියක් ද අපනයනය සඳහා සපයා ඇති බව දත්තවලින් තවදුරටත් තහවුරු වේ. සැපයුම්කරුවන් විසින් මිලදී ගනු ලබන එළවළුවලින් 50% සිට 100% දක්වා ප්‍රමාණ අපනයනය සඳහා භාවිතා කර ඇති අතර ඉතිරි ප්‍රමාණ සුපිරි වෙළඳපොළ වෙත හෝ දේශීය වෙළඳපළ වෙත සපයා ඇත. සුවිශේෂී හේතුවක් නොවේ නම් අපතේ යාම ශූන්‍ය හෝ ඉතා අවම අගයක් ගනී. ගුණත්වයෙන් ඉහළ එළවළු පමණක් තෝරා ගැනීම මීට හේතුව වේ.

වගු අංක 4.5 : සැපයුම්කරුවන් මිලදී ගත් හා අපනයනය සඳහා සැපයූ එළවළු වර්ග හා ප්‍රමාණ (එක් කන්නයක් තුළදී) - නුවරඑළිය දිස්ත්‍රික්කය

| එළවළු වර්ගය | මිලදී ගත් ප්‍රමාණය | අපනයනය සඳහා සැපයූ ප්‍රමාණය | |
|---|---|---|---|
| | කි. ග්‍රෑම් | කි. ග්‍රෑම් | ප්‍රතිශතය |
| මාළුමිරිස් | 450 | 450 | 100 |
| ගෝවා | 8000 | 7200 | 90 |
| කොළ බෝංචි | 150 | 150 | 100 |
| කොත්තමල්ලි | 10 | 06 | 60 |
| පාස්ලි | 100 | 100 | 100 |
| ලීක්ස් | 4650 | 4275 | 92 |
| බීට් | 3750 | 3640 | 97 |
| කැරට් | 1250 | 1240 | 99 |
| සුකිනි | 11000 | 7740 | 70 |
| චයිනීස් ගෝවා | 4170 | 3966 | 95 |
| බෲකෝලි | 162 | 162 | 100 |
| කෝලි ෆ්ලවර් | 15 | 13 | 87 |
| අර්තාපල් | 8100 | 3300 | 41 |
| සලාද | 100 | 80 | 80 |
| රෙඩ් කැබේජ් | 390 | 325 | 83 |
| සැල්දිරි | 808 | 757 | 94 |
| මින්ට් | 308 | 171 | 56 |
| පච්චෝයි | 100 | 85 | 85 |
| අයිස්බර්ග් | 200 | 200 | 100 |
| බැසිල් | 350 | 350 | 100 |
| බටර් බෝංචි | 200 | 200 | 100 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014


නුවරඑළිය දිස්ත්‍රික්කයේ සැපයුම්කරුවන් මාළුමිරිස් හැරුණු කොට උඩරට එළවළු ගණයට වැටෙන එළවළු වර්ග පමණක් අපනයනය සඳහා මිලදී ගෙන ඇත. විවෘත ක්ෂේත්‍රවල වගා කරන කැරට්, බීට්, ගෝවා, බෝංචි, ලීක්ස් හා අර්තාපල් යනාදී එළවළු වර්ග මෙන්ම හරිතාගාර බෝග ගණනාවක් ඒ අතර වේ. වගු අංක 4.5න් දැක්වෙන පරිදි අර්තාපල් සුළු ප්‍රමාණයක් අපනයනය සඳහා භාවිතා කර ඇති අතර වැඩි ප්‍රමාණයක් දේශීය වෙළඳපොළ වෙත අලෙවි කර ඇත.

මාතලේ දිස්ත්‍රික්කයේ සැපයුම්කරුවෝ අපනයනය සඳහා සපයා ඇත්තේ පහත රට එළවළු වර්ග පමණි (වගු අංක 4.6). බදුල්ල හා මාතලේ දිස්ත්‍රික්කවලින් වැඩිපුරම සපයා ඇති එළවළු වර්ග වන්නේ කරවිල හා පතෝල ය. එළවළු අපනයනයේ දී සියලුම එළවළු වර්ග එක් HS කේතයක් යටතේ අපනයනය කිරීම හේතුවෙන් අපනයනය කරනු ලබන එක් එක් එළවළු ප්‍රමාණ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම අපහසුය.

**වගු අංක 4.6 : සැපයුම්කරුවන් මිලදී ගත් හා අපනයනය සඳහා සැපයූ එළවළු වර්ග හා ප්‍රමාණ (එක් කන්නයක් තුළදී) - මාතලේ දිස්ත්‍රික්කය**

| එළවළු වර්ගය | මිලදී ගත් ප්‍රමාණය | අපනයනය සඳහා සැපයූ ප්‍රමාණය | |
|---|---|---|---|
| | (කි. ග්‍රෑම්) | (කි. ග්‍රෑම්) | ප්‍රතිශතය |
| වැටකොළු | 5240 | 990 | 19 |
| දඹල | 1420 | 610 | 43 |
| පතෝල | 5350 | 5250 | 98 |
| මැකරල් | 1050 | 930 | 89 |
| කැකිරි | 50 | 50 | 100 |
| කරවිල | 6140 | 1740 | 28 |
| මුරුංගා | 250 | 125 | 50 |
| මාළුමිරිස් | 3300 | 350 | 11 |
| බණ්ඩක්කා | 550 | 365 | 66 |
| පිපිඤ්ඤා | 200 | 150 | 75 |
| අමුමිරිස් | 4050 | 348 | 09 |
| වම්බටු | 100 | 100 | 100 |
| එළබටු | 250 | 230 | 92 |
| රතුළූණු | 1000 | 150 | 15 |
| කරපිංචා | 150 | 140 | 93 |
| අළුකෙසෙල් | 200 | 160 | 80 |
| තිබ්බටු | 250 | 220 | 88 |
| වට්ටක්කා | 40 | 40 | 100 |

**මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014**




*ඉහත රූපයේ එක් එක් එළවළු සංඛ්‍යාව සැපයූ සැපයුම්කරුවන් සංඛ්‍යාව සහ එම සංඛ්‍යාවේ ප්‍රතිශතය වරහන් තුළින් සඳහන් කර ඇත.

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**ප්‍රස්තාර අංක 4.1 : අපනයන සඳහා සැපයූ එළවළු සංඛ්‍යාව අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය**

ප්‍රස්තාර අංක 4.1න් දැක්වෙන පරිදි 32%ක ගොවි ප්‍රතිශතයක් එළවළු වර්ග පහකට වඩා සපයා ඇත.


**වගු අංක 4.7 : ව්‍යවසායන්හි ප්‍රමාණාත්මක විචලතා අනුව (මාසික) සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය**

| එළවළු ප්‍රමාණය කි.ග්‍රෑම් (මාසයක් සඳහා) | මිලදීගත් ව්‍යවසායකයන් | | එළවළු ප්‍රමාණයේ පරාසය (කි.ග්‍රෑම්) | අපනයනය සඳහා සැපයූ ව්‍යවසායකයන් | | එළවළු ප්‍රමාණයේ පරාසය (කි.ග්‍රෑම්) |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | |
| < 250 | 05 | 19 | 80-215 | 06 | 23 | 80-95 |
| 250 < 500 | 03 | 12 | 300-390 | 05 | 19 | 140-200 |
| 500 < 1000 | 05 | 19 | 540-750 | 05 | 19 | 270-450 |
| 1000 < 5000 | 09 | 34 | 1000-3160 | 08 | 31 | 595-840 |
| 5000 < 10000 | 01 | 04 | 9200 | 02 | - | 1000-4000 |
| 10000 < 10000 | 03 | 12 | 12000-18000 | 02 | 08 | 11615-12000 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

මිලදී ගනු ලබන හා අපනයනය සඳහා සපයා ඇති එළවළු ප්‍රමාණය (වගු අංක 4.7) අනුව එළවළු අපනයන කර්මාන්තයේ නියුතු සැපයුම්කරුවන් සතු ව්‍යවසායන්හි කැපී පෙනෙන ප්‍රමාණාත්මක විචලතා පවතින බව හඳුනා ගත හැක.

ප්‍රස්තාර අංක 4.2න් දැක්වෙන පරිදි බහුතරයක් (18-69%) මිලදී ගනු ලබන එළවළුවලින් 75%කට අධික ප්‍රමාණයක් අපනයනය සඳහා සපයනු ලබන සැපයුම්කරුවන් සංඛ්‍යාව 18කි (69%).





*ඉහත රූපයේ මිලදී ගනු ලබන එළවළුවලින් අපනයනය සඳහා සැපයූ සැපයුම්කරුවන් සංඛ්‍යාව සහ එම සංඛ්‍යාවේ ප්‍රතිශතය වරහන් තුළින් සඳහන් කර ඇත.

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**ප්‍රස්තාර අංක 4.2 : මිලදී ගනු ලබන එළවළුවලින් අපනයනය සඳහා සැපයූ ප්‍රමාණය (ප්‍රතිශතය) අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය**

ඉහත සැපයුම්කරුවන් අතරින් දෙදෙනෙකු පමණක් (8%) තමන් මිලදී ගනු ලබන එළවළු ප්‍රමාණයන්හි අතිරික්තය සුපිරි වෙළඳපොළ සඳහා සපයා ඇත. එම ප්‍රමාණ මිලදීගත් එළවළුවලින් කිලෝග්‍රෑම් 270ක් (34%) හා කිලෝග්‍රෑම් 430ක් (50%) වේ. මෙම සැපයුම්කරුවන් එළවළු වගාවේ ද නියැළෙන අතර තම නිෂ්පාදන හා වෙනත් ගොවීන්ගෙන් මිලදී ගන්නා නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අපනයනකරුවන්ට සැපයීමට අමතරව සුපිරි වෙළඳපොළ වෙත සපයනු ලැබේ.

සැපයුම්කරුවන් අතරින් සැලකිය යුතු සංඛ්‍යාවක් (14-54%) අතිරික්ත එළවළු දේශීය වෙළඳපොළ තුළ අලෙවි කරති. එම ප්‍රමාණය කිලෝග්‍රෑම් 8 (5%) සිට කිලෝග්‍රෑම් 17300 (96%) දක්වා වෙනස් වූ අවස්ථා දක්නට ලැබුණි. සමහර සැපයුම්කරුවන් අපනයනය සඳහා සැපයීමට අමතරව දේශීය වෙළඳපොළ තුළ එළවළු අලෙවි කිරීමේ පරමාර්ථයෙන්ම එළවළු මිලදී ගැනීම මීට ප්‍රධාන හේතුව වේ. ප්‍රස්තාර අංක 4.3 මගින් දේශීය වෙළඳපොළ සඳහා සපයනු ලබන එළවළු ප්‍රමාණ (ප්‍රතිශතය) අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය ඉදිරිපත් කර ඇත.




*ඉහත රූපයේ මිලදී ගත් එළවළුවලින් දේශීය වෙළඳපොළට සැපයූ සැපයුම්කරුවන් සංඛ්‍යාව සහ එම සංඛ්‍යාවේ ප්‍රතිශතය වරහන් තුළින් සඳහන් කර ඇත.

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**ප්‍රස්තාර අංක 4.3 : මිලදී ගත් එළවළුවලින් දේශීය වෙළඳපොළට සැපයූ ප්‍රමාණය (ප්‍රතිශතය) අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය**

සැපයුම්කරුවන් බහුතරයක් (17-65%) අපනයන ප්‍රමිතීන්ට අනුකූල එළවළු පමණක් තෝරා මිලදී ගැනීම හේතුවෙන් එළවළු අපතේ දැමීමට සිදු නොවේ. නමුත් ඉතිරි සැපයුම්කරුවන්ගේ එළවළු අපතේ යන බවට (කිලෝග්‍රෑම් 5 (2%) සිට 400 (16%) දක්වා වාර්තා වී ඇත. කෙසේ නමුත් ඉදිරියේ දී දක්වා ඇති ආදායම් විශ්ලේෂණවලට අනුව අපතේ යාම ඇතුළත් කළ විට පවා සැපයුම්කරුවන් පාඩු-නොලබන වාර්තා වේ.

## 4.4 එළවළු මිල ගණන්

### 4.4.1 බදුල්ල දිස්ත්‍රික්කය

බදුල්ල දිස්ත්‍රික්කයේ එළවළුවල ගැණුම් මිල හා ඒවා අපනයනය සඳහා සැපයූ මිල ගණන් වගු අංක 4.8න් ඉදිරිපත් කර ඇත. ඒ අනුව විවිධ එළවළු වර්ග කිලෝග්‍රෑම් එකක් සඳහා රු.20/- සිට රු.200/- දක්වා ලාභාංශයක් පවත්වා ගනිමින් අපනයනය සඳහා සපයා ඇති බව පැහැදිලි වේ. තවද එම ලාභාංශය එළවළු වල ගැණුම් මිලට සාපේක්ෂව 11% සිට 75% දක්වා වූ පරාසයක ව්‍යාප්ත වී ඇති අතර වැඩි ලාභාංශයක් අත්කර ගෙන ඇත්තේ, අළුකෙසෙල් හා පිපිඤ්ඤා වැනි පහතරට එළවළු වර්ග සැපයීම තුළිනි. රෝස්මරි හා ඔරිගැනෝ වැනි ඉහළ මිලක් සහිත එළවළු අපනයනය සඳහා සැපයීම තුළින් වැඩි ලාභාංශයක් අත්කර ගෙන නොමැති බවද දත්තවලින් පැහැදිලි වේ.

වගු අංක 4.8 : සැපයුම්කරුවන් එළවළු මිලදී ගත් හා අපනයනය සඳහා සැපයූ සාමාන්‍ය මිල ගණන් - බදුල්ල දිස්ත්‍රික්කය

| එළවළු වර්ගය | එළවළුවල මධ්‍යන්‍ය මිල ගණන් (රු./කි.ග්‍රෑම්) | | | මිල වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | ගැණුම් මිල | අපනයනය සඳහා සැපයූ මිල | මිල වෙනස | |
| වැටකොළු | 90 | 120 | 30 | 33 |
| පතෝල | 65 | 85 | 20 | 31 |
| කරවිල | 78 | 108 | 30 | 39 |
| මාළු මිරිස් | 115 | 150 | 35 | 30 |
| ජපන් පිපිඤ්ඤා | 60 | 86 | 26 | 43 |
| අමු මිරිස් | 100 | 130 | 30 | 30 |
| කොළ බෝංචි | 105 | 143 | 38 | 36 |
| අළුකෙසෙල් | 50 | 88 | 38 | 75 |
| තක්කාලි | 113 | 151 | 38 | 33 |
| බෙල්පෙපර් | 214 | 294 | 80 | 37 |
| චයිනීස් ගෝවා | 120 | 150 | 30 | 25 |
| බ්‍රොකෝලි | 350 | 400 | 50 | 14 |
| කෝලිෆ්ලවර් | 350 | 400 | 50 | 14 |
| සැල්දිරි | 120 | 160 | 40 | 33 |
| රෝස්මරි | 1200 | 1400 | 200 | 17 |
| ඔරිගැනෝ | 900 | 1000 | 100 | 11 |
| බැසිල් | 200 | 250 | 50 | 25 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

වගු අංක 4.8 සඳහන් සමහර එළවළු වර්ගවල සුලභතාවය අනුව ඒවායේ ගැණුම් මිල මෙන්ම අපනයනය සඳහා සපයන මිල විචලනය වේ. බදුල්ල දිස්ත්‍රික්කය තුළ එසේ මිල ගණන් විචලනය වූ එළවළු වර්ගවලට අදාළ දත්ත වගු අංක 4.9 මඟින් ඉදිරිපත් කර ඇත. එමඟින් පැහැදිලි වන්නේ

එළවළු සැපයුමේ කාලීන විචලතා ප්‍රයෝජනයට ගනිමින් එළවළු අපනයන කර්මාන්තයෙන් ඉහළ ආදායමක් උපයා ගැනීමට ඉඩ ප්‍රස්තාව පවතින බවයි..

වගු අංක 4.9 : ගැණුම් මිල සහ අපනයනය සඳහා සැපයූ මිල ගණන්වල විචලතා පැවතුණ එළවළු වර්ග - බදුල්ල දිස්ත්‍රික්කය

| එළවළු වර්ගය | ගැණුම් මිල (රු./කි.ග්‍රෑම්) | | අපනයනය සඳහා සැපයූ මිල (රු./කි.ග්‍රෑම්) | |
|---|---|---|---|---|
| | අවම | උපරිම | අවම | උපරිම |
| ජපන් පිපිඤ්ඤා | 30 | 80 | 60 | 120 |
| බෝංචි | 80 | 130 | 95 | 190 |
| තක්කාලි | 40 | 160 | 100 | 200 |
| බෙල්පෙපර් | 50 | 300 | 80 | 500 |
| චයිනීස් ගෝවා | 50 | 210 | 80 | 250 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

## 4.4.2 නුවරඑළිය දිස්ත්‍රික්කය

වගු අංක 4.10 : සැපයුම්කරුවන් එළවළු මිලදී ගත් හා අපනයනය සඳහා මිල ගණන් නුවරඑළිය දිස්ත්‍රික්කය

| එළවළු වර්ගය | එළවළුවල මිල (රු./කි.ග්‍රෑම්) | | | මිල වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | ගැණුම් මිල | අපනයනය සඳහා සැපයූ මිල | මිල වෙනස | |
| මාළුමිරිස් | 170 | 200 | 30 | 18 |
| ගෝවා | 55 | 82 | 27 | 49 |
| කොළ බෝංචි | 80 | 100 | 20 | 25 |
| කොත්තමල්ලි | 60 | 100 | 40 | 67 |
| පාස්ලි | 200 | 220 | 20 | 10 |
| ලීක්ස් | 45 | 68 | 23 | 52 |
| බීට් | 89 | 114 | 25 | 28 |
| කැරට් | 90 | 115 | 25 | 28 |
| සුකිනි | 153 | 197 | 43 | 28 |
| චයිනීස් ගෝවා | 143 | 187 | 43 | 30 |
| බ්‍රොකෝලි | 500 | 561 | 61 | 12 |
| කෝලි ෆ්ලවර් | 250 | 280 | 30 | 12 |
| අර්තාපල් | 80 | 85 | 05 | 06 |
| සලාද | 110 | 150 | 40 | 36 |
| රෙඩ් කැබේජ් | 170 | 207 | 37 | 22 |
| සැල්දිරි | 238 | 270 | 33 | 14 |
| මින්ට් | 110 | 160 | 50 | 45 |
| පච්චෝයි | 80 | 100 | 20 | 25 |
| අයිස්බර්ග් | 120 | 150 | 30 | 25 |
| බැසිල් | 60 | 125 | 65 | 108 |
| බටර් බෝංචි | 90 | 120 | 30 | 33 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

වගු අංක 4.11 : ගැණුම් මිල සහ අපනයනය සඳහා සැපයූ මිල ගණන්වල විචලතා පැවතුණ එළවළු වර්ග - නුවරඑළිය දිස්ත්‍රික්කය (එක් සතියක් තුළ)

| එළවළු වර්ගය | ගැණුම් මිල (රු./කි.ග්‍රෑම්) | | අපනයනය සඳහා සැපයූ මිල (රු./කි.ග්‍රෑම්) | |
|---|---|---|---|---|
| | අවම | උපරිම | අවම | උපරිම |
| ගෝවා | 40 | 65 | 70 | 90 |
| ලීක්ස් | 40 | 50 | 60 | 80 |
| බීට් | 75 | 95 | 100 | 125 |
| කැරට් | 50 | 130 | 80 | 150 |
| සුකිනි | 50 | 250 | 70 | 300 |
| චයිනිස් ගෝවා | 80 | 250 | 120 | 320 |
| බෲකෝලි | 500 | 500 | 550 | 572 |
| අර්තාපල් | 40 | 135 | 165 | 165 |
| රෙඩ් කැබේජ් | 140 | 220 | 180 | 250 |
| සැල්දිරි | 100 | 375 | 140 | 400 |
| මිරිස් | 80 | 140 | 150 | 170 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

නුවරඑළිය දිස්ත්‍රික්කයේ දී අපනයනය සඳහා වැඩිමනත් සපයා ඇත්තේ උඩරට එළවළු වර්ග වේ. වගු අංක 4.10න් දක්වා ඇති පරිදි දේශීය වෙළඳපොළ සඳහා වැඩිපුර සපයා ඇති අර්තාපල් හැරුණු කොට එළවළු සැපයීමේ දී පවත්වා ගෙන ඇති ලාභාංශය එළවළු වර්ග අනුව විචලනය වී ඇති අතර එය රු.20/- සිට රු.65/- දක්වා විය. ලාභාංශයන් ප්‍රතිශත ලෙස ගත්විට එය 6% සිට 108% දක්වා විචලනය වී ඇත. එළවළු වර්ගවල මිල ගණන් ඒවායේ සුලභතාව හා ඇණවුම් ප්‍රමාණය මත විචලනය වන අතර ඒ අනුව සැපයුම්කරුවන් අතර මෙන්ම එකම සැපයුම්කරුගේ ඇණවුමෙන් ඇණවුමට ද වෙනස් වේ (වගු අංක 4.11). නිදසුනක් ලෙස සැල්දිරිවල ගැණුම් මිල ගණන් ඉදිරිපත් කළ හැකිය. බදුල්ල දිස්ත්‍රික්කයේ සැල්දිරිවල ගැණුම් මිල රු.120/-ක් හා අපනයනය සඳහා සැපයුම් මිල රු.160/-කි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ එම මිල ගණන් පිළිවෙළින් රු.238/-ක් හා රු.270/-ක් වේ.

### 4.4.3 මාතලේ දිස්ත්‍රික්කය

මාතලේ දිස්ත්‍රික්කය තුළ එළවළු මිල වෙනස රු.5/- සිට රු.40/- දක්වා විචලනය වී ඇති අතර (වගු අංක 4.12) මිල පරතරයේ ප්‍රතිශතය 10% සිට 60% දක්වා විය (වගු අංක 4.13). පහත රට එළවළු වර්ග පමණක් සැපයීම හේතුවෙන් අනෙකුත් දිස්ත්‍රික්ක දෙකේ තරම් මිල විචලනය ප්‍රබලව දක්නට නොලැබුණි.

**වගු අංක 4.12 : සැපයුම්කරුවන් එළවළු මිලදී ගත් හා අපනයනය සඳහා සැපයූ සාමාන්‍ය මිල ගණන් - මාතලේ දිස්ත්‍රික්කය**

| එළවළු වර්ගය | එළවළුවල මිල (රු./කි.ග්‍රෑම්) | | | මිල වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | ගැණුම් මිල | අපනයනය සඳහා සැපයූ මිල | මිල වෙනස | |
| වැටකොළු | 58 | 66 | 09 | 15 |
| දඹල | 93 | 118 | 25 | 27 |
| පතෝල | 55 | 69 | 14 | 26 |
| මැකරල් | 87 | 103 | 17 | 19 |
| කැකිරි | 60 | 70 | 10 | 17 |
| කරවිල | 83 | 93 | 10 | 12 |
| මුරුංගා | 50 | 70 | 20 | 40 |
| මාළුමිරිස් | 88 | 105 | 17 | 19 |
| බණ්ඩක්කා | 45 | 58 | 13 | 30 |
| ජපන් පිපිඤ්ඤා | 30 | 40 | 10 | 33 |
| අමුමිරිස් | 400 | 440 | 40 | 10 |
| වම්බටු | 80 | 100 | 20 | 25 |
| එළබටු | 63 | 78 | 15 | 24 |
| රතුළූණු | 100 | 120 | 20 | 20 |
| කරපිංචා | 50 | 80 | 30 | 60 |
| අළුකෙසෙල් | 80 | 100 | 20 | 25 |
| තිබ්බටු | 180 | 200 | 20 | 11 |
| වට්ටක්කා | 20 | 25 | 05 | 25 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

වගු අංක 4.13 : ගැණුම් මිල සහ අපනයනය සඳහා සැපයූ මිල ගණන්වල විචලතා පැවතුන එළවළු වර්ග - මාතලේ දිස්ත්‍රික්කය

| එළවළු වර්ගය | ගැණුම් මිල (රු./කි.ග්‍රෑම්) | | අපනයනය සඳහා සැපයූ මිල (රු./කි.ග්‍රෑම්) | |
|---|---|---|---|---|
| | අවම | උපරිම | අවම | උපරිම |
| වැටකොළු | 35 | 80 | 45 | 85 |
| දඹල | 60 | 130 | 80 | 160 |
| පතෝල | 25 | 80 | 30 | 105 |
| මැකරල් | 65 | 125 | 70 | 150 |
| කරවිල | 55 | 120 | 65 | 130 |
| මාළුමිරිස් | 70 | 100 | 85 | 120 |
| බණ්ඩක්කා | 25 | 60 | 35 | 70 |
| අමුමිරිස් | 380 | 420 | 410 | 470 |
| එළබටු | 50 | 75 | 60 | 95 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

## 4.5 එළවළුවල ගැණුම් මිල අපනයන මිල හා සුපිරි වෙළඳපළ මිල ගණන්

නුවරඑළියේ කිසිදු සැපයුම්කරුවෙකු සුපිරි වෙළඳපළ සඳහා එළවළු සපයා නොමැත. බදුල්ල හා මාතලේ දිස්ත්‍රික්කවලින් එක් සැපයුම්කරුවෙකු බැගින් පමණක් සුපිරි වෙළඳපොළ සඳහා එළවළු සපයා තිබුණි. වගු අංක 4.14 සඳහන් දත්තවලින් එම මිල ගණන් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැක. සෑම එළවළු වර්ගයකම අපනයනය සඳහා සැපයූ මිල ගැණුම් මිලට වඩා ඉහළ අගයක් ගනී. එය කිලෝග්‍රෑමයකට රු.10/- සිට රු.100/- දක්වා වෙනස් වන බව දත්ත අනුව පෙනේ. අපනයනය සඳහා සැපයීමෙන් පසු අතිරික්ත එළවළු ප්‍රමාණය සුපිරි වෙළඳපොළ සඳහා සැපයීමේ දී එම මිල ගැනුම් මිලට වඩා අඩු හෝ වැඩි විය හැකි අතරම සමාන වන අවස්ථා ද ඇත. බදුල්ල දිස්ත්‍රිකයේ සැපයුම්කරු විසින් එසේ සුපිරි වෙළඳපොළ සඳහා ඉහල මිලකට හෝ එම මිලටම එළවළු සපයා ඇත. මාතලේ දිස්ත්‍රික්කයේ සැපයුම්කරු සැමවිටම ගැනුම් මිලට වඩා අඩු මිලකට සුපිරි වෙළඳපොළ වෙත එළවළු සපයා ඇත. ඔහු අපනයන ඇණවුම ඉක්මවා එළවළු මිලදී ගනු ලබන අතර ගුණාත්මයෙන් ඉහළම එළවළු තෝරා ඇණවුම සම්පූර්ණ කරනු ලැබේ. ඉතිරිය අඩු මිලට සුපිරි වෙළඳපොළ සපයනු ලැබුවද එමගින් ඔහුට අලාභයක් අත්වී නැත.

මෙම සැපයුම්කරුවන් දෙදෙනාම එළවළු වගාවේ නියැළෙමින් එළවළු අපනයන කර්මාන්තයට ඉහළ දායකත්වයක් ලබා දෙන මාසිකව රු.50,000/-කට වැඩි ආදායමක් උපයන අය වේ. බදුල්ල සැපයුම්කරු හරිතාගාර 7ක් සහ ශීතකරණ සහිත වාහන හිමි ධනවත් ව්‍යාපාරිකයෙකි.

**වගු අංක 4.14 : අපනයනය සඳහා හා සුපිරි වෙළඳපොළට එළවළු සැපයූ මිල ගණන්**

| එළවළු වර්ගය | එළවළු මිල ගණන් (රු./කි.ගෑම්) | | | | |
|---|---|---|---|---|---|
| | ගැණුම් මිල | අපනයනය සඳහා සැපයූ මිල | මිල වෙනස | සුපිරි වෙළඳපළොට සැපයූ මිල | මිල වෙනස |
| ජපන් පිපිඤ්ඤා | 70 | 120 | 50 | 100 | 30 |
| තක්කාලි | 120 | 120 | 40 | 140 | 20 |
| බෙල්පෙපර් | 275 | 300 | 25 | 275 | 0 |
| චයිනීස් ගෝවා | 210 | 250 | 40 | 220 | 10 |
| ඔරියානා | 900 | 1000 | 100 | 925 | 25 |
| බැසිල් | 200 | 250 | 50 | 200 | 0 |
| දඹල | 60 | 80 | 20 | 40 | -20 |
| පතෝල | 60 | 80 | 20 | 40 | -20 |
| මැකරල් | 70 | 90 | 20 | 40 | -30 |
| මුරුංගා | 50 | 70 | 20 | 30 | -20 |
| බණ්ඩක්කා | 50 | 70 | 20 | 40 | -10 |

**මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014**

අපනයන අතිරික්තය දේශීය වෙළඳපොළට සැපයීමේ දී ගැණුම් මිලටම හෝ ඊට අඩු මිලකට අලෙවි කර ඇත (වගු අංක 4.15 හා ඇමුණුම 02). ඊට හේතුව අපනයන ප්‍රමිතීන්ට අනුකූල නොවන තෝරුණු එළවළු වර්ග දේශීය වෙළඳපොළට සැපයීමයි. එනමුත් සුකිනි, බෙල්පෙපර් වැනි හරිතාගාර බෝග වර්ග සඳහා දේශීය වෙළඳපොළ තුළ ද ඉහළ මිලක් පවතී. කරවිල, මාළුමිරිස් හා අමුමිරිස් වැනි දේශීය එළවළුවලට ද ඉහළ මිලක් පවතින බව පෙනේ.

වගු අංක 4.15 : අපනයනය සඳහා හා දේශීය වෙළඳපොළට එළවළු සැපයූ මිල ගණන්

| එළවළු වර්ගය | එළවළු මිල ගණන් (රු./කි.ග්‍රෑම්) | | | | |
|---|---|---|---|---|---|
| | ගැණුම් මිල | අපනයනය සඳහා සැපයූ මිල | මිල වෙනස | දේශීය වෙළඳපලට සැපයූ මිල | මිල වෙනස |
| කරවිල | 78 | 108 | 30 | 65 | -13 |
| මාළු මිරිස් | 115 | 150 | 35 | 85 | -30 |
| පිපිඤ්ඤා | 70 | 80 | 10 | 77 | 7 |
| පිපිඤ්ඤා | 80 | 90 | 10 | 75 | -5 |
| පිපිඤ්ඤා | 70 | 120 | 50 | 65 | -5 |
| බෝංචි | 130 | 190 | 60 | 70 | -60 |
| අළු කෙසෙල් | 50 | 88 | 38 | 33 | -17 |
| තක්කාලි | 160 | 170 | 10 | 170 | -10 |
| බෙල්පෙපර් | 160 | 185 | 15 | 180 | -20 |
| බෙල්පෙපර් | 250 | 500 | 250 | 450 | 200 |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

තවද සුලභතාවය අනුව එකම එළවළු වර්ගය විවිධ මිල ගණන්වලට ලබාගෙන ඇති අතර වගු අංක 4.16න් දැක්වෙන පරිදි මිලදී ගනු ලබන එළවළු වර්ග හා වාර ගණන අධ්‍යයන ප්‍රදේශ අනුව ද වෙනස් වී ඇත.

වගු අංක 4.16 : දිස්ත්‍රික්ක අනුව එළවළු වර්ග මිලදී ගත් වාර ගණන

| මසකදී එළවළු මිලදී ගත් උපරිම වාර ගණන | දිස්ත්‍රික්ක අනුව මිලදී ගත් එළවළු වර්ග | | |
|---|---|---|---|
| | බදුල්ල | නුවර එළිය | මාතලේ |
| දිනපතා | පිපිඤ්ඤා, තක්කාලි, බෙල්පෙපර්, | මිත්චි | වැටකොළු, පතෝල, කරවිල, මාළු මිරිස්, අමු මිරිස් |
| 24 වතාවක් | | සුකිනි, චයිනීස් ගෝවා, සැල්දිරි, බැසිල් | |
| 20 වතාවක් | චයිනීස් ගෝවා, බෲකෝලි, කෝලිෆ්ලවර්, සැල්දිරි, රෝස් මෙරි, ඔරියානා, බැසිල් | ගෝවා, කොත්තමල්ලි, ලීක්ස්. බීට්, කැරට්, සලාද, රෙඩ් කැබේජ්, පච්චෝලි | දඹල, බණ්ඩක්කා |
| 16 වතාවක් | | බෲකෝලි, කෝලි ෆ්ලවර් | |
| 12 වතාවක් | | අර්තාපල් | |
| 8 වතාවක් | බෝංචි | මාළු මිරිස්, බෝංචි, බටර් බෝංචි | මැකරල්, කැකිරි, පිපිඤ්ඤා, වම්බටු, එළබටු, රතුළූණු, කරපිංචා, අළු කෙසෙල්, තිබ්බටු, වට්ටක්කා |
| 4 වතාවක් | වැටකොළු, පතෝල, කරවිල, මාළු මිරිස්, අමු මිරිස් | පාස්ලි, අයිස් බර්ග් | මුරුංගා |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

## 4.6 එළවළු සැපයුම්කරුවන් අත්කර ගත් ප්‍රතිලාභ


### 4.6.1 සැපයුම්කරුවන්ගේ ආදායම වර්ධනය වීම

සැපයුම්කරුවන්ගේ මාසික අයවැය පිළිබඳ විශ්ලේෂණයක් වගු අංක 4.17න් දක්වා ඇත. මින් පෙරද සඳහන් කළ පරිදි අපනයනය සඳහා එළවළු සැපයීමේ ව්‍යවසායන් විවිධ පරිමාණයන්ගෙන් ක්‍රියාත්මක වන අතර ඒ අනුව ඔවුන් මිලදී ගෙන සපයන එළවළු ප්‍රමාණයන් ද විචලනය වේ. ඒ අනුව ව්‍යවසායන්හි මාසික ආයෝජනය රු.5600/- සිට රු. 219,5000/- දක්වා පරාසයක විහිදී ඇති අතර මූලික ආයෝජනය අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය ප්‍රස්තාර අංක 4.4න් ඉදිරිපත් කර ඇත.

වගු අංක 4.17 : සැපයුම්කරුවන්ගේ අයවැය (මාසික) විශ්ලේෂණය

| අයවැය අයිතම | අවම (රු.) | උපරිම (රු.) | සාමාන්‍ය (රු.) | අදාළ සැපයුම්කරුවන් සංඛ්‍යාව (%) |
|---|---|---|---|---|
| එළවළු මිලදී ගැනීම සඳහා මුළු වියදම | 5,600 | 2,195,000 | 272,150 | 26(100%) |
| එළවළු අපනයනය සඳහා සැපයුම තුළින් ආදායම | 6,000 | 1,335,000 | 203,733 | 26(100%) |
| සුපිරි වෙළඳපොළෙන් ලද ආදායම | 18,550 | 89,050 | 4,139 | 2(8%) |
| දේශීය වෙළඳපොළෙන් ලද ආදායම | - | 2,237,500 | 116,201 | 14(54%) |
| මුළු ආදායම | 6000 | 2385000 | 325014 | 26 (100%) |
| ඉපයූ ලාභය | 400 | 360,000 | 52,865 | 26(100%) |


මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014




මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

ප්‍රස්තාර අංක 4.4 : එළවළු මිලදී ගැනීම සඳහා මාසික වැය අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය


ඒ අනුව සැපයුම්කරුවන් අතරින් 50%ක් ම මාසිකව රු.100,000/-කට අධික ආයෝජනයකින් යුක්තව අපනයනය සඳහා එළවළු සැපයීමේ ව්‍යවසාය පවත්වා ගෙන යති. එසේ මිලදී ගනු ලබන එළවළුවලින් වැඩි ප්‍රමාණයක් අපනයනය සඳහා සපයනු ලබන අතර ඉන් ලබන ආදායම රු.6000/- සිට රු.1,335,000/- දක්වා විචලනය වී ඇත. අපනයනය සඳහා එළවළු සැපයීමෙන් උපයන ආදායම් මට්ටම අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය ප්‍රස්තාර අංක 4.5න් ඉදිරිපත් කර ඇත.




මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**ප්‍රස්තාර අංක 4.5: අපනයනය සඳහා එළවළු සැපයීමෙන් උපයන ආදායම අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය**


මෙම දත්ත අනුව පෙනී යන්නේ සැපයුම්කරුවන් අතරින් සාතිශය බහුතරය (65%) මාසිකව අපනයනය සඳහා රු.50,000/- කට වඩා වටිනාකමකින් යුත් එළවළු අපනයනය සඳහා සපයනු ලබන බවයි. ඊට අමතරව අතිරික්ත එළවළු සුපිරි වෙළඳපොළට හෝ දේශිය වෙළඳපොළට සැපයීම තුළින් ද ආදායමක් උපයන ඔවුහු රු.6000/- සිට රු.238,500/- දක්වා පරාසයක් තුළ ආදායම් උපයති. එළවළු අපනයනය සඳහා හෝ සුපිරි වෙළඳපොළ වෙත හෝ දේශීය වෙළඳපොළ වෙත එළවළු සැපයීම මගින් උපයා ගනු ලබන මුළු ආදායම් මට්ටම අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය ප්‍රස්තාර අංක 4.6 මගින් ඉදිරිපත් කර ඇත.




මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**ප්‍රස්තාර අංක 4.6 : එළවළු අලෙවිය තුළින් උපයා ඇති මුළු ආදායම අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය**

ඉහතින් සඳහන් පරිදි උපයනු ලබන ආදායමේ ලාභාංශ ද සැලකිය යුතු තරම් වේ. කුඩාම පරිමාණයේ ව්‍යවසායකයා විසින් රු.400/-ක ලාභයක් උපයා ඇති අතර විශාල පරිමාණ ව්‍යවසායකයා උපයා ඇති ලාභය රු.360,000/-කි. උපයන ලාභාංශය අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය ප්‍රස්තාර අංක 4.7න් ඉදිරිපත් කර ඇත. කර්මාන්තයේ ප්‍රගතිය කවර මට්ටමේ පැවතිය ද සියලුම සැපයුම්කරුවන් සුළු ලාභයක් හෝ උපයා ඇති බව සඳහන් කළ යුතුය.





මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**ප්‍රස්තාර අංක 4.7: එළවළු අලෙවිය තුළින් උපයා ඇති ලාභය අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යාප්තිය**


මේ අනුව බොහෝ සැපයුම්කරුවන්ගේ ව්‍යාපාර වර්ධනය වී ඇති බව අධ්‍යයනයෙන් තහවුරු වේ. මින් පෙරද සඳහන් කළ පරිදි සැපයුම්කරුවන් මෙම කර්මාන්තයට එළඹීම වසර 20ක් දක්වා අතීතයට දිවෙන අවස්ථා මෙන්ම වසරක් වැනි කෙටි කාලයක් තුළ ඊට සම්බන්ධ වූ අවස්ථා ද ඇති බව දත්තවලින් පෙනේ.

එම කාලය තුළ අධ්‍යයනයේ දී හමුවූ සැපයුම්කරුවන් අතරින් බහුතරය (18-69%) කර්මාන්තයේ ප්‍රගතියක් අත්කර කර ගෙන ඇති අතර ඉතා සුළු ප්‍රතිශතයකගේ (2-8%) කර්මාන්තවල විශේෂ වර්ධනයක් දක්නට නොලැබේ. ඉතිරි සැපයුම්කරුවන්ගේ (6-23%) කර්මාන්ත බිඳ වැටී ඇති බවද හෙළි වේ (ප්‍රස්තාර අංක 4.8).




මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**ප්‍රස්තාර අංක 4.8 : එළවළු සැපයුම් කර්මාන්තයේ ප්‍රගතිය /වර්ධනය**




මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

**ප්‍රස්තාර අංක 4.9 : එළවළු සැපයුම් කර්මාන්තයේ වර්ධනයක් අත්පත් කර ගත් ව්‍යාවසායන්හි ප්‍රගතිය**

අපනයනය සඳහා එළවළු සැපයීමේ වර්ධනයක් අත්පත් කර ගෙන ඇති සැපයුම්කරුවන් 18 දෙනා අතරින් 17 දෙනෙකුගේ ප්‍රගතිය විචලනය වී ඇති ආකාරය ප්‍රස්තාර අංක 4.9 මගින් පැහැදිලි වේ. ඒ හැරුණු කොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක් සැපයුම්කරුවකු වර්ෂ 2002 දී සිය ව්‍යවසාය එළවළු කි. ග්‍රෑම් 10000ක් සැපයීමෙන් ආරම්භ කර වර්තමානය වන විට කි.ග්‍රෑම් 45000ක් දක්වා වර්ධනයක් අත්පත් කර ගෙන ඇත.

සමීක්ෂණයේ දත්තවලින් වාර්තා වන පරිදි මෙම සැපයුම්කරුවන් විසින් අපනයනය සඳහා එළවළු සැපයීම ආරම්භයේ දී අවම අගය කි.ග්‍රෑම් 25ක් ද උපරිම අගය කි.ග්‍රෑම් 1750ක් ද වේ. වර්තමානයේ දී ඔවුන් සපයන අවම හා උපරිම අගයන් පිළිවෙළින් කි.ග්‍රෑම 100 හා කි.ග්‍රෑම් 7000ක් වේ.

කර්මාන්තයේ වර්ධනයක් අත්කර ගත් සැපයුම්කරුවන් අතරින් වැඩිදෙනෙකු (7-41%) සඳහන් කළ පරිදි ඒ සඳහා මූලික වශයෙන් බලපා ඇති සාධකය වන්නේ වැඩිපුර ඇණවුම් ලැබීමයි. ඊට අමතරව අපනයනය සඳහා එළවළු සැපයීම ආරම්භවීමත් සමඟ ඉන් දිරිමත් වී එළවළුවලින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමටත් ඒවා ඉහළ ගුණාත්මයෙන් යුතුව නිපදවීමටත් විවිධ පියවර ගැනීම

මගින් ද ඔවුන් යම් ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත. කෙසේ නමුත් ඇණවුම් සීමාසහිතවීම ඔවුන් තවමත් මුහුණපාන ප්‍රධාන ගැටලුවක් වේ.

## 4. 7 එළවළු සැපයුම්කරුවන් මුහුණපාන ගැටලු

### 4.7.1 ඇණවුම්වලට අනුකූලවන පරිදි එළවළු සපයයාගැනීමේ ගැටලු

(අ) සැපයුම්කරුවන් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ඔවුන්ට මුහුණදීමට සිදු වන ප්‍රධාන ගැටලුවක් වන්නේ ඇණවුම සම්පූර්ණ කිරීම සඳහා ලබා දෙන කාලසීමාව ඉතා කෙටිවීමයි. අපනයනකරු ඇණවුම ලබා දෙන්නේ එය සම්පූර්ණ කළ යුතු දිනට පෙර දිනය. එම කෙටි කාල සීමාව තුළ දී ඕනෑම ප්‍රමාණයක ඇණවුමක් බාර ගත යුතු අතර අඩුපාඩු නොමැතිව සම්පූර්ණ කළ යුතු වේ. ඒ සඳහා වැඩිපුර සේවකයන් යෙදීමට සිදු වේ. එමගින් වැය පක්ෂය ඉහළ යයි.

(ආ) සැපයුම්කරුවන් වටා විවිධ එළවළු වර්ග වගා කරන ගොවීන් රාශියක් සම්බන්ධවී සිටින හෙයින් දුරකථන ඇමතුම් මගින් ඔවුන් සැපයිය යුතු ප්‍රමාණය දැනුම් දෙනු ලැබේ. සැපයුම්කරුවන් බහුතරයක් තමා හා සම්බන්ධ ගොවීන් ඒ ඒ බෝග සඳහා නම් කර තිබීම මෙම කාර්යය පහසු කිරීමට සමත් වී ඇත. එසේ නමුත් සමහර අවස්ථාවල අවශ්‍ය එළවළු වර්ගය එම ගොවීන්ට සැපයීමේ හැකියාවක් නොමැති නම් දුරස්ථ ප්‍රදේශ කරා ගොස් නියමිත ප්‍රමිතිය සහිත එළවළු තෝරා ගැනීමට සිදු වෙයි. තම සැපයුම් ජාලයේ ගොවීන්ට එළවළු ඇණවුම් සම්පූර්ණ කිරීමට නොහැකිවන අවස්ථාවන්වලදී සැපයුම්කරුවන් වෙනත් ගොවීන්ගෙන් ද එළවළු මිලදී ගෙන ඇණවුම් සම්පූර්ණ කිරීමට වග බලා ගනී. එවිට එළවළු සඳහා අමතර වැඩි මිලක් වැය කිරීමට ද සිදුවන අවස්ථා ඇත. මේ නිසා ගොවිපළේ සිට නිවස කරා එළවළු ගෙන ඒමේ දී සුළු තැලීම්වලට භාජනය වී තිබීමෙන් තේරීමේ දී විශාල ප්‍රමාණයක් ඉවත් කළ යුතු වන අතර එය ගොවීන්ගේ අප්‍රසාදයට හේතු වී ඇත.

(ඇ) එළවළු ගෝනිවල මිටි බැඳීමේ දී එහි පහළ සහ ඉහළ කොටස්වලට කොළ අතු තබා ගැට ගසන අතර එමගින් එක ගෝනියකට අමතර වශයෙන් කිලෝ 3ක් පමණ බරක් එකතු වෙයි. සියලු නිෂ්පාදන මිලදී ගැනීමේ දී මෙම ගැටලුවට මුහුණ දීමට සිදු වී ඇත.

(ඉ) දේශීය වෙළඳපොළ මිල අපනයන මිලට වඩා වැඩි අවස්ථාවල දී ගොවීහු දේශීය වෙළඳපොළට එළවළු අලෙවි කරති. එමගින් සැපයුම්කරුවන්ට ඇණවුම් සැපිරීමට අපහසු වේ. සමස්ත නියැදියේ 62%කට මෙම ගැටලුව බලපා තිබූ අතර දිස්ත්‍රික්ක වශයෙන් බදුල්ල 28% ක්, නුවරඑළිය 31%ක් හා මාතලේ 41%ක් ලෙසිනි.

(ඊ) එළවළු සැපයුම් ක්‍රියාවලියේදී සැපයුම්කරුවන් හා අපනයනකරුවන් බහුතරයක් ප්ලාස්ටික් බඳුන් භාවිතා කරන අතර එමගින් එළවළු තැලීම අවම වී අපතේ යාම ද අඩු වේ. ඉතාමත් සුළුතර සැපයුම්කරුවන් සංඛ්‍යාවක් තමන්ගේ නිෂ්පාදකයන් වෙත එළවළු ඇසිරීම සඳහා බහාළුම් ලබාදීම සෑම දිස්ත්‍රික්කයක් තුළින්ම වාර්තා වුවත් ගොවියෝ ප්ලාස්ටික් කූඩ භාවිතා කිරීමට එතරම් කැමැත්තක් නොදක්වති. නියැදියේ සැපයුම්කරුවන් අතරින් 42%ක් පවසන පරිදි ප්ලාස්ටික් බඳුන් වාහනයට ඇසිරිය හැකි ප්‍රමාණය සීමිතය. ඒවා හැසිරවීමට අපහසුය. ප්‍රවාහනයේ දී ඉඩ ඇහිරීම නිසා වාහනයට කිප වාරයක් එහා මෙහා යාමට සිදුවන අතර ඒ සඳහා අමතර ප්‍රවාහන වියදමක් දැරීමට සිදු වේ.

(උ) එළවළු ඇසුරුම්කරණය ගොවීන් විසින් සිදු නොකරන අතර සැපයුම්කරුවන්ගෙන් 23% ප්‍රතිශතයක් එළවළු අසුරා අපනයනකරු වෙත භාර දෙයි. මෙය දිස්ත්‍රික් වශයෙන් සැලකීමේ දී බදුල්ල 43%ක්, නුවරඑළිය 22%ක් හා මාතලේ 10%ක් ලෙසිනි. එළවළු ඇසිරීම සඳහා කාඩ්බෝඩ් පෙට්ටි, පත්තර කඩදාසි, ඩිමයි කොළ හා පොලිතින් කවර භාවිත කරනු ලැබේ. සමහර අපනයනකරුවන් ඇසුරුම්කරණයට අවශ්‍ය පොලිතින් වැනි ද්‍රව්‍ය සඳහා මුදල් ගෙවනු ලැබේ. මෙම සමහර ඇසිරීම් සෘජුවම අපනයන තත්ත්වයේ පවතී. එළවළු ඇසුරුම්කරණය සඳහාද පුහුණු කණ්ඩායමක් අවශ්‍ය වන අතර වැය වන ශ්‍රමය සඳහා වියදම සැපයුම්කරු විසින් දැරිය යුතු වීමත් ප්‍රමිතියෙන් යුතු කාඩ්බෝඩ් පෙට්ටි හිඟවීමත් එළවළුවල ගුණාත්මය ආරක්ෂා වන පරිදි සපයා ගැනීම සඳහා තුඩු දී ඇති කරුණු වේ.

**4.7.2 ගොවි සබඳතා පවත්වා ගැනීම අසීරු වීම -** මේ සඳහා බලපාන කරුණු කීපයකි.

(අ) අපනයනකරු විසින් සැපයුම්කරුගේ ඇනවුම් ප්‍රතික්ෂේප කිරීම- සමස්ත නියැදියේ 58%කට මෙම ගැටලුව බලපා තිබුණි. මෙය දිස්ත්‍රික්ක වශයෙන් සැලකීමේ දී මාතලේ 70%ක්, නුවරඑළියේ 67%ක් හා බදුල්ලේ 29%ක් ලෙසිනි. සැපයුම්කරු වෙත ලබාදුන් ඇණවුම සපයා අවසන් වන තෙක් ඒ ප්‍රමාණයම සැපයීමට හැකි වේ ද යන්න පිළිබඳ ඔහුට විශ්වාසයක් නොමැති අවස්ථා පවතී. උදා: ආරම්භක ඇණවුම මැකරල් කි.ග්‍රෑ. 600ක් ද ඇණවුම අඩු

කිරීමෙන් පසු කි.ග්‍රෑ. 300ක් ද වන විට වැඩි මිලකට මිලදීගත් එළවළුවලින් අඩක්ම ගැණුම් මිලටත් වඩා අඩු මිලකට දේශීය වෙළඳපොළට සැපයීමට සිදු වීමෙන් අලාභ වූ අවස්ථාවන් පිළිබඳ වාර්තා වූ අතර මෙය සැපයුම්කරුවන්ගේ නිරන්තර අත්දැකීමකි.

ඉහත පරිදි ඇනවුම් ප්‍රතික්ෂේප වීමට කරුණු රාශියක් බලපා තිබුණි.

- එළවළු අපනයනය කරනු ලබන රටවල් විසින් ඇණවුම් සීමා කිරීම.
- ගුවන් ගමන් අවලංගු වීම.
- අපනයනකරු වෙනත් ස්ථානවලින් අඩු මිලට එළවළු සපයා ගැනීම.

අපනයනකරුවන් සැපයුම්කරුවන්හට ඇණවුම් ලබා දුන්නද සැපයුම්කරුවන් මාර්ගයෙන් ගොවීන් හඳුනාගෙන සැපයුම්කරුවන්ට නොදන්වා ගොවීන්ගෙන් මිලදී ගත් අවස්ථා හඳුනා ගැනීමට හැකිවිය. සැපයුම්කරුවන් අතර තරඟයක් නිර්මාණය කිරීම තුළින් සැම විටම නිෂ්පාදන අඩු මිලකට ලබා ගැනීමට අපනයනකරුවෝ උත්සාහ කරති. සෑම සැපයුම්කරුවෙකුටම කුඩා ප්‍රමාණ ඇණවුම් ලබා දෙන අතර කේවල් කිරීම තුළින් අඩු මිලක් තීරණය කරයි.

ගොවියාට ඇණවුමක් ලබා දීමෙන් අනතුරුව එය අඩු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම තුළින් ගොවියා හා සැපයුම්කරු අතර පවතින විශ්වාසය පලුදු වී යයි. නැවත එළවළු ලබාදීමට ඔහු අකමැති වෙයි. මේ නිසා ගොවියාට ලබා දුන් ඇනවුම් සම්පූර්ණයෙන්ම මිලදී ගත යුතු අතර ලැබෙන පාඩුව තමන් විසින් විඳ දරා ගත යුතු වෙයි. එමෙන්ම කුඩා ඇණවුම් ලද විටදී සැපයුම් ජාලයේ ගොවීන් සියල්ලන්ගේම නිෂ්පාදන කුඩා ප්‍රමාණවලින් හෝ මිලදී ගැනීම තුළින් ද ගොවියෝ අධෛර්යමත් වෙති.

(ආ) එළවළු තේරීම- එළවළු අපනයන ක්‍රියාවලියේ දී තේරීම ඉතා වැදගත් තැනක් හිමි කර ගන්නේ අපනයනය සඳහා එළවළු සපයන බොහෝ ගොවීන් දේශීය වෙළඳපොළ සඳහා එළවළු නිපදවන්නන් වන බැවිනි. තෙවන පරිච්ඡේදය යටතේ ද එළවළු තේරීමේ ගැටලු පිළිබඳ සාකච්ඡා කළ අතර ගොවියා එළවළු තේරීමෙන් අනතුරුව සැපයුම්කරු විසින් ද ඉන් අනතුරුව අපනයනකරු විසින් ද එළවළු තෝරනු ලැබේ. එළවළු එකතු කිරීමේ මධ්‍යස්ථාන, සැපයුම්කරුගේ නිවස හෝ අපනයන මධ්‍යස්ථානවල දී කීපවතාවක් එළවළු තේරීමට බඳුන් වෙයි. සැපයුම්කරුවන්ගෙන් 87%ක ප්‍රතිශතයකට එළවළු තේරීම පිළිබඳ හොඳ දැනුමක් ලබා තිබුණි. මෙම ප්‍රතිශතයන් බදුල්ල හා නුවරඑළිය 84%ක් වූ අතර මාතලේ දිස්ත්‍රික්කයේ 90%ක් විය.

සැපයුම්කරුවන්ගේ අත්දැකීම අනුව ගොවියා තෝරන ලද බෝංචි කි.ග්‍රෑ. 35කින් තෝරා ගත හැකි ප්‍රමාණය කි.ග්‍රෑ.15-20 (43%-57%) කි. අමුමිරිස් සඳහා එම අගය 43%කි. බණ්ඩක්කා සඳහා එම අගය 34%කි. ලීක්ස් සඳහා 33%ක් වන අතර සුකිනි සඳහා 50%කි. නමුත් ගොවීන්ගේ අපේක්ෂාව 50%ක් වත් අපනයනය සඳහා ලබා දීමයි. ඒ අනුව අපනයනය සඳහා එළවළු සැපයීම පිළිබඳ ගොවීන් අධෛර්යමත් වන අවස්ථා ද ඇත. ගොවින් හිතාමතා ගුණාත්මයෙන් අඩු එළවළු මිශ්‍ර කර සැපයීම සැපයුම්කරුවන්ගේ කනස්සල්ලට හේතු වී ඇත.

අපනයනකරුවන් මුදල් ලබා දීමට ප්‍රමාද වීම සැපයුම්කරුවන්ට ගැටලුවක් වී ඇත. සමහර අවස්ථාවල චෙක්පත් ලබා දෙන අතර ඒවා අගරු වීමට භාජනය වීම, මුදල් කොටස් වශයෙන් ලබාදීම, ඇනවුම් කීපයක මුදල් එකවර ගෙවීම සහ සමහර අපනයනකරුවන් ඇනවුමක මුදල් සැම විටම රඳවා තබා ගැනීම සිදු වේ. සමස්ත නියැදියේ 13%කගේ අත්දුටු පරිදි අපනයනකරු එක් ඇනවුමක මුදල් තමා වෙත රඳවා ගනු ලැබේ. මේ නිසා ගොවීන්ට ගෙවිය යුතු මුදල් ප්‍රමාද වේ. එනමුත් ගොවීන් තම නිෂ්පාදන සැපයූ අවස්ථාවේම මුදල් අපේක්ෂා කරයි. එසේ නොමැති විට ගොවීන් වෙනත් සැපයුම්කරුවන් වෙත යොමු වේ. නමුත් සමහර සැපයුම්කරුවන් මෙම ව්‍යාපාරයේ යෙදී සිටින්නේ පුළුල් ආයෝජන හැකියාවක් නොමැතිවයි.

සැපයුම්කරුගේ අවශ්‍යතා ඉටුකිරීම සම්බන්ධයෙන් අපනයනකරුවන් දක්වන්නේ ඉතාමත් ඇල් මැරුණු ස්වභාවයක් වුවද සැපයුම්කරුවන්හට ගොවීන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට සිදුවී ඇත. ගොවීන්ගේ වගාවට අවශ්‍ය යෙදවුම් ලබා ගැනීම හා වෙනත් හදිසි අවශ්‍යතා වෙනුවෙන් මුදල් ලබාදීම ඒ අතර වේ. මෙම අවශ්‍යතා ඉටු කිරීම සඳහා මුදල් අවශ්‍ය විට දී අපනයනකරුවන්ගෙන් ඒ සඳහා ප්‍රමාණවත් සහයක් නොලැබෙන බව සැපයුම්කරුවන් බහුතරයකගේ අදහසයි.

අපනයනකරුවන්ට අවශ්‍ය වන්නේ තමාගේ ඇනවුම සපුරාලීම පමණි. නමුත් සැපයුම්කරුවන් එළවළු නිෂ්පාදන සැපයීමට ගොවි ජාලයක් හඳුනා ගෙන ඇති අතර ඒ අයගේ අවශ්‍යතා ඉටු නොකළ විට ගොවීන් වෙනත් සැපයුම්කරුවන් වෙත යාමද හඳුනා ගැනීමට හැකිවිය.

### 4.7.3 පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය

පුහුණු ශ්‍රමිකයින් සොයා ගැනීම දුෂ්කර කාර්යයක් වූ බව සෑම දිස්ත්‍රික්කයක් තුළින්ම වාර්තා විය. එළවළු තේරීම සඳහා පුහුණුව ලබාදීමෙන් අනතුරුව ඔවුන් වෙනත් රැකියා සඳහා යාම නිසා යළි

යළිත් මේ සඳහා හුරු පුරුදු කළ යුතුය. එක් දිනයකින් ඇණවුම් සම්පූර්ණ කිරීමේදී ඵළවළු තේරීම හා ඇසිරීම සඳහා ශ්‍රමිකයින් ඉතාමත් ක්‍රියාශීලීව වැඩ කළ යුතුය. නුපුහුණු ශ්‍රමිකයින් යෙදවීමේ දී වැඩි ශ්‍රමිකයින් සංඛ්‍යාවක් යෙදවීමට සිදු වේ. ශ්‍රමිකයින් සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදුවීම මගින් ගොවීන්ට නිෂ්පාදන සඳහා වැඩි මිලක් ගෙවීමට නොහැකි වී ඇත.

### 4.7.4 යටිතල පහසුකම් ආශ්‍රිත ගැටලු

ඵළවළු ප්‍රවාහනයට පෙර ගබඩා කිරීම සිදුවන අවස්ථා හඳුනා ගැනීමට හැකිවිය. බහුතරය සැපයුම්කරුවන්ට ඵළවළු ගබඩා කිරීමට විශේෂිත පහසුකම් නොමැත. ඔවුන් ගොවීන්ගෙන් ලබා ගත් ඵළවළු ගබඩාකර තබා ගන්නේ තමන්ගේ ඵළවළු සැපයුම් ක්‍රියාවලිය පවත්වා ගෙන යන වෙළඳසැලේම වන අතර ඒ සඳහා ප්ලාස්ටික් බඳුන් හෝ ලී පෙට්ටි භාවිත කරයි. ශීතකරණ සහිත වාහන හෝ ගබඩා පහසුකම් පැවතුණි නම් වියළීම හා අපතේ යාම අඩු වේ. ඵළවළු අපනයනයේ දී ගබඩාකරණය වැදගත් වන අතර සැපයුම්කරුවන් අතරින් ශීතකරණ සහිත වාහන සතු වූයේ ඉතාමත් සුළු සංඛ්‍යාවකට පමණි. ශීතාගාර පහසුකම් නොමැතිවීමත් ඒ සඳහා සහන ණය ක්‍රමයක් නොමැති වීමත් සැපයුම්කරුවන්ගේ ගබඩා අවශ්‍යතා සපුරා ගැනීමට පවතින බාධකයන් වේ.

ඵළවළු සපයා ගැනීම සඳහා සැපයුම්කරුවන් හෝ අපනයනකරුවන් ප්‍රවාහන පහසුකම් සපයන බැවින් නිෂ්පාදකයාට ප්‍රවාහන ගැටලු නොමැති තරම් වේ. ඵළවළු වර්ග විශාල සංඛ්‍යාවකින් යුතු ඇණවුමක් සැපිරීමේ දී නිෂ්පාදකයින් රාශියකගෙන් ඵළවළු සපයා ගැනීමට සිදු වෙයි. එහිදී ප්‍රවාහන පහසුකම් සඳහා අධික වියදමක් දැරීමට සිදු වේ. අපනයනකරුවන් බොහෝවිට කටුනායක ගුවන්තොටුපල කේන්ද්‍ර කොට ගත් ආසන්නතම නගරවල සිට ක්‍රියාත්මක වන බැවින් ඵළවළු සපයා ගැනීමට අවශ්‍ය කන්ටේනර් (සමහර අවස්ථාවල දී අඩි 20ක් වැනි දිගට) සැපයුම් ප්‍රදේශ කරා රැගෙන යාමට අධික ප්‍රවාහන වියදමක් දැරීමට සිදුවන අවස්ථා ද ඇත.

ශීතකරණ සහිත වාහන භාවිතා කිරීමෙන් ඵළවළුවල ගුණාත්මකභාවයට හානි නොවේ. නමුත් ඇණවුම්වල අවිනිශ්චිතතාව හේතුවෙන් මෙවැනි වාහන සඳහා විශාල මුදලක් ආයෝජනය කිරීමට සැපයුම්කරුවෝ මැළි වෙති. නුවරඵළියේ සිට කොළඹ දක්වා අපනයනකරු වෙත ඵළවළු සැපයීමේ දී එක් ප්ලාස්ටික් බහාළුමක් සඳහා රු.300.00ක මුදලක් අපනයනකරු සැපයුම්කරුට ගෙවනු ලබයි. සමස්ත නියැදියේ සැපයුම්කරුවන් 23%ක් මෙම දුෂ්කරතාවට මුහුණපා ඇත.


තවද සමස්ත සැපයුම්කරුවන්ගෙන් 38% ප්‍රතිශතයක් ණය ලබා ගෙන තිබුණි. කොමර්ෂල් බැංකුව, සම්පත් හා මහජන බැංකුව වෙත වැඩි වශයෙන් යොමු වී තිබුණ අතර අධ්‍යයනය සඳහා තොරතුරු ගන්නා අවස්ථාවේ දී ඔවුන් ලබා ගෙන තිබූ ණයවලින් 90%ක් ගෙවා තිබුණි. ලබාගත් ණයවලින් 16%ක ප්‍රතිශතයක් යොදවා තිබුණේ ගොවි නිෂ්පාදන මිලදී ගැනීමට වන අතර 12% ප්‍රතිශතයක් ප්‍රවාහනයට අවශ්‍ය ලොරි සහ වෑන් වර්ග මිලදී ගැනීමටයි. මෙම වාහන බහුතරයක් ලීසිං ක්‍රමයට එල්බී ෆිනෑන්ස්, එල්.ඕ.එල්.සී., එච්.එන්.බී යන ආයතනවලින් ලබා ගෙන තිබුණි. තව ද සැපයුම්කරුවන්ගෙන් 5%ක ප්‍රතිශතයක් පුද්ගලිකව 20% පොළී අනුපාතයට ණය ලබා ගත් අවස්ථා ක්ෂේත්‍රයේදී හඳුනා ගැනීමට හැකි විය. එළවළු ඇසුරුම්කරණය හා ගබඩාකරණය සඳහා 4% ප්‍රතිශතයක් ණය මුදල් යොදවා තිබුණි. බැංකුවකින් ණය ලබාගැනීම සඳහා ඇපකර වශයෙන් නිරවුල් ඔප්පු අවශ්‍ය වන අතර නිරවුල් ඉඩම් නොමැතිවී තම වත්කම සහතික කිරීමට නොහැකි වීමෙන් සැපයුම්කරුවන් අතරින් 19%ක් (මාතලේ 10%, නුවරඑළිය 22%, බදුල්ල 29%) ණය ලබා ගැනීමේ දුෂ්කරතාවලට මුහුණ පා ඇත.

### 4.7.5 සැපයුම්කරුවන්ට සාමුහිකව කටයුතු කිරීම සඳහා අවස්ථාවක් නොමැතිවීම

සැපයුම්කරුවන්ගෙන් 23%ක ප්‍රතිශතයක් සැපයුම්කරුවන්ගේ සමිති අවශ්‍ය බව සඳහන් කළහ. මෙය දිස්ත්‍රික්ක වශයෙන් බදුල්ල 40%ක්, නුවරඑළිය 39%ක් හා මාතලේ 48%ක් ලෙසින් විය. සමිතියක අවශ්‍යතාව පිළිබඳ කරුණු රාශියක් ඉදිරිපත් විය. ඒවා පහත දැක්වෙන පරිදි වේ.

- මෙවැනි සමිතියක් තුළින් එළවළු අපනයනය සඳහා අවශ්‍ය ගොවීන් හඳුනා ගැනීමට හැකි වීම
- අපනයන ප්‍රමිතීන්ට වගා කිරීම, එළවළු තේරීමේ ක්‍රමවේද පිළිබඳ ගොවීන් රාශියකට කරුණු එකවර පහදා දීමේ හැකියාව ලැබීම
- ගොවීන්,සැපයුම්කරුවන් හා අපනයනකරුවන් අතර සම්බන්ධතාව වර්ධනය වීම

ඉහත සඳහන් කරුණු බොහෝ සැපයුම්කරුවන්ට පොදු වූ අතර ඔවුන් අතරින් හයදෙනෙකුගේ (23%) ව්‍යවසායන් ආරම්භක අවස්ථාවට වඩා යම් පසුබෑමකට ලක්වී ඇති බව දත්තවලින් තහවුරු වේ (ප්‍රස්තාර අංක 4.10). එළවළු අස්වැන්න අඩුවීම, බීජවල ගුණාත්මය අඩුවීම හේතුවෙන් එළවළුවල ගුණාත්මය පහත වැටීම, අපනයනකරුවන් මුදල් ගෙවීම ප්‍රමාද කිරීම හා අඩු මිල ගණන් ගෙවීම අපනයනකරුවන්ට ලැබෙන ඇණවුම් ප්‍රමාණය පහත වැටීමෙන් සැපයුම්කරුවන් වෙත ලබා දෙන ඇණවුම් ප්‍රමාණය ද පහත වැටීම සහ විශාල වශයෙන් එළවළු ප්‍රතික්ෂේප කිරීම යනාදී කරුණු හේතුවෙන් අධෛර්යමත්වීම මෙසේ ඔවුන්ගේ ව්‍යවසායන් බිඳ වැටීමට හේතුවී ඇත.




මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

ප්‍රස්තාර අංක 4.10 : එළවළු සැපයුම් කර්මාන්තයේ වර්ධනයක් වාර්තා නොවූ ව්‍යවසායන්හි බිඳ වැටීම

සැපයුම්කරුවන් ක්‍රියාත්මක වන ප්‍රදේශය (දිස්ත්‍රික්කය අනුව) එළවළු අපනයන කර්මාන්තයන්හි ප්‍රගතිය හෝ බිඳවැටීම බොහෝ සමාජ-ආර්ථික සාධක සමඟ සබඳතාවක් පෙන්නුම් නොකරන බව දත්තවලින් තහවුරු වේ. එනම් සැපයුම්කරුවන් එළවළු මිලදී ගැනීම සඳහා කරන මුළු ආයෝජනය ($\rho = 0.035$, $p = 0.130$), පළපුරුද්ද හෙවත් කර්මාන්තයේ නියැළී සිටි කාලය ($\rho = 0.240$, $p = 0.238$), අධ්‍යාපන මට්ටම ($\chi^2$අගය = 0.033; $p = 0.856$) හෝ වයස ($\rho = 0.011$, $p = 0.956$) සමඟ ද කර්මාන්තයේ ප්‍රගතිය විචලනය වී නැත. මේ අනුව සැපයුම්කරුවන්ගේ ව්‍යවසායන්වල වර්ධනය හෝ ප්‍රගතිය ඔවුන්ගේ පාලනයෙන් බැහැර වූ සාධක මත තීරණය වී ඇති බව මෙම අධ්‍යයනයෙන් හෙළිදරව් වේ.

## පස්වැනි පරිච්ඡේදය

## එළවළු සැපයුම් අගයදාම

### 5.1 හැඳින්වීම


දෙවැනි පරිච්ඡේදයේ විග්‍රහ කර ඇති පරිදි දේශීය එළවළු අපනයන වෙළඳපොළ තුළ කැපී පෙනෙන විවිධත්වයන් දක්නට ලැබේ. මාලදිවයින වැනි සංචාරක කර්මාන්තය තීව්‍ර ලෙස ක්‍රියාත්මක වන රටවල්වලින් උඩරට හරිතාගාර එළවළු සඳහා ඉල්ලුමක් පවතී. මැදපෙරදිග රටවල රැකියාවන්හි නියුතු ශ්‍රී ලාංකීය ශ්‍රම බලකායෙන් පහතරට එළවළු සඳහා විශේෂ ඉල්ලුමක් පවතී. උඩරට විවෘත වගා භූමිවල නිෂ්පාදන සඳහා ද ඊට සමාන ඉල්ලුමක් පවතී. මෙම විවිධ වූ අවශ්‍යතා සපුරාලීම සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශවල වගා කරන එළවළු සපයා ගැනීම අපනයන නියෝජිතයන්ට තරමක් දුෂ්කර කාර්යයකි. විදේශ වෙළඳපොළෙන් ලැබෙන විවිධත්වයෙන් යුත් ඇණවුම් සඳහා අවශ්‍ය එළවළු, අපනයන ප්‍රමිතීන්ට සරිලන පරිදි හා ඇණවුම් සම්පූර්ණ කළ යුතු කාලසීමාවන්ට යටත්ව සපයා ගත යුතුය. ඒ අනුව වඩාත් සංවිධානගත සැපයුම් ජාලයක අවශ්‍යතාව මෙන්ම ඉතා කෙටි කාලයක් තුළ ඇණවුම් සැපිරීම සඳහා ඒවා ඉහළ කාර්යක්ෂමතාවයකින් යුතුව ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව ඉතා පැහැදිලිය.

අපනයනකරුවෝ බොහොමයක් කටුනායක ගුවන් තොටුපල කේන්ද්‍ර කර ගනිමින් කොළඹ හා ගම්පහ ප්‍රදේශවල සිට ක්‍රියාත්මක වෙති. සමහර අපයනකරුවෝ ඒ සඳහා ගොවීන් සමඟ සෘජු සබඳතා පවත්වති. නමුත් බහුතරයක් අපනයනකරුවෝ අතරමැදියන් හරහා සිය ඇණවුම් සපුරා ගනිති. සැපයුම්කරුවන්ගේ ව්‍යවසායන්වල විශාලත්වය අනුව සැපයුම් ජාලවලට සම්බන්ධ ගොවීන් සංඛ්‍යාව විචලනය වේ.

අධ්‍යයනයේ සීමාකාරීකම් යටතේ සඳහන් කළ පරිදි එළවළු අපනයනය පිළිබඳ බොහෝ මූලික තොරතුරු අනාවරණය වී නැත. එළවළු වගා කරන ගොවීන්ගේ මෙන්ම සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව හා ව්‍යාප්තිය ද එසේ අනාවරණය නොවූ තොරතුරුවලට ඇතුළත් වේ. එබැවින් මෙම සමීක්ෂණය සඳහා ගොවීන් හා සැපයුම්කරුවන් සොයා ගැනීම දුෂ්කර විය. ව්‍යාපාරිකමය රහස්‍යභාවය ආරක්ෂා කිරීම වෙනුවෙන් එම තොරතුරු අනාවරණය කිරීම සඳහා අපනයන කර්මාන්තයට සම්බන්ධ බොහෝ පුද්ගලයෝ මැළිකමක් දක්වති. ඉහත කී දුෂ්කරතා මධ්‍යයේ

අනාවරණය කර ගත් සැපයුම්කරුවන් සංඛ්‍යාව මත පදනම් වෙමින් හඳුනා ගනු ලැබූ එළවළු සැපයුම් අගයදාමයන් රූපසටහන් අංක 5.1න් ඉදිරිපත් කර ඇත.

**රූපසටහන් අංක 5.1 : නිෂ්පාදකයන් විසින් එළවළු බෙදා හරින සැපයුම් ජාල**




**මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014**

රූපසටහන් අංක 5.1න් ඉදිරිපත් කළ එළවළු සැපයුම් අගයදාම 6 පිළිබඳව කෙටි විස්තරයක් පහතින් ඉදිරිපත් කෙරේ. මෙම පරිච්ඡේදයේදී ද භාවිතයේ පහසුව උදෙසා අපනයනය සඳහා නිෂ්පාදන එකතුකරන්නා සැපයුම්කරු වශයෙන් හඳුන්වා ඇත.

**1. ආරක්ෂිත ගෘහ සහිත අපනයන දායකත්වය 65%ට වැඩි ගොවීන් අපනයනකරු වෙත සෘජුව එළවළු සැපයීම**

ආරක්ෂිත ගෘහ සහිත එළවළු කි.ග්‍රෑ. 3000ක් පමණ අපනයනය සඳහා සපයන රුපියල් ලක්ෂ හයකට ආසන්න ආදායමක් උපයන එක් අති සාර්ථක එළවළු නිෂ්පාදකයෙක් පමණක් මෙම අගයදාමය නියෝජනය කරයි. අපනයනකරු හා සෘජු සබඳතා පවත්වන බැවින් නිෂ්පාදකයා විසින් ගුණාත්මක එළවළු නිපදවීමටත් ඒවා නිසි පරිදි තේරීමටත්, හානි නොවන පරිදි ඇසිරීමටත්, නිසි පරිදි ඇණවුම් සම්පූර්ණ කිරීමටත් උත්සාහ දරන බැවින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී අගය දාමය මෙය වේ. එනමුත් සෑම ගොවියෙකු සඳහාම එසේ අපනයනකරු හා සබඳතා පැවැත්වීමට නොහැකි බැවින් මේ අගයදාමයේ ප්‍රායෝගිකත්වය අඩුය.

**2. ආරක්ෂිත ගෘහ සහිත අපනයන දායකත්වය 65%ට වැඩි ගොවීන් සැපයුම්කරුවෙකු හරහා අපනයනකරු වෙත එළවළු සැපයීම**

නියැදිය නියෝජනය කළ එළවළු නිෂ්පාදකයන් සංඛ්‍යාව අතින් දෙවැනි තැන ගනු ලැබූ අගය දාමයයි. බදුල්ල දිස්ත්‍රික්කයේ අපනයනය ඉලක්ක කර ගත් හරිතාගාර නිෂ්පාදකයන් මෙම කාණ්ඩය මගින් නියෝජනය කළ අතර හරිතාගාර පොදු අපනයන සමාගම වෙත ඔවුන්ගේ නිෂ්පාදන සැපයීමට හැකිවීම හේතුවෙන් ඔවුන් ඇණවුම් පිළිබඳ අවිනිශ්චිතතාවට මුහුණ පාන්නේ නැත. එක් කන්නයක දී මෙම කණ්ඩායමේ සාමාන්‍ය අපනයන සැපයුම කි.ග්‍රෑ. 2320කි. සාමාන්‍ය අපනයන ආදායම රු.410750/-කි. අපනයනය ඉලකක්ක කර ගනිමින් මිලෙන් වැඩි එළවළු නිෂ්පාදනය කරන ගොවීන් නියෝජනය කරන මෙම අගයදාමය ප්‍රායෝගිකත්වයෙන් ඉහළ වඩාත් කාර්යක්ෂම හා ඵලදායී එළවළු සැපයුම් අගය දාමය වේ.

**3. ආරක්ෂිත ගෘහ සහිත අපනයන දායකත්වය 65%ට අඩු ගොවීන් සැපයුම්කරුවෙකු හරහා අපනයනකරු වෙත එළවළු සැපයීම**

ආරක්ෂිත ගෘහ සහිත නමුත් මෙම ගොවියෝ දේශීය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් විවෘත භූමිවල ද බෝග වගා කර ඒවා අපනයනය සඳහා සපයති. අපනයනය සඳහා එළවළු සැපයීමෙන් ලබන ආදායම පළමු හා දෙවන අගයදාමයන්ට වඩා අඩුය. ගුණාත්මක එළවළු සැපයීම, අවශ්‍ය අවස්ථාවල දී අවශ්‍ය ප්‍රමාණවලින් එළවළු සැපයීම යන අවශ්‍යතා ඉටු කර ගැනීම සම්බන්ධයෙන්

මෙම ගොවීන් මත වැඩි බලාපොරොත්තු තබා ගත නොහැක්කේ ඔවුන්ගේ ප්‍රධාන ඉලක්කය දේශීය වෙළඳපොළ වීම නිසාය.

**4. ආරක්ෂක ගෘහ රහිත අපනයන දායකත්වය 65%ට වැඩි සැපයුම්කරුවෙකු හරහා අපනයනකරු වෙත එළවළු සැපයීම**

විවෘත වගා භූමිවල එළවළු වගා කරන මෙම අගයදාමය නියෝජනය කරන ගොවි කාණ්ඩය සිය නිෂ්පාදනවලින් බොහෝ ප්‍රමාණයක් අපනයනය සඳහා සපයති. අපනයනය සඳහා සපයන සාමාන්‍ය එළවළු ප්‍රමාණය අතින් ඔවුහු පළමු ස්ථානයේ රැඳෙති (කි.ග්‍රෑ.3799). එබැවින් ඉන් උපයන සාමාන්‍ය ආදායම රුපියල් ලක්ෂ හතර ඉක්මවා ඇත.

**5. ආරක්ෂිත ගෘහ රහිත අපනයන දායකත්වය 65%ට අඩු ගොවීන් සැපයුම්කරුවෙකු හරහා අපනයනකරු වෙත එළවළු සැපයීම**

මෙය නියැදියට අයත්වූ වැඩිම ගොවීන් සංඛ්‍යාවක් නියෝජනය කළ අගයදාමය වේ. විවෘත වගා භූමිවල බෝග වගා කරන මෙම ගොවීන් අතරට මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කළ පහත රට එළවළු වගා කරන ගොවීන් මුළුමනින්ම පාහේ ඇතුළත් වී ඇත. වගා කරන එළවළුවලින් හොඳම කොටස තෝරා සැපයුම්කරු වෙත සපයා මෙම ගොවීන් අපනයනය සඳහා සපයන එළවළු ප්‍රමාණය (සාමාන්‍ය අගය කි.ග්‍රෑ. 1771) හා ඉන් උපයන ආදායම (සාමාන්‍ය අගය රු.133929) අතින් දුර්වල මට්ටමේ සිටින ගොවි කණ්ඩය වේ.

**6. ආරක්ෂිත ගෘහ රහිත අපනයන දායකත්වය 65%ට අඩු අපනයනකරු වෙත සෘජුවම එළවළු සැපයීම**

මෙම අගයදාමය නියෝජනය කරන ගොවීන් සංඛ්‍යාව ද සීමිත වුවද ඔවුහු සෘජුවම අපනයනකරු හා සම්බන්ධ වීමේ අවස්ථාව ලබා සිටිති. එබැවින් සැපයුම්කරු හරහා එළවළු සැපයීම අතින් පමණක් මෙම කණ්ඩායමට වඩා වෙනස් වන (පස්වන අගයදාමය නියෝජනය කරන) ගොවීන්ට වඩා වැඩි එළවළු ප්‍රමාණයක් (සාමාන්‍ය අගය කි.ග්‍රෑ. 1935 ක්) හා වැඩි අපනයන ආදායමක් (සාමාන්‍ය අගය රු.159071) උපයා ඇත.

වගු අංක 5.1 මගින් ඉහත සඳහන් අගයදාමයන් නියෝජනය කරන ගොවි කණ්ඩායම්වලට අදාළ දත්ත ඉදිරිපත් කර ඇත. ඒ අනුව අපනයනකරු වෙත සෘජුවම හෝ සැපයුම්කරු හරහා එළවළු

සැපයීම තුළින් එම ගොවි කණ්ඩායම් උපයා ගනු ලබන ආදායමේ පවතින විචලතා වෙසෙසියාත්මක වේ (F = 4.031, P = 0.002).

ඉහත අගයදාම අතරින් සෘජුවම අපනයනකරු වෙත එළවළු සපයන ගොවීන් අතරින් 88%කගේ ව්‍යාපාර ඒවායේ ආරම්භක අවස්ථාවට වඩා ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත. නමුත් සැපයුම්කරු හරහා එළවළු සපයන ගොවීන් අතරින් ව්‍යාපාර වර්ධනයක් අත්පත් කර ගෙන ඇත්තේ ගොවීන් 49%ක ප්‍රතිශතයක් පමණි. මෙම අධ්‍යයනයට අනුව සැපයුම්කරුවෙකු හරහා අපනයනකරුට එළවළු සැපයීමට සාපේක්ෂව සෘජුවම අපනයනකරු වෙත එළවළු සැපයීමෙන් ගොවීන් සිය ව්‍යාපාරවල අත්කර ගෙන ඇති ප්‍රගතිය සංඛ්‍යානමය වශයෙන් වෙසෙසියාත්මක වේ ($\chi^2$ අගය = 4.250, P = 0.039).

වගා ක්‍රමය පිළිබඳ අවධානය යොමු කළ විට හරිතාගාර නිෂ්පාදකයන් අතරින් 63%ක් ද, හරිතාගාර රහිත ගොවීන් අතරින් 49%ක් ද සිය ව්‍යාපාරයන්හි ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත. තවද අපනයන දායකත්වය 65%ට වැඩි ගොවීන් 55%ක් හා අපනයන දායකත්වය 65%ට අඩු ගොවීන් 51%ක් සිය ව්‍යාපාරවල ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත. එනමුත් වගා ක්‍රමය ($\chi^2$ අගය = 0.804, P = 0.370) හෝ අපනයන දායකත්වය ($\chi^2$ අගය = 0.168, P = 0.684) ව්‍යාපාරවල ප්‍රගතිය සමඟ සංඛ්‍යානමය වශයෙන් වෙසෙසියාත්මක සබඳතා පෙන්නුම් නොකරයි. නමුත් ගොවීන් වගා කටයුතුවල නියැළෙන ප්‍රදේශ ව්‍යාපාරවල ප්‍රගතිය හා සංඛ්‍යානමය වශයෙන් වෙසෙසියාත්මක සබැඳතාවක් පෙන්වනු ලැබේ ($\chi^2$ අගය = 6.200, P = 0.045). බදුල්ලෙන් ගොවීන් 55%ක් , නුවරඑළියෙන් ගොවීන් 73%ක් හා මාතලෙන් ගොවීන් 40%ක් සිය ව්‍යාපාරවල වර්ධනයක් ලබා ඇත. මෙසේ අධ්‍යයන ප්‍රදේශ මඟින් නියෝජනය කරනු ලබන්නේ හරිතාගාර බෝග මෙන්ම විවෘත වගා ක්ෂේත්‍රවල වගා කරන බෝග යන දෙවර්ගයම අපනයන සැපයීම සිදු කරන නුවරඑළියේ ගොවීන් මෙම කර්මාන්තයෙන් වඩාත් ඵල ප්‍රයෝජන අත් කර ගෙන ඇති බවයි. බදුල්ලේ ගොවීන් සියලුම දෙනා හරිතාගාර නිෂ්පාදකයන් වූ අතර ඔවුන් සමහරකගේ පසුබෑම මෙම හරිතාගාර බෝග නිෂ්පාදනය ආශ්‍රිත ගැටලුවල ප්‍රතිඵලයකි. මාතලේ දිස්ත්‍රික්කය තුළ තත්ත්වයෙන් පිළිබිඹු වන්නේ පහත රට එළවළු අපනයනය ආශ්‍රිත ගැටලු වේ.

වගු අංක 5.1 : එළවළු සැපයුම් අගයදාම නියෝජනය කළ ගොවීන්ගේ ආර්ථික පරාමිතීන්

| අගයදාමය | අපනයනය සඳහා එළවළු සැපයීම ආශ්‍රිත ආර්ථික පරාමිතික | | | ව්‍යාපාර වර්ධනය වූ ගොවි ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | මධ්‍යන්‍ය ආදායම (එක් කන්නයක් සඳහා රු.) | මධ්‍යන්‍ය එළවළු සැපයුම (කි.ග්‍රෑ.) | මධ්‍යන්‍ය ආදායම් වෙනස (රු.) | |
| 1 | 562500 | 3100 | 376500 | 100 |
| 2 | 410750 | 2320 | 132780 | 56 |
| 3 | 366800 | 2333 | 211531 | 63 |
| 4 | 412712 | 3799 | 241858 | 50 |
| 5 | 133929 | 1771 | 214752 | 42 |
| 6 | 159071 | 1935 | 71929 | 85 |
| F අගය | 4.031 | 1.417 | 0.452 | - |
| P අගය | 0.002 | 0.226 | 0.811 | - |

මූලාශ්‍රය: හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

එළවළු සැපයුම් අගයදාම නියෝජනය කරන ගොවීන්ගේ ව්‍යාපාරවල ප්‍රගතිය පිළිබඳ අවධානය යොමු කළ විට පෙනී යන්නේ අපනයනකරු හා සෘජුව සබඳතා පවත්වන ගොවීන් ඉහළම ප්‍රගතිය අත්පත් කර ගෙන ඇති බවයි. එනමුත් මෙම අගයදාම ඔස්සේ නියෝජනය වන්නේ සුළු ගොවි ප්‍රතිශතයකි. එවැනි අගයදාම වෙත ඇතුළත් වීමට ගොවීන් සතු ඉඩ ප්‍රස්ථාවන් ද සීමිතය. වඩාත් ප්‍රායෝගික එළවළු සැපයුම් අගයදාම ලෙස හඳුනා ගත හැකි අගයදාම නියෝජනය කරන ගොවීන් බහුතරය සිය ව්‍යාපාරවල ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර එම අගයදාම හරිතාගාර ගොවීන් විසින් නියෝජනය කරනු ලැබේ. ඔවුන් අතරින් ව්‍යාපාර වර්ධනය කර ගැනීම අපනයන දායකත්වය 65%ට අඩු හරිතාගාර ගොවීන් අතරින් 63%ක් ද අපනයන දායකත්වය 65%ට වැඩි හරිතාගාර ගොවීන් අතරින් 56%ක් ද ලෙස වාර්තා වේ.

මෙම සියලු කරුණු පිළිබඳ අවධානය යොමු කළ විට පෙනී යන්නේ නිශ්චිත ඇණවුම් ලැබීම, ඉහළ වටිනාකමකින් යුතු බෝග වගා කිරීම, හරිතාගාර තුළ එළවළු වගා කිරීම, සෘජුවම අපනයනකරු වෙත එළවළු සැපයීම හා වැඩි එළවළු ප්‍රමාණයක් අපනයනය සඳහා සැපයීම යන කරුණු ගොවිජනතාවගේ ආදායම ඉහළනැංවීම සඳහා හේතුවන බවයි. නමුත් අපනයනය සඳහා එළවළු සපයන ගොවීන් බහුතරයක්, දේශීය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් වගා කටයුතුවල නියැළෙන අතර අපනයනය සඳහා එළවළු සැපයීම ඔවුන්ට අමතර කාර්යක් පමණි. එබැවින් ගුණාත්මයෙන් ඉහළ එළවළු නිපදවීම සඳහා විශේෂ වගා ක්‍රම අනුගමනය කිරීම හෝ අවශ්‍ය ප්‍රමාණවලින් හා අවශ්‍ය අවස්ථාවන් හි දී ඇණවුම් සම්පූර්ණ කිරීම සඳහා සැලසුම් සහගත ලෙස එළවළු වගා කිරීම හෝ අස්වනු නෙළීම ඔවුන්ගෙන් අපේක්ෂා කළ නොහැක.

## හයවැනි පරිච්ඡේදය
## සාරාංශ, නිගමන හා නිර්දේශ

### 6.1 හැඳින්වීම

පර්යේෂණ වාර්තාවක අවසන් පරිච්ඡේදයේ අන්තර්ගතය සාරාංශය, නිගමන හා නිර්දේශ යන උප මාතෘකා යටතේ වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කිරීම ගතානුගතික ක්‍රමය වේ. සාරාංශය මගින් අධ්‍යයනයේ සොයා ගැනීම් කැටිකොට ඉදිරිපත් කරන අතර එම සොයාගැනීම් ඔස්සේ නිගමනවලට එළඹී සුදුසු නිර්දේශ ඉදිරිපත් කෙරේ. කවර සොයාගැනීම් මත කවර නිගමනවලට එළඹී ඇත් ද යන්න පිළිබඳව පාඨකයාට අවබෝධ කර දෙනු වස් මෙම පරිච්ඡේදයේ දී සාරාංශය හා නිගමන එක් උප මාතෘකාවක් යටතේ ඉදිරිපත් කර ඇත. ඉන් අනතුරුව එළඹී ඇති නිගමන මත පදනම් වෙමින් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

### 6.2 සාරාංශය හා නිගමන

අපනයනය සඳහා එළවළු වගා කිරීම රට තුළ එළවළු වගාකරන බහුතරයක් එළවළු ගොවීන්ගේ අනුදැනුම සහිතව හෝ ඔවුන්ගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක වන්නේ නැත. එබැවින් එය දේශීය එළවළු ගොවියාට හුරුපුරුදු ව්‍යවසායක් නොවේ. තිර වශයෙන්ම ගණනය කළ නොහැකි නමුත් පසුගිය වසර පහ තුළ නැවුම් හෝ ශීත කළ එළවළු වශයෙන් වසරක දී අපනයනය කළ මෙ.ටො. 17332කට ආසන්න එළවළු ප්‍රමාණය (වසර 2009 සිට 2013 දක්වා අපනයනය කළ එළවළු ප්‍රමාණයේ මධ්‍යන්‍ය අගය) එකී කාලසීමාව තුළ රට තුළ නිපදවූ එළවළු ප්‍රමාණයෙන් 2%ක් පමණ වූ අල්ප මාත්‍රයකි. එබැවින් අපනයනය සඳහා එළවළු වගා කිරීම හා සැපයුම ආශ්‍රිත ගැටලු පිළිබඳ අධ්‍යයනය කිරීම ප්‍රමුඛ අවශ්‍යතාවක් නොවේය යන්න යමෙකුට හැඟී යනු ඇත. එනමුත් දේශීය එළවළු නිෂ්පාදන අංශය වර්තමානයේ දී මුහුණ දී ඇති බොහෝ අභියෝග ජය ගැනීම සඳහා පවතින එක් විකල්පයක් වශයෙන් අපනයනය සඳහා එළවළු වගා කිරීම ප්‍රවර්ධනය කිරීමේ වටිනාකම අවතක්සේරු කළ නොහැක.

දේශගුණික විචලතා, නව හා වැඩි දියුණු කළ තාක්ෂණික ක්‍රම පිළිබඳ අනවබෝධය, බීජ හිඟය හා බීජවල අඩු ගුණාත්මය, අධික යෙදවුම් මිල, උපදේශක සේවා ප්‍රමාණවත් පරිදි නොලැබීම, එළවළු බෝගවල විභව අස්වනු නෙළා ගැනීමට සෘජු හෝ වක්‍ර ලෙස බාධා පමුණුවන සාධකයන් වේ. කාලගුණික විචලතාවලට අනුගත වෙමින් සැලසුම් රහිත නිෂ්පාදන රටාවක් අනුගමනය

කිරීමේ ප්‍රතිඵලය වන්නේ එළවළු සැපයුමේ කාලීන විචලතාවන්ය. එහි එක් අවසාන අහිතකර ප්‍රතිඵලය වන්නේ එළවළු මිල උච්චාවචනයවීම තුළින් එළවළු නිෂ්පාදකයාගේ ආදායම අවිනිශ්චිත වීමය. එය එළවළු ගොවීන්ගේ ජීවන මට්ටම නඟා සිටුවීම සඳහා පවතින බරපතල අභියෝගයක් වී ඇත. එනමුත් ගොවීන් අඛණ්ඩව එළවළු ගොවිතැනේ නියැළෙන්නේ එය ඔවුන්ගේ ජීවනෝපාය වන බැවිනි.

එළවළු නිෂ්පාදන අංශය තුළ දක්නට ලැබෙන මෙකී සම්ප්‍රදායික අතෘප්තිකර හා අභියෝගාත්මක තත්ත්වයෙන් මුදාගැනීම සඳහා පවතින විකල්ප කවරේ ද? එළවළු අපනයනය ඊට කෙතෙක් දුරට සරිලන විකල්පයක් වන්නේද?

වසරක් පාසා සැලකිය යුතු ප්‍රමාණයක් අපතේ යවමින් අතිරික්තයක් ද සහිතව නිපදවන එළවළු ප්‍රමාණයෙන් අද වන විට අපනයනය සඳහා භාවිතා කරනු ලබන සුළු ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා පවතින විභවය කෙතෙක් ද? යන්න මෙම ක්ෂේත්‍රයට අදාළ ආමන්ත්‍රණය කළ යුතු ගැටලු වේ. ඒ සඳහා ගත යුතු පියවර කවරේ ද? හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය වර්ෂ 2013 දී දේශීය එළවළු හා පලතුරු කර්මාන්තයේ ප්‍රගතිය පිළිබඳව සිදු කළ විශ්ලේෂණයකින් (සුභාෂිනී ඇතුළු පිරිස - පළ නොවූ) පැහැදිලි වන්නේ එම කර්මාන්තයේ ප්‍රගතිය ඉතා මන්දගාමී බවයි. එම කර්මාන්තය අපනයනකරුවන් සමූහයක් විසින් හසුරුවනු ලබන කතිපයාධිකාරියකි.

අපනයනකරුවන් දරන මතයට අනුව විදේශ විනිමය උපයා ගැනීම අතින් සුවිශේෂ වැදගත්කමක් උසුලනු ලබන මෙම කර්මාන්තය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා බොහෝ බාධක තිබේ. එළවළු නිෂ්පාදනයෙන් ඇරඹී, සැපයුම්කරුවන්ගේ මැදිහත්වීමෙන් අපනයනකරු වෙත එළවළු සැපයෙන අගයදාම හරහා මෙම කර්මාන්තය ක්‍රියාත්මක වන අතර ගුණාත්මක එළවළු සපයා ගැනීමට නොහැකිවීම හා අවශ්‍ය ප්‍රමාණවලින් ඇණවුම් සම්පූර්ණ කළ යුතු අවස්ථාවන්හි දී එළවළු සපයා ගත නොහැකිවීම එළවළු අපනයන අගය දාමයන්වල ප්‍රාරම්භක පියවර ආශ්‍රිත දුර්වලතාවන් වේ.

එබැවින් අපනයනය සඳහා එළවළු වගා කිරීම හා සැපයුම පිළිබඳවත් ඊට දායකත්වය සැපයීම තුළින් සැපයුම්කරුවන් හා එළවළු ගොවීන් අත්කර ගත් ප්‍රතිලාභ හා ඔවුන් මුහුණපාන ගැටලු පිළිබඳවත් විශේෂයෙන් අපනයනය සඳහා එළවළු සැපයීමේ දී ගුණාත්මක, ප්‍රමාණාත්මක හා

කාලීන සැපයුම යන අවශ්‍යතා සපුරාලීමට ඔවුන් අපොහොසත් වී ඇත්තේ මන්ද යන්න පිළිබඳවත් මෙම අධ්‍යයනය මගින් විමර්ශනය කරන්නට යෙදුණි.

එළවළු අපනයන කර්මාන්තයට සම්බන්ධ ගොවීන් හා සැපයුම්කරුවන් කවුරුන්ද යන්න අනාවරණය කර ගැනීමට අවශ්‍ය ද්විතීක දත්ත හෝ ඒවා ලබා ගත හැකි විශ්වාසදායක ප්‍රභවයන් නොමැතිවීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන සීමාකාරී සාධකයන් ලෙස සඳහන් කළ යුතුය. එබැවින් මෙම කර්මාන්තයට සම්බන්ධ පාර්ශ්වකරුවන් හමු විය හැකි වනු ඇතැයි අපේක්ෂා කළ දිවයිනේ එළවළු වගා කරන ප්‍රදේශවල සිදු කළ පූර්ව නිරීක්ෂණවලට අනුව නුවරඑළිය, බදුල්ල හා මාතලේ දිස්ත්‍රික්ක ඇසුරෙන් මෙම අධ්‍යයනය දියත් කරන ලදී. එබැවින් මෙම අධ්‍යයනය සඳහා තෝරා ගත් අධ්‍යයන ප්‍රදේශ හෝ ගොවීන් හා සැපයුම්කරු නියැදිය මගින් සමස්ත එළවළු අපනයන කර්මාන්තය පිළිබඳ කෙතෙක් දුරට නියෝජනය වේද යන්න අවිනිශ්චිතය. එනමුත් අධ්‍යයන අරමුණු ඉටු කර ගනිමින් වලංගු නිගමන වෙත එළඹීම සඳහා එම නියෝජනය ප්‍රමාණවත් වූ බව සඳහන් කළ යුතුය.

මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූ පරිදි ආරක්ෂිත ගෘහ තුළ වගා කරන එළවළු මෙන්ම විවෘත වගා භූමිවල නිපදවනු ලබන එළවළු ද අපනයනය සඳහා භාවිතා කරයි. දේශීය එළවළු සඳහා විදේශ වෙළඳපොළ විශේෂීකරණය වී ඇති ආකාරය අනුව මෙම ඉල්ලුම නිර්මාණය වී ඇත. මාලදිවයින වැනි සංචාරක කර්මාන්තය තීව්‍ර ලෙස ක්‍රියාත්මක වන රටවල් වෙතින් හරිතාගාර එළවළු සඳහාත්, මැදපෙරදිග ජීවත් වන ශ්‍රී ලාංකිකයන් ඇතුළු ආසියාතිකයන් වෙතින් විවෘත වගා භූමිවල වගා කරන උඩරට හා පහතරට එළවළු සඳහාත් පවතින ඉල්ලුම එකී සුවිශේෂතාවය වේ.

බදුල්ල දිස්ත්‍රික්කයෙන් හමුවන බහුතරයක් ගොවීහු අපනයනය ඉලක්ක කරගත් නිෂ්පාදන රටාවක් අනුගමනය කරනු ලබන අතර ඔවුන්ගේ සියලුම නිෂ්පාදනයේ වැඩි කොටස අපනයනය සඳහා සපයති. පිපිඤ්ඤා, තක්කාලි, බෙල්පෙපර් හා අමුමිරිස් ඔවුන් බහුල වශයෙන් වගා කර අපනයනය සඳහා සපයන බෝග වේ. ආරක්ෂිත ගෘහ තුළ මෙන්ම විවෘත ක්ෂේත්‍රවල ද බෝග වගා කර තම නිෂ්පාදන අපනයනය සඳහා සැපයීමෙන් අනතුරුව සුපිරි වෙළඳපොළට හා දේශීය වෙළඳපොළට ද සපයනු ලබන ගොවීන් බදුල්ල දිස්ත්‍රික්කයෙන් හමු වේ. බදුල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන හරිතාගාර අපනයන පොදු සමාගම ප්‍රදේශයේ හරිතාගාර නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන සියල්ලම පාහේ මිලදී ගනු ලබන අතර ඉන් ගුණාත්මයෙන් ඉහළ කොටස තෝරා

අපනයනය සඳහා සපයනු ලැබේ. එමගින් දේශීය වෙළඳපොළ මිලට සාපේක්ෂව ඔවුන් වෙත ගෙවන ඉහළ මිල ගණන් සංඛ්‍යාත්මකව වෙසෙසියාත්මක වේ.

නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ හරිතාගාර එළවළු මෙන්ම විවෘත ක්ෂේත්‍රවල වගා කරන එළවළු අපනයනය සඳහා සපයනු ලබන බව අනාවරණය වේ. අපනයනය වෙනුවෙන්ම වගා කරන රෝස්මරි හා ඔරිගැනෝ වැනි බෝග ද, බෲකෝලි, සුකිනි හා තක්කාලි වැනි හරිතාගාර බෝගද, විවෘත භූමියේ වගා කරන ලීක්ස්, නෝකෝල්, බෝංචි යනාදී බෝග ද විශාල වශයෙන් අපනයනය සඳහා සපයා ඇත.

මාතලේ දිස්ත්‍රික්කය තුළින් හමුවන බහුතරයක් ගොවීන් විවෘත භූමිවල වගා කරන පතෝල, කරවිල, මෑකරල්, වැටකොළු වැනි පහත රට එළවළු වර්ග බහුල වශයෙන් අපනයනය සඳහා සපයා ඇත. මෙම ගොවීන් සිය නිෂ්පාදනවලින් අපනයනය සඳහා සපයනු ලබන්නේ 22%ක් පමණ ප්‍රමාණයකි. එම ගොවීන් එළවළු ගොවිතැනේ නිරතවීමේ මුඛ්‍ය පරමාර්ථය දේශීය වෙළඳපොළ වෙත එළවළු සැපයීමයි.

සමස්ත නියැදිය තුළ බහුතරයක් ගොවීන් ආරක්ෂිත ගෘහ නොමැති (63%), දේශීය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් එළවළු වගා කරන (77%) ගොවීන්ය. ඒ අනුව අපනයනය සඳහා එළවළු සපයන ගොවීන් බහුතරය මින් පෙර ද සඳහන් කළ අභියෝග මධ්‍යයේ සම්ප්‍රදායික ලෙස වගාවේ නිතර වන්නන් යටතට වැටේ. අපනයන ප්‍රමිතීන්ට අනුකූල, එළවළු අවශ්‍ය ප්‍රමාණවලින් හා අවශ්‍ය අවස්ථාවන්හි දී වගා කර සැපයීමට බහුතරයක් ගොවීන් සැලසුම් සහගත ලෙස එළවළු වගාවේ නිරත වීමේ වගවීමෙන් බැහැර වී ඇත. එවැනි වගකීමක් ඔවුන් වෙත පැවරී නැත.

ඊට හේතුව අපනයනය සඳහා එළවළු සැපයීම බොහෝවිට ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයාගේ අවශ්‍යතාවක් සැපිරීම පමණක් වන බැවිනි. ඉන් ගොවියාට අත්වෙන ප්‍රතිලාභය අපනයනය සඳහා සපයන කොටසට ලැබෙන ඉහළ මිලට පමණක් සීමා නොවේ. ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරිකයා හා පවත්වන සබඳතා ශක්තිමත් වීම තුළින් එම ගොවීහු අමතර ප්‍රතිලාභ රැසක් අත්කර ගනිති. මෙම තත්ත්වය මාතලේ දිස්ත්‍රික්කය තුළින් මනාව පිළිබිඹු වේ.

ගොවීන්ගේ නිෂ්පාදනවල හොඳම කොටස අපනයනය සඳහා සැපයීමෙන් ඉතිරි නිෂ්පාදන සඳහා දේශීය වෙළඳපොළෙන් අඩු මිලක් නියමවීම පිළිබඳ ගොවීහු මැසිවිලි නඟති. එනමුත් දේශීය වෙළඳපොළ පවතින මිල ගණන්වලට අලෙවි කිරීමට සාපේක්ෂව අපනයනය සඳහා යම් කොටසක් සපයා ඉතිරිය දේශීය වෙළඳපොළට සැපයීම තුළින් සියලුම ගොවීන් වැඩි ආදායමක්

උපයා ගෙන ඇති බව අධ්‍යයනයෙන් අනාවරණය වේ. එසේ සංඛ්‍යාත්මක වශයෙන් වෙසෙසියාත්මක මට්ටමේ ඉහළ ආදායම් උපයා ගත් ගොවීන් අතරට මාතලේ දිස්ත්‍රික්කයේ සියලුම ගොවීන් අයත් වේ. බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්කවල හරිතාගාර සහිතව හෝ රහිතව අපනයන දායකත්වය 65% ඉක්ම වූ සියලුම ගොවීන් ද සංඛ්‍යාත්මක වශයෙන් වෙසෙසියාත්මක වූ ඉහළ ආදායම් උපයා ඇත. මේ අනුව එළවළු ගොවීන්ගේ නිෂ්පාදන අපනයන වෙළඳපොළ වෙත සැපයීම තුළින් ඔවුන්ගේ ජීවන මට්ටම නගා සිටුවීමට ඉඩ ප්‍රස්ථා පවතී.

ණය ලබා ගැනීම හා සංවිධානගතවීම තුළින් තම ව්‍යාපාර තවදුරටත් ප්‍රවර්ධනය කර ගැනීමට ප්‍රයත්න දරා තිබීම එළවළු අපනයන කර්මාන්තයට යොමු වූ ගොවීන් අතර පැවතුන ධනාත්මක ප්‍රවණතාවකි. තවද අපනයනය සඳහා එළවළු සැපයීමේ ව්‍යාපාරයන්හි දිශානතිය කෙරෙහි අවධානය යොමු කළ විට ගොවීන් අතරින් අඩකට වඩා වැඩි සංඛ්‍යාවකගේ (53%) සිය ව්‍යාපාරවල යම් ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

ගොවීන් අනුගමනය කළ වගා ක්‍රමය හෝ අපනයන දායකත්වය අනුව එළවළු සැපයීමේ ප්‍රගතිය සමඟ වෙසෙසියාත්මක සබඳතා නොපෙන්වයි. එනමුත් අපනයනකරු හා ඍජුව සබඳතා පවත්වන ගොවීන් සැපයුම්කරුවකු හරහා අපනයනකරු වෙත එළවළු සපයන ගොවීන්ට වඩා සිය ව්‍යාපාරවල ප්‍රගතියක් අත් කර ගෙන ඇති බව අධ්‍යයනයෙන් තහවුරු වේ. මෙම කර්මාන්තයේ නියැළී සිටින ගොවීන් මුහුණ පාන පොදු ගැටලු කීපයකි. බොහෝ ගොවීන් වර්තමානයේ ඔවුන් අපනයනය සඳහා සපයන එළවළු ප්‍රමාණය පිළිබඳව තෘප්තිමත් නැත. දැනට ඔවුන් වෙත ලැබෙන ඇණවුම් ප්‍රමාණවත් නොවීම ඊට ප්‍රධානතම හේතුව වේ. එබැවින් අපනයන ප්‍රමිතියෙන් යුත් එළවළු පවා ඊට යොමු කළ නොහැකි වී ඇත.

ගොවීන්ගේ අස්වනු සියල්ල අපනයන ප්‍රමිතියෙන් යුක්ත නොවීම දෙවන ප්‍රධාන හේතුවයි. මිල උච්චාවචනය වීම මෙන්ම මූල්‍ය ගනුදෙනුවල අක්‍රමිකතා ඉහත සඳහන් පරිදි ව්‍යාපාරවල පසුබැමටත් ගොවීන් අතෘප්තිමත් වීමට හේතුවී ඇත. ඇණවුම් ආශ්‍රිත අවිනිශ්චිතතාව පිළිබඳ ගොවි ජනතාවට ප්‍රබල ගැටලුවක් නොවන බව දත්තවලින් පැහැදිලි වේ. එනමුත් අපනයන වෙළඳපොළ අනුව ඇණවුම් විචලනය වන බවත් සංචාරක ව්‍යාපාරය පාදක කර ගත් අපනයන ගමනාන්තවලින් වසරේ සංචාරක සමය තුළ එනම් නොවැම්බර්, දෙසැම්බර් හා ජනවාරි මාසවලදී වැඩි ඉල්ලුමක් පවතින බව තහවුරු වේ. ඒ බොහෝදුරට උඩරට හරිතාගාර එළවළු සඳහා වේ. විදේශගත ශ්‍රී ලාංකීය ප්‍රජාවගෙන් පහතරට එළවළු සඳහා අඛණ්ඩ ඉල්ලුමක් පවතින බවද

පෙනේ. මේ කරුණුවල බලපෑම හේතුවෙන් අපනයනය සඳහා එළවළු සපයමින් සිටි ගොවීන් අතරින් සැලකිය යුතු ප්‍රතිශතයකගේ (33%) ව්‍යාපාර පසුබෑමකට ලක්වී තිබුණි.

ඒ හැරුණු කොට ගුණාත්මක බීජ හිඟය, භාවිතා කරන පොහොර නිසි ප්‍රමිතියෙන් යුක්ත නොවීම, එළවළු ව්‍යාපාරිකයන් හා සබඳතාවලට හානි වීම, එළවළු මිල උච්චාවචනය වීම, මූල්‍ය ගනුදෙනුවල අක්‍රමිකතා, එළවළු තේරීමට ලක්වීම, ණය ලබා ගැනීමේ අපහසුතා එළවළු අපනයන කර්මාන්තයේ නියැළෙන ගොවීන් අත්විඳින අනෙකුත් දුෂ්කරතාවන් අතර වේ.

අපනයනය සඳහා එළවළු වගා කරන ගොවීන් අතරින් අපනයනකරු හා සෘජුව සබඳතා පවත්වන්නේ ඉතා සුළු සංඛ්‍යාවක් (9%) පමණි. අති බහුතරයක් ගොවීහු (91%) සැපයුම්කරුවෙකු මගින් අපනයනකරු වෙත සිය නිෂ්පාදන ලබා දෙති. ඒ අනුව එළවළු අපනයන කර්මාන්තයේ දී එළවළු සැපයුම්කරුවෝ අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කරති.

අපනයනකරුවන් ලබා දෙන ඇණවුම්වලට අනුව ගොවීන්ගෙන් එළවළු එකතු කර දීම හා එසේ එකතු කරන එළවළුවල ප්‍රමිතිය පාලනය කිරීම සැපයුම්කරුවන්ගේ ප්‍රධාන කාර්යභාරය වේ. ඒ හැරුණු කොට අපනයන වෙළඳපළ සඳහා වගා කටයුතුවල නිරතවීමට ගොවීන් යොමු කිරීම හා දැනුවත් කිරීම, අපනයන ප්‍රමිතීන් පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම, මූල්‍ය ගනුදෙනුවලදී මැදිහත්කරුවෙකු සේ ක්‍රියා කිරීම ඔහු අතින් ඉටු වන අනෙකුත් කාර්යයන් වේ. එබැවින් ගුණාත්මක එළවළුවලින් ඇණවුම් සැපිරීමේ ලා සැපයුම්කරුවන්ගේ කාර්යභාරයට විශේෂ තැනක් හිමි වේ.

අධ්‍යයනයේ දී හමුවූ සැපයුම්කරුවන් 26 දෙනා අතරින් බහුතරයක් (69%) වගා කටයුතුවල ද නියැළෙති. එබැවින් එළවළු සැපයුම තුළ සිදුවන කාලීන විචලතා මෙන්ම ඊට අනුරූපව මිල උච්චාවචනය වීම පිළිබඳව ඔවුහු මනා දැනුමකින් යුත් පුද්ගලයෝ වෙති. අපනයනකරුවන් සමඟ සබඳතා පැවැත්වීම තුළින් ඔවුන් එළවළු ඉල්ලුම පිළිබඳව යම් අවබෝධයකින් ද යුක්ත වෙති. එළවළු ඉල්ලුම හා සැපයුම තුළ සිදුවන විචලතා වඩා තුලනාත්මක ලෙස හැසිරවීමේ හැකියාව මොවුන් සතුය. එබැවින් එළවළු සැපයුම් අගයදාම තුළ සැපයුම්කරුවන්ගේ මැදිහත්වීම ඉතා වැදගත් වේ.

සැපයුම්කරුවන් තම ඇණවුම් සම්පූර්ණ කිරීම පහසු කර ගැනීම සඳහා අවශ්‍ය එළවළු සපයා ගැනීමට නිත්‍ය වශයෙන් සබඳතා පවත්වන ගොවි ජාලයක් ඇත. එම නිත්‍ය නිෂ්පාදකයන්ගේ ප්‍රමාණවත් තරම් එළවළු සපයා ගත නොහැකි විටදී නිත්‍ය සබඳතා නොමැති ගොවීන්ගෙන් ද

එළවළු සපයා ගනු ලැබේ. බහුතරයක් සැපයුම්කරුවන් මෙම ප්‍රභවයන් දෙකෙන්ම අවශ්‍ය එළවළු ලබා ගෙන ඇණවුම් සම්පූර්ණ කරන බව සමීක්ෂණයෙන් අනාවරණ වේ. ඒ අනුව සැපයුම්කරුවෝ (53%) ඇණවුම් සම්පූර්ණ කිරීමේ දී නිත්‍ය නොවන නිෂ්පාදකයන් ගෙන් ද එළවළු සපයා ගැනීමට ක්‍රියා කරති. සමහර විට තොග වෙළඳපොළෙන් ද එළවළු ලබා ගනිති. මේ මගින් ඇණවුම්වල ප්‍රමාණාත්මක හා කාලීන සැපයුම පිළිබඳ අවශ්‍යතා සම්පූර්ණ වුවද ගුණාත්මය යම්තාක් දුරට ප්‍රශ්නාර්ථයකි. එක් දිනක් වැනි සීමිත කාලසීමාවක් තුළ ඇණවුම් සම්පූර්ණ කිරීමට සිදුවී ඇති බැවින් කෙසේ හෝ ඇණවුම් සම්පූර්ණ කිරීමට සැපයුම්කරුවෝ පියවර ගනිති. එබැවින් දිවා රාත්‍රී නොතකා ක්‍රියාත්මක විය යුතු මෙම කාර්යයේ නියැළෙන බහුතරය (80%) එය සිය ප්‍රධාන රැකියාව ලෙස තෝරා ගෙන ඇත. අපනයනය සඳහා මිලදී ගනු ලබන එළවළු ප්‍රමාණයන් විශාල ලෙස විචලනය වේ. අතිරික්ත එළවළු සුපිරි වෙළඳපොළට හෝ දේශීය වෙළඳපොළට සපයනු ලැබේ. මිලදී ගනු ලබන ප්‍රමාණයෙන් 75%කට වැඩි ප්‍රමාණයක් බොහෝ සැපයුම්කරුවෝ (18-68%) අපනයනය සඳහා සපයති.

බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්කවල දී ගැණුම් මිල හා අපනයනය සඳහා සපයන මිල වෙනස කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු.20/- සිට රු.200/-ක් වැනි ඉහළ අගයක් ගෙන ඇති බව වාර්තා වේ. මාතලේ දිස්ත්‍රික්කයේ පහත රට එළවළු සඳහා මිල වෙනස කි.ග්‍රෑ. එකක් සඳහා රු.5/- සිට රු.40/- දක්වා වේ.

මේ අනුව එළවළු ගැණුම් මිල හා අපනයනය සඳහා සපයන මිල එළවළු වර්ගය සුලභතාවය, මිලදී ගනු ලබන අවස්ථාව සැපයුම්කරු හා නිෂ්පාදකයා අනුව වෙනස් වේ. සුපිරි වෙළඳපොළට හෝ දේශීය වෙළඳපළට එළවළු සැපයීමේ දී බොහෝ විට එම මිල ගණන් අපනයන මිලට වඩා අඩු වන අතර ගැණුම් මිලට වඩා අඩු වැඩි හෝ සමාන වේ. ගැණුම් මිලට වඩා අඩු මිලකට සපයන්නේ ඉතා කලාතුරකින් මෙන්ම අඩු එළවළු ප්‍රමාණයකි. එබැවින් කිසිදු අවස්ථාවක දී සැපයුම්රුවෝ පාඩු නොලබති.

කටුනායක ගුවන් තොටුපල කේන්ද්‍ර කර ගනිමින් සහ ගම්පහ ප්‍රදේශවල ක්‍රියාත්මක වන අපනයනකරුවන් හා ග්‍රාමීය ගොවිජනතාව අතර සබඳතාව තහවුරු කරනු ලබන්නේ සැපයුම්කරුවන් විසිනි. ගොවීන් අතරින් බහුතරය (91%) සැපයුම්කරුවන් හරහා සිය නිෂ්පාදන අපනයනය සඳහා සපයති. තවත් සුළු සංඛ්‍යාවක් ගොවීහු (9%) සෘජුවම අපනයනකරුවන් හා ගනුදෙනු කරති. ගොවීන් අනුගමනය කරන වගා ක්‍රමය, අපනයන දායකත්වය හා එළවළු සපයන ආකාරය අනුව හඳුනා ගනු ලැබූ එළවළු අපනයන අගයදාම හය අතරින් වඩාත් සාර්ථකම

අගයදාමය ලෙස හඳුනා ගත හැක්කේ ආරක්ෂිත ගෘහ තුළ වගා කරන අපනයන දායකත්වය 65% කට වැඩි සැපයුම්කරුවෙකු හරහා එළවළු අපනයනය සඳහා සපයන ගොවීන් නියෝජනය කරන අගයදාමය වේ.

එම අගයදාමයේ ගොවීන්ගේ ආදායම වර්ධනය වීම, අඛණ්ඩව ඇණවුම් ලැබීම, වැඩි එළවළු ප්‍රමාණයක් අපනයනය සඳහා සැපයීම හා ව්‍යාපාර ප්‍රගතිය යන කරුණු අතින් අනෙකුත් අගයදාම නියෝජනය කරන ගොවීන්ට වඩා වෙසෙසියාත්මක ප්‍රගතියක් පෙන්නුම් කරයි. වැඩි ගොවීන් සංඛ්‍යාවක් සහිත අගයදාමයන් නියෝජනය කරන ගොවීන්ගේ ප්‍රමුඛ අභිප්‍රාය දේශීය වෙළඳපොළ වෙත එළවළු සැපයීම වන බැවින් ඔවුහු ගුණාත්මක ලෙස එළවළු නිපදවීම සඳහා විශේෂ වගා ක්‍රම අනුගමනය නොකරති. ප්‍රමාණාත්මක හා කාලීන සැපයුම සහතික කිරිම සඳහා ඔවුහු සැලසුම් සහගත ලෙස නිෂ්පාදන ක්‍රියාවලියේ නොයෙදෙති. එවැනි ගොවි සමූහයකින් ගුණාත්මක, ප්‍රමාණාත්මක හා කාලීන සැපයුම යන අවශ්‍යතා සපුරා ගැනීම අපහසු කාර්යයකි.

සැපයුම්කරුවන් අතරින් 50%ක්ම මාසිකව එළවළු මිලදී ගැනීම වෙනුවෙන් රු.100,000/-කට වඩා ආයෝජනය කරති. සාතිශය බහුතරයක් සැපයුම්කරුවෝ මාසිකව රු.50,000/-ක් ඉක්මවූ වටිනාකමකින් යුත් එළවළු අපනයනය සඳහා සපයති. සියලුම සැපයුම්කරුවෝ සුළු හෝ ලාභයක් උපයා ගෙන ඇති අතර ඔවුන් අතරින් 28%ක් මසක දී රු.50,000/- ඉක්මවා ලාභයක් උපයා ගෙන ඇත. රු.10,000/- සිට රු.50,000/- දක්වා ලාභයක් උපයා ගන්නා සැපයුම්කරුවන්ගේ ප්‍රතිශතය 34%කි. ව්‍යවසායන්ගේ විශාලත්වය මත උපයා ඇති ලාභාංශය වෙනස් වී ඇති අතර උපරිම වශයෙන් මසකට රු.360,000/- ඉපයීමට ඔවුහු සමත් වී සිටිති.

අධ්‍යයනයෙන් තහවුරු වන පරිදි සැපයුම්කරුවන්ගේ ව්‍යාපාරවල ප්‍රගතිය/පසුබෑම ඔවුන් ක්‍රියාත්මක වන ප්‍රදේශය, පළපුරුද්ද, අධ්‍යාපන මට්ටම, වයස හෝ ආයෝජනවල විශාලත්වය යනාදී සමාජ-ආර්ථික සාධක මත වෙසෙසියාත්මක සබඳතා පෙන්නුම් නොකරයි. එබැවින් සැපයුම්කරුවන්ගේ ව්‍යාපාරවල ප්‍රගතිය හෝ පසුබෑම ඔවුන්ගේ පාලනයෙන් බැහැර වූ සාධක මත තීරණය වී ඇති බව අධ්‍යයනයෙන් තහවුරු වේ.

පොදුවේ ගත් කළ එළවළු සැපයුම්කරුවෝ දුෂ්කරතා ගණනාවක් මධ්‍යයේ සිය ව්‍යාපාර පවත්වා ගෙන යති. ඇණවුම් නිසි කලට සම්පූර්ණ කළ හැකි වන පරිදි එළවළු සපයා ගත නොහැකිවීම ඔවුන් මුහුණ පාන ප්‍රධාන ගැටලුව වේ. ඇණවුම සම්පූර්ණ කිරීම සඳහා ලැබෙන කාලසීමාව අඩුවීම, සිය ගොවි ජාලයන් සතුව අවශ්‍ය එළවළු නොතිබීමෙන් නිත්‍ය නොවන

නිෂ්පාදකයන්ගෙන් වැඩි මිලට හා වැඩි ප්‍රවාහන වියදමක් දරා එළවළු ලබා ගැනීමට සිදුවීම එම ගැටලු අතර වේ. අපනයන වෙළඳපොළ තුළ ඉල්ලුම සීමාවීම, ගුවන් ගමන් අවලංගු වීම හා අපනයනකරු වෙනස් මාර්ග ඔස්සේ අඩු මිලට එළවළු සපයා ගැනීම යන අවස්ථාවල දී සැපයුම්කරුට ලැබෙන ඇණවුම් සීමා වේ. සමහරවිට මුළුමණින්ම අවලංගු වේ. අපනයනකරුවන් සැපයුම්කරුවන් රාශියක් සමඟ ගනුදෙනු කරන බැවින් එක් එක් සැපයුම්කරු එළවළු ලබා දීමට එකඟ වන මිල ගණන් අතරින් අඩුම මිල ගණන් ලබා දෙන සැපයුම්කරු වෙත ඇණවුම ලබා දේ. ඒ අනුව අපනයනකරුවන් හා ස්ථිර ගිවිසුම් වෙත එළඹීම සැපයුම්කරුන්ට අවශ්‍ය වුවද අපනයනකරුවන්ට එකඟතා නොමැතිව ක්‍රියාත්මකවීම වඩාත් වාසිදායක බැවින් එය ප්‍රායෝගික විකල්පයක් නොවේ. මේ අනුව ගොවීන් සැපයුම්කරුවන් හා අපනයනකරුවන් අතර පවතින දියාරු සබඳතා හේතුවෙන් එළවළු අපනයන කර්මාන්තය සංවිධිත කර්මාන්තයක් ලෙස හැඳින්විය නොහැක. තවද, ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාපාරිකයන්ගේ මැදිහත්වීම අපනයනකරුවන්ට එළවළු සපයා ගැනීම ආශ්‍රිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා අවම කර ගැනීමට උපකාරි වී ඇත.

එළවළු තේරීම නිෂ්පාදකයාට සතුට දනවන කරුණක් නොවේ. මේ කරුණු හේතුවෙන් ගොවි සබඳතා පලුදුවීම සැපයුම්කරු මුහුණ පාන දෙවන ගැටලුව වේ. පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය, ගබඩා හා ශීතාගාර සහිත ප්‍රවාහන පහසුකම් නොමැතිවීම/ප්‍රමාණත් නොවීම, ණය ලබා ගැනීමේ ගැටලු ද එම දුෂ්කරතා අතර වේ. සැපයුම්කරුවන් සාමුහිකව ක්‍රියා නොකිරීම තුළින් මේ ගැටලු යම්තාක් දුරට හෝ විසඳා ගැනීමේ හා මිල කේවල් කිරීමේ ඉඩ ප්‍රස්ථා ඔවුන්ට අහිමි වී ඇත.

## 6.3 නිර්දේශ

1. අධ්‍යයන සොයා ගැනීම්වලට අනුව එළවළු අපනයන ක්ෂේත්‍රය තුළ උද්ගතවී ඇති ගුණාත්මක, ප්‍රමාණාත්මක හා කාලීන සැපයුම ආශ්‍රිත ගැටලුවල මූලාරම්භය අපනයන එළවළු සඳහා පවතින ඇණවුම් පිළිබඳ අවිනිශ්චිතතාව වේ. අපනයන වෙළඳපොළ තුළ පවතින සීමිත වෙළඳපොළ අවස්ථාවන්හි සිදුවන විචලතාවන් මගින් මෙම අවිනිශ්චිතතාවන් ජනිත කර ඇත. තවද පවතින සීමිත අවස්ථාවන් අපනයනකරුවන් විසින් අප්‍රකට ලෙස හසුරුවනු ලැබේ. එබැවින් එළවළු අපනයනය ඉහළ නැංවීම සඳහා තවදුරටත් අපනයන වෙළෙඳපොළ පුළුල් වීම/කිරීම අත්‍යවශ්‍ය වේ. නවකයන් වෙත ඉඩ ප්‍රස්ථා ලබා දීම සඳහා අපනයන වෙළෙඳපොළ අවස්ථා ප්‍රවර්ධනය කිරීම අපනයන සංවර්ධන මණ්ඩලයේ මූලික කාර්යයකි. ඒ සඳහා දැනට

පවත්නා රාජ්‍ය යාන්ත්‍රණය එයයි. නමුත් එම මැදිහත්වීම අපනයනය සඳහා එළවළු නිපදවීමට හා සැපයීමට සැදී පැහැදී සිටින පාර්ශ්වයන්ට ප්‍රමාණවත් නැත.

(අ) අපනයන කර්මාන්තය වීධිමත් කිරිම සඳහා රාජ්‍ය මැදිහත්වීමකින් අපනයන වෙළඳපොළ පුළුල් කිරිම සඳහා ක්‍රමවත් ක්‍රමවේදයක් සකස් කර වර්තමානයේ අප රටට ලැබෙන ඇණවුම් ප්‍රමාණ ඉහළ නැංවීම සඳහා කටයුතු කළ යුතුය. දේශීය මෙන්ම විදේශීය වෙළඳ ප්‍රදර්ශන හරහා දේශීය එළවළු වර්ග හඳුන්වාදීමේ (Vegetable Promotion) වැඩසටහන් මෙන්ම ඒවායේ අගය එකතු කළ නිෂ්පාදන (විවිධ ආකාරයේ එළවළු ව්‍යංජන) මඟින් දේශීය එළවළු සඳහා පවතින අපනයන වෙළඳපොළ පුළුල් කළ යුතු ය. අපනයනය සංවර්ධන මණ්ඩලය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එළවළු සැපයුම්කරුවන් හා නිෂ්පාදනයන් අතර සබඳතා තවදුරටත් ශක්තිමත් කර ඉහත සඳහන් පරිදි පුළුල් කාරන ලද අපනයන වෙළෙඳපොළ ඉඩ ප්‍රස්ථාවලින් ඔවුන්ට ඉහළ ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථා ලබා සලසා දිය යුතු ය. අදාළ ආයතන මෙම කාර්යයට මුල පිරිය යුතු අතර ගොවීන් හෝ සැපයුම්කරුවන් මෙම ආයතන වෙත ප්‍රවේශ වීම අපේක්ෂා කළ නොහැකි ය.

2. ආරක්ෂිත ගෘහ තුළ එළවළු නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම එළවළු අපනයන අගයදාමයන් ආශ්‍රිත ගුණාත්මක, ප්‍රමාණාත්මක හා කාලීන සැපයුම සහතික කිරීම සඳහා උචිත විකල්පයක් වේ. එබැවින් ආරක්ෂිත ගෘහතුළ එළවළු නිෂ්පාදනය කරන්නන් වර්තමානයේ මුහුණ දෙන විවිධ ගැටලු විසඳීමටත් ඔවුන්ගේ නිෂ්පාදන අපනයනය ඉලක්ක කර ගත් කර්මාන්ත බවට පරිවර්තනය කිරීමටත් පියවර ගත යුතුය. එමඟින් අපනයන ප්‍රමිතීන් අනුගමනය කිරීමට ඔවුන් පොළඹවා ගත හැකි වේ. එමගින් බිහිවන සාර්ථක කර්මාන්තකරුවන් ආදර්ශයට ගනිමින් නව කර්මාන්තකරුවන් මෙම ක්ෂේත්‍රයට ආකර්ෂණය කර ගත හැක. ඉන් අනතුරුව අපනයනයේ නියැළෙන්නන් වෙත වඩාත් නිශ්චිත ඇණවුම් ලැබීම තුළ ඒවා නිෂ්පාදකයන් හා සැපයුම්කරුවන් වෙත ඉදිරිපත් කිරීම තුළින් අවධානමකින් තොරව අවශ්‍ය ප්‍රමිතියට අනුව නිෂ්පාදනයේ නියැළීමට නිෂ්පාදකයන්ට අවස්ථාව ලැබේ. එනමුත් බොහෝ ගොවීන්ට ආරක්ෂිත ගෘහ ගොඩනැඟීම සඳහා මූලික ප්‍රාග්ධනය නොමැත. එමෙන් ම ආරක්ෂිත ගෘහ තුළ ක්ෂුද්‍ර ජල සම්පාදනය වැනි තාක්ෂණික ක්‍රම භාවිතය සඳහා ප්‍රාග්ධනය සකසා ගැනීම අපහසු ය. ආරක්ෂිත ගෘහවල පවතින විවිධ අඩුපාඩු හා ගොවීන් සතු දැනුම ප්‍රමාණවත් නොවීමෙන් උවදුරු ඇතිවීමත්, ඒවා පාලනය සඳහා අධික ලෙස රසායන ද්‍රව්‍ය මත යැපීමත් දක්නට ලැබේ. ඉහත ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දැනට කරනු ලබන මැදිහත්වීම් ප්‍රමාණවත් නැත.

(අ) ආරක්ෂිත ගෘහතුළ බෝග වගාව ප්‍රචලිත කිරීම සඳහා ආරක්ෂිත ගෘහ ගොඩනැගීමට අවශ්‍ය සහනාධාර ලබාදීමට අමතරව පළිබෝධ නාශක භාවිතය අවම කිරීම, දියුණු

තාක්ෂණය භාවිතය හා සුවිශේෂී අපනයන වෙළෙඳපොළ පහසුකම් සපයා ගැනීම සම්බන්ධයෙන් ගොවීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින් නිශ්චිත ඇණවුම් සහිතව ඉහත කී යෙදවුම් හා සේවාවන් සමූහය ලබා දෙමින් රාජ්‍ය වැඩසටහන් හරහා ආරක්ෂිත ගෘහ තුළ එළවළු නිෂ්පාදනය කිරීම ව්‍යාප්ත කිරීමට පියවර ගැනීම තුළින් අධ්‍යයනයේ දී හඳුනා ගනු ලැබූ ප්‍රධාන ගැටලු විසඳීමට පියවර ගත යුතුය.

3. ගුණාත්මක, ප්‍රමාණාත්මක හා කාලීන සැපයුම සහතික කරමින් වෙළඳපොළ ඉලක්ක ගත අඛණ්ඩ නිෂ්පාදන-සැපයුම්-අපනයන අගයදාමයන් ඔස්සේ ක්‍රියාත්මක වීම සඳහා;

   (අ) එළවළු නිෂ්පාදකයන් වෙතින් උසස් ප්‍රමිතියෙන් යුතු නිෂ්පාදන ලබා ගැනීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වඩා වැඩි අවධානයක් යොමු කළ යුතුය. මේ සඳහා නිරතුරු කෘෂි ව්‍යාප්ති නිලධාරීන් ගොවීන් හා සම්බන්ධව නව තාක්ෂණ උපදෙස් ලබාදීම අවශ්‍ය වේ. විශේෂයෙන් හරිතාගාර බෝග වගාවේ දී කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රම භාවිතය හා හරිතාගාර ගොඩනැඟීම හා නඩත්තුව, පළිබෝධනාශක භාවිතය අවම කරමින් ගුණාත්මක එළවළු නිපදවීම, අපනයනය සඳහා එළවළු තේරීමේ ප්‍රමිතීන් යන කරුණු ආශ්‍රිතව පුහුණු වැඩසටහන් වෙත ගොවීන් යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම කාර්යයන් ඉටු කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වගකීම වේ. නමුත් වර්තමානයේ ඒ සඳහා මැදිහත් වන ප්‍රමාණයට ක්ෂේත්‍ර මට්ටමේ යහපත් ප්‍රතිඵල බිහිවනු දක්නට නොමැති බැවින් එම වැඩසටහන්වල ඵලදායකත්වය ඉහළ නැංවීම සඳහා පියවර ගත යුතු ය.

   (ආ) උසස් ප්‍රමිතියෙන් යුතු හරිතාගාර බෝග බීජ සපයා ගැනීම හරිතාගාර ගොවීන්ට සැලකිය යුතු මට්ටමින් බලපා ඇත. එබැවින් එම ගැටලු විසඳීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය හා බීජ සහතික කිරීමේ සේවාවේ අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. "ගොවීන්ට අවශ්‍ය එළවළු බීජ සියල්ලම නිෂ්පාදනය කළ යුතුය යන්න ඉන් අදහස් නොවේ. අවශ්‍ය වන්නේ බීජවල ගුණාත්මය තහවුරු කිරීම සඳහා බීජ සහතික කිරීමේ සේවාව මගින් විශේෂ අවධානය යොමු කර එහි ක්‍රියාකාරීත්වය තවදුරටත් තීව්‍ර කිරීමයි.

4. එළවළු අපනයන අගයදාමය තුළ නිෂ්පාදකයන් හා සැපයුම්කරුවන් මුහුණපාන ඇණවුම් පිළිබඳ අවිනිශ්චිතතා අවම කිරීම සඳහා එළවළු එකතු කර අපනයනකරුවන් වෙත සපයන පුද්ගලයන් හට ශීතාගාර පහසුකම් සලසා ගැනීම සඳහා ණය සහන ලබා දී එළවළු ගබඩා කර තබා අවශ්‍ය වේලාවට ඇණවුම් ඉදිරිපත් කිරීමට මං සැලසිය යුතු ය.

# ආශ්‍රිත ග්‍රන්ථ


'එළවළු වවන්නෝ දිනන්නේ නැත", අනුසාර මාහිංගොඩ, දිනමිණ, 2004 දෙසැම්බර් 6 (ඉරිදා), පිටුව 03.

" එතෙර යන අපේ එළවළු සහ පළතුරු",ප්‍රමීතා රන්දලී පබසරා සහ 'සිරිසේන අමරවීර, දිනමිණ කප්රුක, 2006 සැප්තැම්බර් 14.

"කෘෂිකාර්මික සංවර්ධනය සහ අලෙවිකරණය, මංගල ද සොයිසා, දිනමිණ අස්වැන්න, 2005 මැයි 12, පිටුව 18.

"මහ වැස්සෙන් එළවළු ගොවීන් අමාරුවේ", ප්‍රමිත කුමාර ද සිල්වා, දිනමිණ අස්වැන්න, 2007 ජනවාරි 18, පිටුව 17.

"ශ්‍රමයට නිසි තැන නොලබන ගොවිතැන කුමට ද", කුමුදුනී ප්‍රියංගා කුරුගල ගමගේ, දිනමිණ අස්වැන්න, පිටුව 10.

ගුණසේන එච්.පී.ඇම්., ක්ෂේත්‍ර බෝග නිෂ්පාදන, (1994), වෙළුම 01, සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

Esham M and Usami K., (2006), "Procurement Behavior of the Fruit and Vegetable Industry

Esham M, Usami K, Kobayashi H and Matsumura I., (2006), "An Economic study of Contact Farming in the Fruit and Vegetable Industry In Sri Lanka.

External Trade Statistics., (2012), Export, Department of Custom, Colombo.

Gunadasa W.D.H., (2002), Breef Export on the Sri Lanka Fresh fruit and vegtetables and Agrobase Food Processinf Sectors, National Agribusiness Council, Colombo 3.

in Sri Lanka, Vol. 2, No. 3.

Janik J., (1963), "Horticultural science", W.H. Freeman and Company, San Francisco.

Pandey R. P., (2002), "The Potato", Kalyani Publishers, New Delhi.

Perera A.M.S, Rambodagedara M and Wijesinghe R., "Fruit and Vegetable Export Performance:Export Growth, Instability and Diversification, Hector Kobbakaduwa Agrarian Research and Training institute.

Perera m, Kodithuwakku S.S, Weerahewa J., (2004), Analysis of Vegetable Supply Chanes of Supermarkets in Sri Lanka, Vol. 06, No. 01, Faculty of agriculture, University of Peradeniya.

"Potatoes for the Developing World", (1984), International Potato Center.

Senewirathna S.T and Appadurai R.R., (1996), "Field Crops of Ceylon", Lake House Investments Limited, Lake House, Colombo.

"Summary of Export Performance", Sri Lanka Exporters, October-December 2013.

Speedy A, "Developing World Agriculture", Grosvernor Press International, Holford News Cruikshank St, London.

ඇමුණුම : 01

## ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදනය (මෙ.ටො)

| වර්ෂය | බෝංචි | කැරට් | ලීක්ස් | බීට්රූට් | නෝකෝල් | රාබු | ගෝවා | තක්කාලි | බණ්ඩක්කා | වම්බටු | වට්ටක්කා | පිපිඤ්ඤා | කරවිල | පතෝල | අළුකෙසෙල් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2000 | 34646 | 25942 | 21960 | 17242 | 14989 | 26039 | 53419 | 43946 | 40723 | 76522 | 62309 | 20127 | 20796 | 19121 | 84221 | 562011 |
| 2001 | 30891 | 28424 | 24189 | 17736 | 16321 | 25327 | 53935 | 40378 | 35905 | 67409 | 58529 | 18451 | 18322 | 17376 | 71434 | 524627 |
| 2002 | 32648 | 28160 | 23152 | 16500 | 14240 | 22426 | 49339 | 41238 | 37665 | 70634 | 59578 | 20994 | 20878 | 19388 | 68317 | 525157 |
| 2003 | 31687 | 27210 | 22420 | 15574 | 14240 | 20079 | 52222 | 44974 | 36786 | 74469 | 63830 | 23389 | 20119 | 18184 | 72937 | 538120 |
| 2004 | 40839 | 34761 | 29719 | 20461 | 13707 | 27268 | 58000 | 60054 | 35502 | 81527 | 67964 | 22592 | 26030 | 19940 | 73665 | 612029 |
| 2005 | 40790 | 36930 | 28451 | 22371 | 15315 | 26759 | 63902 | 56894 | 41172 | 83640 | 79581 | 26829 | 25501 | 20114 | 69812 | 638061 |
| 2006 | 40553 | 36250 | 24807 | 23752 | 15181 | 27897 | 59381 | 61043 | 40634 | 88375 | 69893 | 24672 | 27101 | 21386 | 64996 | 625921 |
| 2007 | 41328 | 38106 | 29105 | 27348 | 14954 | 31732 | 63836 | 65157 | 42935 | 92902 | 86906 | 28294 | 30015 | 25041 | 77345 | 695004 |
| 2008 | 43562 | 40015 | 27123 | 25878 | 15942 | 37830 | 76928 | 84698 | 52128 | 104164 | 78399 | 31061 | 37945 | 32272 | 78399 | 765344 |
| 2009 | 40513 | 35830 | 26793 | 26664 | 12289 | 33889 | 62774 | 73917 | 56549 | 106700 | 107319 | 31757 | 39692 | 33421 | 77633 | 765740 |
| 2010 | 42691 | 34166 | 26069 | 27955 | 12998 | 36091 | 62832 | 75335 | 57788 | 107296 | 108896 | 33625 | 41392 | 32826 | 87318 | 787278 |
| 2011 | 40389 | 37803 | 31545 | 28506 | 13125 | 41143 | 69764 | 76113 | 58683 | 116593 | 118618 | 32048 | 42156 | 43782 | 93215 | 843483 |
| 2012 | 46985 | 34325 | 35442 | 35505 | 14286 | 44511 | 73375 | 82250 | 65451 | 127163 | 102800 | 32336 | 44103 | 38330 | 101825 | 878687 |
| 2013 | 83566 | 56203 | 24659 | 46891 | 17808 | 57976 | 104506 | 86226 | 69615 | 129907 | 115112 | 39329 | 46141 | 40065 | 88675 | 1006679 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකාවේ එළවළු වගා භූමි ප්‍රමාණය (හෙ.යාර)

| වර්ෂය | බෝංචි | කැරට් | ලීක්ස් | බීට්රූට් | නෝකෝල් | රාබු | ගෝවා | තක්කාලි | බණ්ඩක්කා | වම්බටු | වට්ටක්කා | පිපිඤ්ඤා | කරවිල | පතෝල | අළුකෙසෙල් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2000 | 6824 | 2313 | 1581 | 1817 | 1539 | 2742 | 3826 | 5787 | 7330 | 10466 | 6810 | 2501 | 3779 | 2727 | 13223 | 73265 |
| 2001 | 6353 | 2554 | 1665 | 1880 | 1619 | 2727 | 3936 | 5328 | 6707 | 9413 | 6427 | 2355 | 3429 | 2606 | 11863 | 68862 |
| 2002 | 6556 | 2543 | 1594 | 1803 | 1452 | 2468 | 3633 | 5413 | 6952 | 9905 | 6622 | 2643 | 3872 | 2859 | 11231 | 69546 |
| 2003 | 6291 | 2486 | 1537 | 1721 | 1395 | 2222 | 3718 | 5936 | 6857 | 10629 | 7228 | 3152 | 3960 | 2881 | 11259 | 71272 |
| 2004 | 7469 | 2881 | 1821 | 1865 | 1320 | 2346 | 3871 | 5989 | 5877 | 9344 | 6543 | 2650 | 3662 | 2454 | 10242 | 68334 |
| 2005 | 7715 | 3091 | 1762 | 2114 | 1476 | 2380 | 4099 | 6213 | 6744 | 9787 | 8199 | 3153 | 3772 | 2499 | 9854 | 72858 |
| 2006 | 7809 | 2965 | 1709 | 2313 | 1444 | 2510 | 4074 | 6633 | 6646 | 10169 | 7185 | 2847 | 3943 | 2648 | 9204 | 72099 |
| 2007 | 7718 | 3248 | 1908 | 2866 | 1464 | 2961 | 4386 | 6676 | 6574 | 10158 | 7944 | 2920 | 4072 | 2709 | 9005 | 74609 |
| 2008 | 8063 | 3025 | 1680 | 2370 | 1511 | 3547 | 4499 | 7734 | 7601 | 11442 | 7737 | 3253 | 4534 | 3405 | 9403 | 79804 |
| 2009 | 7910 | 2895 | 1680 | 2692 | 1435 | 3342 | 4015 | 7137 | 7230 | 10824 | 9197 | 3092 | 4170 | 3168 | 8449 | 77236 |
| 2010 | 7715 | 2793 | 1642 | 2724 | 1447 | 3237 | 3677 | 7261 | 7404 | 11011 | 8688 | 3303 | 4474 | 3145 | 9263 | 77784 |
| 2011 | 7796 | 3141 | 1960 | 2707 | 1424 | 3375 | 4082 | 7614 | 7418 | 11307 | 9423 | 3230 | 4523 | 3676 | 9716 | 81393 |
| 2012 | 7592 | 2852 | 2162 | 2639 | 1385 | 3355 | 4087 | 7916 | 7707 | 11760 | 9101 | 3073 | 4689 | 3570 | 9328 | 81216 |
| 2013 | 7913 | 2882 | 1292 | 2615 | 1689 | 3386 | 4186 | 7259 | 8369 | 12296 | 9371 | 3565 | 4928 | 3816 | 8746 | 82313 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ඇමුණුම 02: (වගු අංක 4.15)

අපනයනය සඳහා හා දේශීය වෙළඳපොළට එළවළු සැපයූ මිල ගණන්

| එළවළු වර්ගය | එළවළු මිල ගණන් (රු.) | | | | |
|---|---|---|---|---|---|
| | ගැනුම් මිල | අපනයනය සඳහා සැපයූ මිල | මිල වෙනස | දේශීය වෙළඳපොළට සැපයූ මිල | මිල වෙනස |
| කරවිල | 78 | 108 | 30 | 65 | -13 |
| මාළු මිරිස් | 115 | 150 | 35 | 85 | -30 |
| පිපිඤ්ඤා | 70 | 80 | 10 | 77 | 7 |
| පිපිඤ්ඤා | 80 | 90 | 10 | 75 | -5 |
| පිපිඤ්ඤා | 70 | 120 | 50 | 65 | -5 |
| බෝංචි | 130 | 190 | 60 | 70 | -60 |
| අළු කෙසෙල් | 50 | 88 | 38 | 33 | -17 |
| තක්කාලි | 160 | 170 | 10 | 170 | -10 |
| බෙල්පෙපර් | 160 | 185 | 15 | 180 | -20 |
| බෙල්පෙපර් | 250 | 500 | 250 | 450 | 200 |
| චයිනීස් ගෝවා | 100 | 120 | 20 | 90 | -10 |
| ගෝවා | 65 | 80 | 15 | 65 | 0 |
| පාස්ලි | 110 | 150 | 40 | 110 | 0 |
| පාස්ලි | 220 | 250 | 30 | 220 | 0 |
| පච්චෝයි | 80 | 100 | 20 | 80 | 0 |
| ලීක්ස් | 50 | 65 | 15 | 50 | 0 |
| බීට් | 95 | 120 | 25 | 37 | -58 |
| බීට් | 95 | 125 | 30 | 95 | 0 |
| කැරට් | 130 | 150 | 20 | 130 | 0 |
| සුකිනි | 250 | 300 | 50 | 300 | 50 |
| සුකිනි | 160 | 220 | 60 | 160 | 0 |
| දඹල | 100 | 130 | 30 | 70 | 30 |
| දඹල | 80 | 100 | 20 | 60 | -20 |
| පතෝල | 80 | 105 | 25 | 75 | -5 |
| පතෝල | 60 | 80 | 20 | 70 | -10 |
| පතෝල | 35 | 45 | 10 | 40 | -5 |
| කරවිල | 120 | 130 | 10 | 100 | -20 |
| කරවිල | 55 | 70 | 15 | 65 | 10 |
| මාළු මිරිස් | 70 | 85 | 15 | 80 | 10 |
| බණ්ඩක්කා | 25 | 35 | 10 | 30 | 5 |
| අමුමිරිස් | 380 | 410 | 30 | 400 | 20 |
| වම්බටු | 80 | 100 | 20 | 60 | -20 |
| එළබටු | 50 | 60 | 10 | 30 | -20 |
| රතුලූණු | 100 | 120 | 20 | 120 | 20 |
| අළු කෙසෙල් | 80 | 100 | 20 | 70 | -10 |
| තිබ්බටු | 180 | 200 | 20 | 160 | -20 |

මූලාශ්‍රය : හෙ.කො.ගො.පු. ආයතනයේ සමීක්ෂණ දත්ත, 2014

ඇමුණුම 03:

ප්‍රධාන එළවළු අපනයන සමාගම්

**AITKEN SPENCE EXPORTS (PVT) LTD**

No. 315, Vauxhall street, Colombo – 02
Telephone: 011-2308308 Fax: 011-2447249
*exports@aitkenspence.lk*

**AMALGAMATED INTERNATIONAL (PVT) LTD**

No. 125/22, Thanksala Gardens, Pannipitiya Road, Battaramulla
Telephone: 011-2865037, 5055764 Fax: 011-2889699
*lankaexport@gmail.com*

**AGROMEL**

No. 39/4, Flower Road, Colombo – 07
Telephone: 011-2667880, 2667881 Fax: 011-2694434
*niroshd@sltnet.lk*

**COUNTRY STYLE FOODS (PVT) LTD**

No. 210, St. Anthony's Road, Kadawatha
Telephone: 011-2925027, 2928556 Fax: 011-2926062
*smak@sltnet.lk*

**CONSOLIDATED BUSINESS SYSTEMS (PVT) LTD**

No. 184/2, Kaolin Factory Road, Werahera, Boralesgamuwa
Telephone: 011-5553920, General: 011-5553921-26 Fax: 011-2545431, 5553927
*cbsltd1@sltnet.lk*

**CBL NATURAL FOODS (PVT) LTD**

No. 156/2, Averiwatta Road, Heenatiyana, Minuwangoda
Telephone: 011-7388500/4 Fax: 011-7388505
*ceciloff@sltnet.lk*

**C.R. EXPORTS (PVT) LTD**

No. 131/16, Oruthota Road, Mudungoda
Telephone: 011-2224961 Fax: 033-2226863
*agro@sltnet.lk OR crgroup@sltnet.lk*

**DEVELOPMENT INTERPLAN (CEYLON) LTD**

No. 80, Reclamation Road, Colombo – 11
Telephone: 011-2332330, 2332773 Fax: 011-2332331
*diclpurchase@eureka.lk*

**DILARSHAD ENTERPRISE**

No. 49, Rosmead Place, Colombo – 07
Telephone: 011-2698440, 2670796 Fax: 011-2699828
*information@dilarshad.com*

**EASTERN & ALLIED AGENCIES (PVT) LTD**

No. 175, Kirula Road, Colombo – 05
Telephone: 011-2589282, 2510807, 2589276
Fax: 011-2510808
*gnana@easternallied.com OR*
*enquiries@easternallied.com*

**EXPOLANKA (PVT) LTD**

No. 30/1C, New Hunupitiya Road, Wattala
Telephone: 011-2981616 Fax: 011-2981690, 2981796
*annam@expolanka.com OR*
*imdadh@expolanka.com OR*
*expoltd@expolanka.com*

**EDIRISINGHE TRUST INVESTMENTS LTD**

No. 114, Ward Place, Colombo – 07
Telephone: 011-5232746 / 011-5323323
*agro@eti.lk*

**INTERNATIONAL FOODSTUFF COMPANY (PVT) LTD**

No. 27A, Pepiliyana Road, Nugegoda
Telephone: 011-2884017 or 011-430045,
Fax: 011-2884082 or 011-4548066

**JAGRO (PVT) LTDE**

No. 6/2, Wijerama Mawatha, Colombo – 07
Telephone: 011-2689163/4/5 Fax: 011-2689167
sales@jagrofresh.lk

**KELANI VALLEY CANNERIES LTD**

No. 436, Kaluaggala, Hanwella
Telephone: 036-2253309, 2254236, 2254265, 2255090 Fax: 036-2254235

**KELANI VALLEY PLANTATIONS LTD**

No. 400, Deans Road, Colombo – 10
Telephone: 011-2683964, 2686274 Fax: 011-2694216

**MACBERTAN LIMITED**

No. 371, Negombo Road, Wattala
Telephone: 011-4944312, 4621300 Fax: 011-4820701
sales@macbertan.lk

**METRO TRADING INTERNATIONAL (PVT) LTD**

No. 70, Wattegama Road, Madawela, Kandy
Telephone: 081-4921913 Fax: 081-2470620
*metroint@sltnet.lk*

**NATURE HARVEST MUSHROOM LANKA (PVT) LTD**

Dangas Pitiya Industrial Park, Kohilegedara, Kurunegala
Telephone: 037-5678384 Fax: 037-2238094
*cocogreen@sltnet.lk OR*
*mushroomnh@sltnet.lk*

**NIDRO SUPPLY (PVT) LTD**

No. 129, Reid Avenue, Colombo – 04
Telephone: 011-4407104, 2507452 FAX: 011-4407104
*dawn@nidro-lanka.lk OR dawn@nidro-lanka.com*

**PHOENIX INDUSTRIES LIMITED**

No. 25, Ragama Road, Welisara
Telephone: 011-4726333 Fax: 011-2958007
*info@phoenix.lk*

**RALLY PACKAGING (PVT) LTD**

No. 149/7, Colombo Road, Bandarawatte, Biyagama

Telephone: 011-4852201-02 Fax: 011-4619514
*rally@sltnet.lk*

**SELF STORAGE (PVT) LTD**

No. 399, Kerawalapitiya Road, Hendala, Wattala
Telephone: 071 4159922 Fax: 011-4819997

**SERENE INTERNATIONAL (PVT) LTD**

No. 54/1, Theresa Mawatha, Kandana
Telephone: 011-2582301 Fax: 011-2508476
*sereneinternational@gmail.com* *OR* *serene-i@sltnet.lk*

**SUNFROST LIMITED**

No. 25, Foster Lane, Colombo – 10
Telephone: 011-2628546/9 Fax:

**TESS AGRO LIMITED**

No. 87, New Nuge Road, Kelaniya
Telephone: 011-2910859 Fax: 011-2910615
*tess@slt.lk*

**TRANSGROW (PVT) LTD**

No. 448/6, Lake Road, D. P. Wijesinghe Mawatha, Thalangama South
Telephone: 011-4918703 Fax:

**FOOD EXPO (PVT) LTD**

No. 63A, Sri Wickrama Mawatha, Wattala
Mr. Khuzaima Teherali (Managing Director)
077 2290535
*khuzaima@ceyexpuk.com*

**GREENLINE ENTERPRISES**

No. 140/10D, Dutugemunu Street,
Kohuwela, Dehiwala
Telephone: 011-2810759, 060-2181056 Fax:
011-4203989

**GULF INTERNATIONAL MARITIME (PVT) LTD**

No. 208, R. A. De Mel Mawatha, Colombo – 03
Telephone: 011-2395751-1, 2381879 Fax:
011-4722882
*gim@slt.lk*

**HAYLEYS AGRO FARMS (PVT) LTD QUALITY SEED COMPANY LTD**

No. 25, Foster Lane, Colombo – 10
Telephone: 011-2688960-3 Fax: 011-2697202

**WATAWALA PLANTATIONS LIMITED**

No. 60, Dharmapala Mawatha, Colombo – 03
Telephone: 011-4702475 Fax: 011-4716365
*infiyazA@zesta.lk*

**WATERWAYS EXPORTS (PVT) LTD**

No. 7-1/1, Hunupitiya Cross Road, Colombo – 02
Telephone: 011-4716173/4 Fax: 011-4741999
*musa@wwslk.com*

**SRI LANKA EXPORT DEVELOPMENT BOARD**

No. 42, Nawam Mawatha, Colombo – 02
Telephone: 011-2300705 up to 11

එළවළු අපනයනය ආශ්‍රිත සැපයුම් දාම විශ්ලේෂණය

එස්. ඇපාසිංහ
රේණුකා වීරක්කොඩි
ශ්‍යාමිනී කුසුම් කුමාර

Tel. +94 11 2 6969 81
+94 11 2 6964 37
Fax. +94 11 2 6924 23
e-mail library@harti.lk
Web www.harti.gov.lk

ISBN:978-955-612-196-4

9789556121964

PRICE LKR 500

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

National Digitization Project

*National Science Foundation*

Institute : National Science Foundation

1. Place of Scanning : Sanje (Private) Ltd, Hokandara
2. Date Scanned : 02/06/2017
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : Angelo Melvin Luwis

Signature : A. M. [signature]

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Information Officer

Name : Renuka Sugathadasa

Signature : K.P. Sugathadasa

Date : 02/06/2017

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*